සංස්කෘත භාෂාවකරණය

සංසකෘත භාෂාවතරණය.

ප්‍රථම භාගය

බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය

සථවිරපාදයන් වහන්සේ

විසින්

සම්පාදිත යි.

එච්. කේ. ඩී. චන්ද්‍රසෙන මහතා

විසින්

චන්ද්‍රසෙන මුද්‍රණාලයයේ මුද්‍රණය කරණලදි.

1940

පිළිගැන්වීම යැ.

මෙහි මූල් පොත

යමකු සඳහා ලියැවිණි ද,

මදීය ප්‍රිය භ්‍රාතෘ වූත් සුවව ශිෂ්‍යවූත් ඒ

මෛත්‍රීමූර්ති ශ්‍රාමණේරයනට

මේ පොත

සාදර වැ මෙයින්

පිළිගැන්වේ.

මව,

පොත්හි කර්තෘ.

සංඥාපනය.

අප ප්‍රිය ඥාතෘ වූත් ශිෂ්‍ය වූත් මෛත්‍රීමූර්තීන් නව හැවිරිදි සම්‍යෙෂී (හිහි කලෑ) ඔවුනට පහසුයෙන් සකු බස ඉගැන්වීමට කුඩා පොතක් කෙළෙමු. එය උගත් සුළුපට කාලය තුළ කුඩා වැකියක් පද සම්බන්ධය නො බිඳෑ ලියන්නට තරම් හැකි බවෙක් ඔවුනට වී ඇ. මෙ පොතෙහි 108 වන පාඩම තෙක් කොටස ඒ මුල් පොතේ ම සුළුපට වැඩීමෙකි. එ පොත දුටු කිහිප දෙනෙක් අප හිතවත්තු එය මුද්‍රාපිත වුවොත් දුහුනනට මහත් වැඩෙකැ යි කිහු. එය මදක් වඩා මුද්‍රිත කරවන්නට ඉන් වූ අදහස පිටැ පොත සකස්කරන්නමෝ-මුලින් තෙ කඩෙකින් නිමවන්නට සිතා සිටි නුමුත් එක් පොතක් මැ කොටැ මේ ප්‍රථම භාගය ලියුවැ මතා ගැ සි සිතුණෙන් එසේ කළමිහ.

ශෝධ්‍යපත්‍ර බැලීමේ දී අපේ මැ පරික්ෂාගීනතායෙන් බොහෝ දෙස් හසු නො වී ඇ. ශුද්ධිපත්‍රය සකස් කැරුමෙහි දී බොහෝ දෙස් පෙනිණ. පද බෙදියැ යුතු තන්හි පද නො බෙදීම් විසින් ද, නණ ල ළ නිසි තැනට නො යෙදීම් විසින් ද නොයෙක් තැනැ වූ වරද හමු විය. එ සියල්ල ශුද්ධි පත්‍රයට නො ගැනිණ. නො වියත් බාල දරුවනට ලියුවක් බැවින් වැඩි වහර අනුවැ 'නුඹ යෙහි,' 'ගෙඩි වැටුණහ' ආදි සාමාන්‍ය ජනයා ගේ යෙදුමින් බොහෝ තැන වැකි යෙදීමු. එහෙත් පොතේ බොහෝ දුරක් මුද්‍රිත වූ පසු එනි ආදීනව අප සිතට තදින් වැටැහිණ. එබඳු තන්හි ඒ යෙදුම් පිරිසිදු සිංහල නො වන බව පොත උගන්වන ඇදුරහු සිසුනට කියා දෙත් වා. 'ඔබ යෙහි, ගෙඩි වැටුණේ ය' යන ආදිය මෑ ශිෂ්ටව්‍යවහාරයේ බව ද හෝරුම් කැරැ දෙත් වා. මෙ බඳු තවත් වරද ඇත. දෙවෙනි වර මුද්‍රණයෙහි දී ඒ සියල්ලත් සකස් කොවැ මිවත් වඩා පහසු ක්‍රම අනුවැ පාඩම් සොදන්නට සිතා සිටුමිහ.

තව ද පොත උගන්වන්නට පළමු මෙහි ශුද්ධිපත්‍රය අනුවැ අශුද්ධ තන් ශුද්ධ කොටැ සකස් කැරැ ගත යුතු බව කියමිහ.

ආචාර්යවරයනට විශේෂයෙනි.

මෙහි පාඩම් ඉගැන්වීමේ දී ඒ ඒ පාඩමේ වූ එක ද වියරණ විදියක් හෝ එක ද වචනයෙක තේරුම හෝ නො දැනැ සිටින්නහු ඊ ළඟ පාඩමට යැවීම නො කටයුතු යැ. ඒ සෑම පාඩම හොඳට උගත් පසු මැ ඊ ළඟ පාඩමට බැස්වියැ යුතු. මෙසේ 108වන පිට තෙක් උගන්වා යළිදු දෙතුන්වරක් මුල සිටැ එතෙක් ඉගැන්වියැ යුතු. එසින් පසු යැ 108 වන පිටෙන් එහා කොටස ඉගැන්වියැ යුතු. මෙහි පාඩම් 30ක් පමණ උගන්වා ඉන් පසු බාලාදර්ශය හෝ සංස්කෘත පාඨාවලිය හෝ එබඳු යම් කිසි පාඩම් පොතක් ශිෂ්‍යයා අතැ තැබියැ යුතු යැ. 108 වන පිටෙන් එහා කොටස ඉගැන්වියැ යුත්තේ සෙමෙනි.

ඒ ඒ පාඩමේ වචනවලැ තේරුම් උපග්‍රන්ථයේ ශබ්දාර්ථකෝෂ –යෙන් බලාගන්නට ශිෂ්‍යයනට කියා දියැ යුතු.

සියලු මැ පද අනාරුදී විසින් යොදූ සංස්කෘත සිංහල හා සිංහල සංස්කෘත කෝෂයක් අඟට යොදන්නට කලින් අදහස් කළ නුමුත් පොත මහත් වූ බැවින් එය මෙ වරට නැවැත්වීමු.

තව නො බෝ කලෙකින් සංස්කෘත ඉගැන්වීමට මිට ද වඩා ලෙහෙසි මහක් වූ (අන්‍ය ක්‍රමයෙක) සංස්කෘත ශික්ෂක නම් ග්‍රන්ථයක් ද පිටත් කරන්නට සිතා සිටුමිහ.

මිට–හිතකාමී

බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය ස්ථවිර.

1940 සැප්තැම්බර
15 වන දිනැ දී යැ.

පටුන.

			පිට
1.	පාඩම.	අකුරු	1
2.	,,	ලව් (පරස්මෛපද) එකවචන, අංග	2
3.	,,	අකාරාන්ත පුංලිංගික ශබ්ද, ප්‍රථමා, සම්බොධන විභක්ති, උකාර කතෘ, සන්ධි (ම්ෂං)	3
4.	,,	අකාරාන්ත පුංලිංගික, ශබ්ද, තෘතීයා චතුර්ථී පංචමී විභක්ති, ණත්වය.	5
5.	,,	අකාරාන්ත පුංලිංගික: ෂෂ්ඨී, සප්තමී විභක්ති, සන්ධි (ඃ + අ, එ, ඔ, ඃසවර)	6
6.	,,	දෙව ශබ්දය (ඒක වචනයෙහි), සන්ධි (ත් + සවර හෝ ඝෝෂ), උපසර්ග, සන්ධි (ම් + සවර)	8
7.	,,	අකාරාන්ත පුංලිංගික (බිවචන), ලව් (බිවචන) සන්ධි (ඔෟ + සවර)	10
8.	,,	අකාරාන්ත පුංලිංගික (බහුවචන), ලව් (බහුවචන), ගමනාර්ථයෙහි විභක්තියව, චතුර්ථී විභක්ති ඝෝෂය, සන්ධි (අඃ + සවර හෝ ඝෝෂ)	11
9.	,,	අකාරාන්ත නපුංසක ලිංගික, නකාරාන්ත අංග (ලව්), සන්ධි (සඃ + සවර)	13
10.	,,	නිපාත, (ප්‍රශ්නාර්ථයෙහි, 'නැත' යන අරුත්හි), තුම් ප්‍රත්‍යයාන්ත	17
11.	,,	අකාරාන්ත පුන්නපුංසක ශබ්ද, ඉකාරාන්ත පුංලිංගික (ප්‍ර. සම්. වි), පූජාක්‍රියා	17
12.	,,	ඉකාරාන්ත පුංලිංගික (කෘ, ච, ප)	19
13.	,,	ඉකාරාන්ත පුංලිංගික (ෂ, ස), උපසර්ග පූජක පූජාක්‍රියා	21
14.	කපි ශබ්දය,	උකාරාන්ත පුංලිංගික (ගුරු ශබ්දය), සන්ධි (නාමින් + ඃ, + සවර හෝ ඝෝෂ), ව ශබ්ද යෝගය, සන්ධි (ඃ + ච, ත), නමෝ සඞ්ඝාය යෝග	23
15.	,,	විශේෂණ විශෙෂ්‍ය, ඒකමීක ක්‍රියා, තනූ, කුරු, ශක්නු, (යන අංගවල ලව් රූප), ණත්වය	25
16.	,,	ලඞ් (පරස්මෛපද)	29

පාඩම.			පිට.
17.	,,	ඍකාරාන්ත පුංලිංගික	32
18.	,,	ඉකාරාන්ත නපුංසක ලිංගික	34
19.	,,	උකාරාන්ත නපුංසක ලිංගික	36
20.	,,	ආඛ්‍යාත (අකාරාන්ත අංග), ලඬ්, සන්ධි (සවර්ණදීර්ඝ, අසවර්ණදෙඝ, ඉ + සවර, ත් + හ)	37
21.	,,	ස්ත්‍රීලිංගික ආකාරාන්ත, සන්ධි (ත් + න්)	39
22.	,,	ඉකාරාන්ත ස්ත්‍රීලිංගික	41
23.	,,	ඒකාරාන්ත ස්ත්‍රීලිංගික, ලෝට් (පරස්මෛපද)	42
24.	,,	උකාරාන්ත ස්ත්‍රීලිංගික	46
25	,,	ඌකාරාන්ත ,,	48
26.	,,	ඍකාරාන්ත ,,	50
27.	,,	සර්වනාම (අස්මද්, යුෂ්මද්)	51
28.	,,	සර්වනාම (කිම්, තත්, එතත්, යත්, සර්, පූර්)	54
29.	,,	සර්වනාම (ඉදම්), විධි ලිඬ්	62
30.	,,	සර්වනාම (අදස්), යදි—තර්හි, සවෙ, වෙත්	65
31.	,,	සංඛ්‍යා ශබ්ද	69
32.	,,	සංඛ්‍යාපූරණ, නිර්ධාරණ	76
33.	,,	ආඛ්‍යාත (අස්ති), නිපාත (චිත්, අපි, නාම, කෙවලං, කිනතු, සම) සන්ධි (ත් + ශ)	82
34.	,,	ආඛ්‍යාත (ආත්මනේ පද), නකාරාන්ත අංග, උකාරාන්ත අංග, ලට් (ආත්මනේ පද)	85
35.	,,	වර්තමාන කාලනත, භවනත ක්‍රාම, සන්ධි (තවර්ගීය-නාදේශ, අඝෝෂ + ඝෝෂ)	86
36.	,,	ආඛ්‍යාත (ලඬ්, ආත්මනේ පදී, උභයපදීඅංග)	97
37.	,,	භවනත, (වත්මත් ප්‍රත්‍යයානත), සන්ධි (වර්ණ + න ඛෝ ම, න් + ශ, හ්‍රස්ව + න් + සවර)	101
38.	,,	ආඛ්‍යාත (ලෝට් ආත්මනේ පද)	105
39.	,,	භවනත (පුංලිංගික)	109
40.	,,	ආඛ්‍යාත, ණිචිලිඬ් (ආත්මනේපද), භවනත ස්ත්‍රීලිංගික, භවනත නපුංසක ලිංගික	114
41.	,,	ධාතු, කර්මවාචක ක්‍රියා	121

පාඩම.			පිට.
42.	,,	කෘදන්ත (කම්වාචක අතීත කෘදන්ත, කර්තෘවාචක අතීත කෘදන්ත, කෘත්‍රත්‍යයාන්ත, කෘතවත් ප්‍රත්‍යයාන්ත, කෘත්‍ය අනීයාන්ත, ඝ ප්‍රත්‍යයාන්ත, කම්වාචක වර්තමාන කෘදන්ත) භාව සප්තමී යෝගය	125
43.	,,	සමාස (කර්මාරය, තත්පුරුෂ, වන්ව, විගු)	138
44.	,,	සමාස (බහුව්‍රීහි, අව්‍යයීභාව)	141
45.	,,	මිශ්‍ර සමාස, සන්ධි (න් + ව හෝ ඡ, න් + ල), විශේෂණ තුන් වර්ගය, ඊයස් ප්‍රත්‍යයාන්තයන් ගේ වර්ධනැගීම, තරම් තමාම් ප්‍රත්‍යයාන්තයෝ	147
46.	,,	ධාතුගණ, ගුණ, වෘඩ්, සන්ධි (ඒ + සවර, ඕ + සවර), භ්වාදි ගණය, තුදාදි ගණය, දිවාදි ගණය, චුරාදි ගණය	154
47.	,,	ලව්, ලඩ්, ලෝව්, විධිලිඩ් ප්‍රත්‍යයයෝ, ධාතුගණ (ක්‍රයාදි ගණය, සවාදි ගණය, තනාදි ගණය, ක්‍රයාදීන් ගේ කර්මකාරක රූප), සපිත් අපිත්හු	160
		විශෙෂ ශබ්ද (නාම වරනැගිලි: ප්‍රඩී, සුධී, ශ්‍රොෂ්ටු, ජරා, ගෞ, ගෞලෑ), සන්ධි (ව් + ත, ජ් + ත ආදි පද මධ්‍යගත සන්ධි)	
48.	,,	ධාතුගණ (ජුහෝත්‍යාදි ගණය), ධාතුස්වර විකාරය	170
49.	,,	ධාතුගණ (රුධාදි ගණය,)	177
50.	,,	ධාතුගණ (අදාදි ගණය, අවණීනන්ත, උවණීනන්ත, හලන්ත ධාතු, විශෙෂ සවරාන්ත ධාතු)	184
51.	,,	ණිජන්ත (ප්‍රයොජ්‍ය ක්‍රියා	202
52.	,, (අ)	ඝඩන්ත, සන්නන්ත	205
52.	,, (ආ)	නාමධාතුක ක්‍රියා, අභූතතද්භාවය	208
53.	,,	ආඛ්‍යාත විභක්ති (ලිව්)	213
54.	,,	ආඛ්‍යාත විභක්ති (ලුව්, ලෘව්, ලෘඩ්), සෙව්, අස්ව්, වෙව් ධාතු	219
55.	,,	ලුඩ්	229
		පරිශිෂ්ටය (කාරකය)	249
		උපග්‍රන්ථය (ශබ්දාර්ථ කෝෂය)	i–lvi

ශුද්ධි පත්‍රය.

පිට.	පෙළ.	අශුද්ධ.	ශුද්ධ.
3.	11.	සුදෘ	සුදෘ
4.	33.	දෘශෘ	දෘසෘ
5.	12.	දෘශයා	දෘෂයා
6.	3.	කවඹී	ඔ, ව කාර හෝ කවඹී
7.	10.	බලිවදීං	බලීවදීං
7.	20.	මේ ළමයාව	ළමයාව
8.	29.	පරි චරති	පරිවරති
8.	34.	ප්‍රසාදත්	ප්‍රාසාදත්
9.	25.	දෙකක්	දෙක
10.	18.	සකුණෝ	ශකුනෝ
10.	20.	සුඛාවාහාරය	සුඛවාහාරාය
10.	22.	වෘක්ෂයෝ	වෘක්ෂාන්
10.	25.	රොහොගදුභ්‍යාං	රොහොඝදුභ්‍යාං
13.	28.	ශබ්ද මෙනී	ශබ්දවල මෙනි
15.	9.	මාංශ	මාංස
15.	12.	මාංශෙන	මාංසෙන
15.	12.	යුවාං	ආවාං
15.	13.	නවානි වසත්‍රානි	වසත්‍රාණි
15.	24.	මිළයට	මිලයට
15.	27.	,,	,,
15.	32.	ඔවුන්	ඔවුහු
16.	7.	ගවජසි	ගවජසි කිම?
16.	24.	කුම්භකාරා	කුම්භකාරාඃ
16.	26.	ප්‍රාරයාම්	පාරයාම්
16.	29.	ප්‍රාරයති	පාරයති
16.	31.	ලිඛිතුං	
16.	31.	පිළෙ	පිළෙ
16.	32.	දතුංඉවජථ	දතුම්වජථඃ
17.	29.	දෙව	දෙවෙ
18.	28.	උදකං	උදඛිං
19.	1.	බ්‍රහමණෝ	බ්‍රාහමණෝ
20.	8.	සොධාවසිභ්‍යාමරි.	යොධාවසිභ්‍යාමරි
20.	12.	කුමාරෙ,	කුමාරෙ

පිට.	පෙළ.	අශුඛ.	ශුඛ.
20.	12.	දෘෂ්ටවා	දෘෂ්ට්වා
20.	12.	මාජීරෝ මූෂිකං	මාජාරෝ මූෂිකං
21.	16.	දෘෂ්ට්‍ර	දෘෂ්ටු
21.	16.	කවීනා	කවීනාං
21.	19.	දෘෂ්ටවා	දෘෂ්ට්වා
21.	26.	පුසතකෙෂ	පුසතකෙ
21.	29.	සකුනා	ශකුනා
22.	10.	මිලව	මිලට
24.	11.	ජනතූන්	ජන්තූන්
24.	12.	ව්‍යිෂ්ණු	ව්‍යිෂ්ණුං
24.	13.	ප්‍රාරයනති	පාරයනති
24.	20.	දෘෂ්ටවා	දෘෂ්ට්වා
24.	21.	ශෘත්වා	ශ්‍රුත්වා
24.	22.	ආපතං	ආපණං
25.	3.	සිනාසෙත්	සිනා සෙත්
25.	7.	රශ	රස
26.	3, 4.	ප්‍රෂෙපන	ප්‍රෂෙපණ
27.	9.	කනු	ක්නු
28.	9.	ශුවාමරිං	ශුවාමරිං
28.	10.	විවෘණාති	විවෘණොති
28.	11.	ලොකසන්	ලොකස්‍ය
28.	12.	තත්වං	තත්ත්වං
28.	12.	පශ්‍ය	පශ්‍ය,
28.	19.	ශාරෙෘ	ශරෙෘ
28.	31.	තරිත්වා	තීර්ත්වා
28.	32.	ආවාවෙ	අවටෙ
28.	33.	සපිත්වා	සප්ත්වා
28.	33.	කෘශිබලස්‍ය	කෘෂිබලස්‍ය
29.	17.	කැමැතිසි	නො කැමැති සි
31.	20.	අශක්තෙනත්	අශක්තෙනත්
31.	28.	දෘෂ්ටවා	දෘෂ්ට්වා
32.	24.	රාවණගේ	රාවණයා ගේ
34.	2.	දශරථ ගේ	දශරථයා ගේ
34.	10.	දක්නේ ය	දැක්කේ ය
34.	15.	නපුංශක	නපුංසක
35.	16.	භක්‍ෂයිතුම්	භක්ෂිතුම්

පිට.	පෙළ.	අශුද්ධ.	ශුද්ධ.
35.	31.	විදූඛ.	මිදූඛ
36.	25.	ඤශ්‍රැ	ශ්මශ්‍රැ
37.	28.	ලුඞ්	ලඞ්
38.	29.	ග්‍රජ්ඣ	ග්‍රජ්ඣා
40.	19.	ජන්තූන්	ජන්තූන්
41.	11.	ඉකාරාන්තපුලල්ලිංගික.	ඉකාරාන්තසත්‍රිලිංගික
41.	26.	පිඤ්ජාණි	පිඤ්ජානි
42.	4.	විපනිං	විපණිං
45.	26.	මිළට	මිලයට
46.	31.	ඩෙඤ්ඣා	ඩෙඤ්ඣාඃ
46.	31.	කුණ්ඩඃ	කුණ්ඩං
48.	4.	ඝි	ඒ
48.	5.	වධූඃ	වධූඃ
48.	16.	භ්‍රෑවෝ	භ්‍රැවෝ
48.	20.	භ්‍රෑඃභඃ	භ්‍රැභ්‍යඃ
49.	3.	කවිව්‍රර	කවිර්ව්‍රර
49.	8.	වසතුමෙවඡත්	වසතුමෙවඡත්
49.	15.	වඩෙවාඃ	වඩාඃ
49.	15	පපාං	ප්‍රපාං
49.	24.	මණ්ඩොදරී	මන්‍දොදරී.
50	25.	සවසා	සවඤා සහ
50.	30.	සවශ්‍රැර්	ඤවශ්‍රැර්
51.	1.	නනඳුඃ	නනාඳුඃ
51.	4.	ඩෙනූඤචාරු	ඩෙනූඤෙචාරු
51.	14.	සාම්යා	සැම්යා
52.	22.	යාවකාඃයාන්න	යාවකාඃයාන්නං
52.	25.	රක්ෂිත්වා	රක්ෂිත්වා
53.	3.	භ්‍රතරඤ්ච	භ්‍රාතරඤ්ච
53.	11.	ැන	පැන
53.	14.	ලනුවකින්	ලනුවෙකින්
53.	16.	දෙදෙනටම	දෙදෙනාට ම
53.	26.	දෙවානම්ප්‍රිය	දෙවානාම්ප්‍රිය
58.	34.	තා වවදනාම්	තාවවදනාම්
59.	1.	වතීඃං	වානීඃං
59.	7.	ආතායතම්	අතායතම්
59.	26.	රජිනි	රැජිනී

පිට.	පෙළ.	අශුඛ.	ශුඛ.
59.	33.	අත	අණ
60.	25.	දණ්ඩාභ්‍යං	දණ්ඩාභ්‍යාං
60.	25.	ඝිගවඃ	ශිගවඃ
63.	24.	ක්‍රිණා	ජානා
64.	28.	ලවතං	ලවණං
67.	28.	හෙත්‍යා,	හෙත්‍යා'
68.	12.	ස්ථානාත්	සථානාත්
73.	22.	චත්වාරෝ'	චතුරෝ'
73.	25.	සත්‍රියෝ,	සත්‍රියෝ'
74.	2.	සත්‍රියශව	සත්‍රියශව
82.	23.	ජරාදශවෝ	ජරදශවෝ
83.	2.	භක්ෂයිතුම්	භක්ෂිතුම්
83.	18.	තාව	තාවද්
83.	26.	නිශ්චිත්‍ය	නිශ්චිත්‍ය
86.	13.	වන්දඅ + නෙත	වන්ද + අනෙත
90.	2.	දඅාතමනොපදි.	ද ආතමනෙපදි
90.	16.	අශන + අත්	අශනා + අත්
93.	22.	පුරඃඃ	පුරුෂඃ
95.	11.	කදැවිත්	කදුවිත්
95.	27.	ප්‍රාප්නුයාත්	ප්‍රාප්නොත්
95.	31.	වෘක්ෂාවක්ෂං	වෘක්ෂාවෘක්ෂං
96.	1.	තදෙවාඞ්කුශීන්.	තමෙවාඞ්කුශීන්
96.	3.	මානාඅ තෘත්‍යන්.	මානා අනෘත්‍යන්
96.	21.	ඉක්ඛිපි	ඉක්ඛිති
98.	8.	අක්‍රිණාත	අක්‍රිණත
107.	27.	වෑ යම්න්	වෑයම්න්
109.	33.	ඇක	ඇක්ක
110.	4.	සුවාවක්ෂුඃ	සුවාචඃ
111.	7.	දුහීෘත්	දුහීත්
112.	35.	ෙනත	වඩිනෙත
113.	12.	කිංවිදුයවඡත	කිංවිදයවඡත
116.	25.	වීරුත් (වී)	වීරුඩ් (බෙත් පැලැවි)
118.	18.	ගිරාං	ගිරඃ
119.	13.	භොජනානතරං.	භොජනාතතරං
120.	2.	වසි.	–වති
123.	5.	ප්‍රථමාෂෙන්	ප්‍රථමායෙන්

පිට.	පෙළ.	අශුඛ.	ශුඛ.
123.	13.	වාෂඃ	වෘෂඃ
125.	28.	ශෘතානි	ශ්‍රුතානි
128.	25.	ප්‍රලොභෂ	ප්‍රලොභති
129.	16.	ක්ෂානන	ක්ෂානත
129.	24.	ක්ෂිණෙති	ක්ෂිණොති
131.	11.	ගෘහ්	ග්‍රහ්
136.	30.	නිහීතස්‍යමානෙෘ'.	නිහීර්තස්‍යමානෙෘ'
136.	33.	කරණ	කරන
140.	19.	ඕඛූ	ඕඛූ
144.	36.	භරවජෘග්‍රාමෙ	භාරවජග්‍රාමෙ
145.	10.	රූපෙන	රූපෙණ
145.	15.	දීපදර්ශි තෙන.	දීපදර්ශිතෙන
145.	22.	තත්‍රජනා	තත්‍ර ජතා
148.	8.	විශෙෂණ	124 විශෙෂණ
151.	19.	ශත්‍රුක්ෂයා	ශත්‍රුක්ෂණයා
152.	5.	සුභද්‍ර නාම	සුභද්‍රා නාම
152.	8.	නාංබලිෂඃ	නාම්බලිෂඃ
152.	9.	අයඃ වාෂභ සත.	අයම්වෘෂභසත
152.	17.	පාඃලේ.	පාෂැලේ
152.	16.	ඉතා අග්‍ර	අග්‍ර
153.	21.	එලැඹියේ	එළැඹියේ
153.	28.	(=යොදන ලද	(=යොදන ලද)
159.	1.	උකතතංවඃ	උකතං ව
161.	17.	සැදුණෝ	සැදුණේ
164.	8.	ප්‍රාප්‍තාෘතෙව.	ප්‍රාප්‍යාතෙව
164.	17.	සවලාමප්‍යප කු...	සවලාමප්‍යපකු...
165.	8.	බවට බවට	බවට
165.	13.	මියා ව කරණ	මියා ම කරන
167.	34.	–ගවොඃ	ගවොඃ
170.	1.	ධාතුගණ	48 ධාතුගණ
173.	15.	බිභෘඃ	බිභෘ
175.	30.	භටා	භටාඃ
176.	2.	ශරිරෙෂු	ශරීරෙෂු
199.	9.	මිථ්‍යාං	මිථ්‍යා
199.	12.	ශූරා	ශූරා
199.	14.	සතාම්	සතාම්

පිට.	පෙළ.	අශුද්ධ.	ශුද්ධ.
201.	14.	සාවකසසතු	සාවකාශසතු
201.	21.	යඥපවීතං	යඥෝපවීතං
204.	3.	ශෙශවෙ	ශෛශවෙ
205.	19.	52 පාඩම	52 පාඩම (අ)
207.	14.	දිබොතු	දිය බොතු
207.	17.	බොතු රිස්සා	බොතු රිස්ස
207.	22.	මුමුර්ෂුහේසජ.	මුමුර්ෂුභේෂජ
207.	23.	දුධුක්ෂෂි	දුධුක්ෂසි
208.	21.	නාමධාතුක ක්‍රියා.	52 (ආ) නාමධාතුක ක්‍රියා
210.	36.	ප්‍රසාදරහිතෙෆ	ප්‍රසාදරහිතෙෆ
211.	11.	නිමීලිතාක්ෂිං	නිමීලිතාක්ෂීං
211.	28.	බොහෝ	සිලෝ වලින් බොහෝ
213.	1.	51	53
216.	17.	බලෙ,	බලෝ
224.	20.	කාරයෙන්	කාරයෙක්
227.	11.	91	54
227.	56.	ආඟම්නාය	ආගාම්නාය
227.	61.	තං	ස
227.	73.	මධුරාන්නානා	මධුරාන්නම
228.	6.	සමාග්‍රෙ	මමාග්‍රෙ
229.	6.	වරතනුරථවා.	වරතනුරථ වා'
229.	7.	සුරභිමවාපස්‍ය	සුරභිමවාප්ස්‍ය
238.	23.	සනාවා	සනාත්වා
238.	27.	හොෂ්ටී	හොෂ්ඨී
239.	9.	විවිඤාන්	විවිඤන්
239.	21.	යුධස්‍ය	යුඛස්‍ය
239.	23.	න්‍යඤාන්‍යත්‍යයයා සිඝුඃ	-න්‍යඤාන්‍යත්‍යයා සිඝුඃ
239.	27.	ඝං	'ඝං
239.	32.	නවිමාංසතු	නවිචාංසතු
240.	20.	සහිද්නිරග්නිං	සමිද්නිරග්නිං
240.	22.	ගුණෆගුණෆ	ගුණාගුණෆ
240.	28.	රාත්‍රෙ	රාත්‍රෆ
251.	17.	යොන්නක්	යොත්නක්
253.	4.	මංගල	මංඝලං
253.	26.	වියඝහි	වියෙහි
254.	21.	කතීව්‍යං මම,	කතීව්‍යං, මම

(ආ) **සංස්කෘතයට නගනු.** (සකි කළහැකි තැන් සකි කරණු.)

1. මම ආහාරයෙන් බළලා පෝෂිත කරමි. 2. ගොනා ආහාර පිණිස ඇවිදී. 3. දඟයා බල්ලාට දංඩෙන් ගසයි. 4. සිංහයා මුවා කයි. 5. හෙතෙම ධර්මය කියයි. 6. ආචාර්‍යයා ධර්මය උගන්වයි. 7. මම ගමින් නික්මෙමි. 8. බෙහෙදින් ලෙඩ සංසිඳේ. 9. සොරු කුකුළා සොරාගෙන යයි. 10. හෝ ගස නැගෙති. 11. ළමයා කන්ද නගී. 12 ගොවියා ගමේ වෙසෙයි 13. මෙහෙකරුවා රථය සෝදයි. 14. රජුගේ පුත්‍රයා රථයෙන් යයි. 15. මම අසු ගෙන යමි.

'මී' කාරයා පරව සවර්ණාදීර්ඝ හා සකාරලෝ පවිතාම් ගුණරූපය
7. = පවිතාම් ගුණරූපය

අකාරාන්ත පුල්ලිංගික නාම.

දෙව.

මී වචන.

ප්‍ර.	**දෙවෝ**	දෙවියන් දෙදෙනෙක්.
සම්.	(හෙ) **දෙවෝ**	(එම්බා) දෙදෙනෙක් දෙවියනි
ද්‍වි.	**දෙවෝ**	දෙවියන් දෙදෙනෙකුන්.
තෘ.	**දෙවාභ්‍යාම්**	දෙවියන් දෙදෙනෙකුන් විසින් කරණයකට
ච.	,,	දෙවියන් දෙදෙනෙකුන්ට.
ප.	,,	දෙවියන් දෙදෙනෙකුන් ගෙන්.
ෂ.	**දෙවයෝඃ**	දෙවියන් දෙදෙනෙකුන්ගේ.
ස.	,,	දෙවියන් දෙදෙනෙකුන් කෙරෙහි.

වෘක්ෂ.

මී වචන.

ප්‍ර.	**වෘක්ෂෝ**	ගස් දෙකක්.
සම්.	(හෙ) ,,	එම්බා ගස් දෙක.
ද්‍වි.	,,	ගස් දෙක.
තෘ.	**වෘක්ෂාභ්‍යාම්**	ගස් දෙකින්.
ච.	,,	ගස් දෙකට.
ප.	,,	ගස් දෙකින්.
ෂ.	**වෘක්ෂයෝඃ**	ගස් දෙකේ
ස.	,,	,,

ආඛ්‍යාත. ලට් (වර්තමාන.)

ම් වචන.

(තෙම.)	**භවතඃ.**	(ඔවුන් දෙදෙන) යෙහි.
(යුවාම්.)	**භවතඃ**	(ඔබ දෙදෙන) යෙවු.
(ආවාම්.)	**භවාව**	(අප දෙදෙන) යෙමු.

17. උත්තමපුරුෂ ම්වචන **වඃ** යන ප්‍රත්‍යයයට පූර්ව වූ අංගයේ **අ**කාරය දික් වේ. (භවම්වඃ) **භවාවඃ.**

18. **සන්ධි.** (අ) සවරයකට පූර්ව වූ **ඉ** යන්න **ආ**ව් බවට පෙරළේ. එහි **ව්** යන්න පර ව සිටින සවරය හා එක් වේ.

උදා. නරෙණ + ආගච්ඡතඃ=නරාව් + ආගච්ඡතඃ=නරාවාගච්ඡතඃ.

(ආ) කිසි විටෙක මෙබඳු තන්හි වූ ඒ **ව්** කාරය ලොප් ද වේ. (මැකී යයි.)

උදා: නරාව් + ආගච්ඡතඃ=නරා ආගච්ඡතඃ.

අභ්‍යාසය.

(අ) සිංහලයට නගනු.

1. මාගේ වෘෂණෙන තිෂ්ඨතඃ. 2. බාලෝ හස්තාභ්‍යාං කර්ණෞ සපෘශති. 3. ආවාං විද්‍යාලයං ප්‍රවිශාවඃ. 4. වෘක්ෂයෝඃ කොටරයෝඃ සකුණෞ වසතඃ 5. බාලෞ කාඳුකාභ්‍යාං ක්‍රීඩතඃ 6. යුවාං හස්තාභ්‍යාං ගණේශං නමථඃ. 7. උපාධ්‍යායෝ බාලෞ තාඩයති. 8. සුනඛාවාහාරය භ්‍රාම්‍යතඃ. 9. වානරෞ වෘක්ෂාභ්‍යාං පතතඃ. 10. කුමාරෝ හස්තාභ්‍යාං කාඳුකං තාඩයති 11. තෞ වෘක්ෂයෝඃ අවරොහතඃ. 12. තාපසෞ ආශ්‍රමයෝඃ වසතඃ. 13. ආවාං භාරං වහාවඃ. 14. සුනඛෞ විඩාලං පීඩයතඃ 15. මූර්ඛෞ ලිඛතඃ. 16. තෞ හස්තාභ්‍යාං ශරෞ ක්ෂිපතඃ. 17. සුනඛාවහං පොෂයාමි. 18 රාගෝ ගදුභ්‍යාං ශාම්‍යති. 19. යුවාං භ්‍රාම්‍යදුගච්ඡථඃ. 20. ආවාං යාචාභ්‍යාමාහාරං යච්ඡාවඃ. 21. පුරොහිතඃ ශ්ලොකාභ්‍යාං නෘපං ශංසති. 22. අග්‍රජෝ'නුජයොඃ සතිභ්‍යති.

(ආ) සංස්කෘතයට නගනු.

1. අපි (දෙදෙන) ගමෙහි වසමු. 2. තෙපි (දෙදෙන) ගස නගිනු. 3. සොරුන් දෙදෙන ජනේලය හරිති. 4. ළමයා අත් දෙක සෝදයි. 5. උපාධ්‍යාය තෙම ශිෂ්‍යයන් දෙදෙනා තෙරෙහි පහදියි. 6. හෙතෙම බළලුන් දෙදෙනා ගෙන් මියා මුදයි. 7. සොරු රජුගේ කඩු දෙක හොරෙන් ගනි. 8. අපි (දෙදෙන) පන්දුවෙන් ක්‍රීඩා කරමු. 9. මිනිස්සු (දෙදෙන) ගමේ ඇවිදිති. 10. පාපට කම් කරණ කොට මනුෂ්‍යයාගේ පහත වැටීම් වේ 11. පුරුෂ තෙම සොරුන් දෙදෙනාට දංඩෙන් තළයි. 12. පණිත යෙහි ඇතුන් දෙදෙනෙකුන් දකිමු. 13. රජුගේ පුත්‍රයෝ (දෙදෙන) නවුසන් දෙදෙනාට ආහාරය දෙති. 14. ළමයා කුරුල්ලන් දෙදෙනා කූඩුවේ තබයි. 15. ආශ්‍රම දෙකින් නවුසන් දෙදෙනා නික්මෙත්.

8

අකාරාන්ත පුල්ලිංගික ශබ්ද.

බහුවචන.

දෙව.

ප්‍ර.	**දෙවාඃ**	දෙවියෝ තුමූ.
සම.	(හෙ) **දෙවාඃ**	එම්බා දෙවියනි.
ද්‍ව.	**දෙවාන්**	දෙවියන්.
තෘ.	**දෙවෛඃ**	දෙවියන් කරණ කොට ගෙන, දෙවියන් විසින්
චතු.	**දෙවෙභ්‍යඃ**	දෙවියනට, දෙවියන් පිණිස.
පං.	,,	දෙවියන් හොරෙන් දෙවියන් ගෙන්
ෂ.	**දෙවානාම්**	දෙවියන් ගේ (දෙවියන් සතු.)
ස.	**දෙවෙෂු**	දෙවියන් කෙරෙහි.

වෘක්ෂ.

වෘක්ෂාඃ	ගස්.
(හෙ) ,,	එම්බා ගස්
වෘක්ෂාන්	ගස්.
වෘක්ෂෛඃ	ගස් කරණ කොට, ගස්වලින්.
වෘක්ෂෙභ්‍යඃ	ගස් පිණිස, ගස්වලට.
,,	ගස් හෙරෙන්, ගස්වලින්.
වෘක්ෂාණාම්	ගස්වල, ගස්වලට අයත්.
වෘක්ෂෙෂු	ගස්හි, ගස්වල.

ආඛ්‍යාත ක්‍රියා.

ලට් (වර්තමාන.)

බහුවචන.

ප්‍රථම පුරුෂ.	(හෙ)	**ගච්ඡන්ති**	(ඔව්හු) යෙත්.
මධ්‍යම ,,	(යුයම්)	**ගච්ඡථ**	(තෙපි) යෙවු.
උත්තම ,,	(වයම්)	**ගච්ඡාමඃ**	(අපි) යෙමු.

19. **මඃ** (මස්) යන ආඛ්‍යාත ප්‍රත්‍යයයට මුලින් සිටි අංගයේ අග අකාරය ඇදිණ. එවිට ගච්ඡ + මඃ=ගච්ඡාමඃ.

20. යම් තැනකට යේ නම් එ තැන **චතුර්ථී** විභක්තිය වැ සිටී. සඃ **ග්‍රාමං** ගච්ඡති (හේ ගමට යේ.) සඃ වෘක්ෂෙ ආරොහති (හේ ගස නගී.)

21. යමකුට දේ නම්, යමකුට කිපේ නම්, යමකුට සතුටු වේ නම්, ඒ දීම, කිපීම, සතුටුවීම් ලබන්නා වනුම් විභක්තිය වැ සිටී.

උදා: සඃ **යාචකාය** ආහාරං යච්ඡති (හේ යාචකයාට ආහාරදෙයි)
සඃ **යාචකාය** කුප්‍යති (හේ යාචකයාට කිපේ.)
සඃ **පුත්‍රාය** තුෂ්‍යති (හේ පුත්‍රයාට සතුටු වේ.)

22. යමකු ගෙන් භය වේ නම් හේ පංචමී විභක්තිය වැ සිටී සඃ **ගජාත්** ත්‍රස්‍යති (හේ ඇතුගෙන් තැති ගනී.)

23. **සන්ධි.** ස්වරයක් හෝ ඝෝෂාක්ෂරයක් පර කල්හි අඃ යන්නේ විසර්ගය (ඃ) ලොප් වේ.

නරඃ අත්ර=නරා අත්ර.
නරඃ ඉච්ඡන්ති=නරා ඉච්ඡන්ති.
නරඃ ගච්ඡන්ති=නරා ගච්ඡන්ති.

අභ්‍යාසය.

(අ) **සිංහලයට නගනු.**

1. භටා අශ්වානාරොහන්ති. 2. සඃ හස්තෙන දණ්ඩං ධාරයති. 3. සර්පෝ මාර්ගේ තිෂ්ඨති. 4. චොරා අශ්වාන් නයන්ති. 5. සූදඃ චොදනං (සූදෙඃ + ඔදනං) පචති. 6. වානරා වෘක්ෂෙෂු භාෂන්තෙ. 7. සඃ පාදෙඃ ක්ෂාලයති. 8. ස්වයං ශ්ලොකාන්

ලිඛථ. 9. වයං ආචාර්‍යස්‍ය ග්‍රාමං ගච්ඡාමඃ. 10. හංසාඃ කූජන්ති. 11. මනුෂ්‍යාඃ යානෙෂු නිෂීදන්ති. 12. මාතේෂු රථාඃ වලන්ති. 13 තාපසා ආශ්‍රමේෂු වසන්ති. 14. සුනඛා ආහාරාය භ්‍රාම්‍යන්ති. 15. සජ්ජනා ධර්‍මං පඨන්ති 16 සූයං වෘක්ෂමාරොහථ. 17. නෘපඃ සචිවෙභ්‍යඃ කුප්‍යන්ති. 18. මෘගො ව්‍යාඝ්‍රාත් ත්‍රස්‍යති. 19. බාලඛෙෆ වෘඛෙභ්‍යඃ ත්‍රස්‍යතඃ 20. සජ්ජනානං පුත්‍රා ධර්‍මමනු තිෂ්ඨන්ති.

(ආ) **සංස්කෘතයට නගනු.**

1. ගසෙහි කුරුල්ලෝ වෙසෙත්. 2. ආචාර්‍යවරුන්ට ශිෂ්‍යයන් දෙදෙනාට කිපෙයි. 3. ශිෂ්‍යයෝ පැදුරුවල හිඳිත්. 4. ඔහුහු පඨිතය නසිත්. 5. මිනිසුන් දෙදෙන ළමයාට කිපෙත්. 6. අපි තවුසන්ගේ ආශ්‍රමයන්හි වෙසෙමු. 7. මිනිස්සු ගම්වලින් නික්මෙති. 8 වඳුරෝ ගසින් වැටෙති. 9. මිනිස්සු දඬුවලින් සොරුන් තළත්. 10. රජුගේ පුත්‍රයන් දෙදෙන ප්‍රාසාදයෙන් බසිත්. 11. මාඝයෙහි සොරු සිටිත්. 12. තෙපි සොරුන්ට කිපෙවු. 13. අපි ශ්‍රමණයන් වඳිමු. 14. ළමයි මෙහි සිටිත්. 15. පුත්‍රය, ගස වැටෙයි.

9.

අකාරාන්ත නපුංසක ලිංගික ශබ්ද.

වන (වනය, කැලෑව)

	එක.	බ.	බහු.
ප්‍ර.	**වනම්** (වනය)	**වනෙ** (වන දෙකෙක්)	**වනානි** (වනයෝ.)
සම්.	(හෙ) **වන** (එම්බා වනය!)	(හෙ) **වනෙ** (එම්බා දෙදෙනෙක් වනයෙනි.)	(හෙ)**වනානි**(එම්බා වනයෙනි!)
ද්‍වි.	**වනම්** (වනය.)	**වනෙ** (වන දෙකක්	**වනානි** (වනයන්)

සෙසු හැම විභක්ති අකාරාන්ත පුල්ලිංගික ශබ්ද මෙනි. දෙව ශබ්දය මෙන් වර නගනු.

ආඛ්‍යාත ක්‍රියා.

ලට් (වර්තමාන.)

ඤාකාරාගම අංග.

ප්‍ර	(සෘ) ජානාති	(තෙම) ජානීතඃ.	(තෙ) ජානන්ති
	(හෙ) දනි.	(ඔවුන් දෙදෙන) දනිත්.	ඔවුහු දනිත්.
ම.	ත්වං ජානාසි	(යුවාං) ජානීථඃ	(යූයං) ජානීථ
	(තෝ,නුඹ)දනිහි	(නොපදෙදෙන) දනිවු	(නෙවි දනිවු.)
උ.	(අහං) ජානාමි	(ආවාං) ජානීවඃ.	(වයං) ජානීමඃ
	(මම්) දනිමි.	(අපිදෙදෙන) දනිමු.	(අපි) දනිමු.

24. **ජානාති.** මේහි අංගය ජ්ඤා යනු යි මෙය ඤාකාරාගම ය යි. එහෙත් මීට වෙනස් ඤාකාරාගම වූ අන්‍ය ක්‍රියාංග කෙතෙකුත් ඇති බැවින් මේ ඤා ඤාකාරාගමයන් හැටියට සැලකිය යුතුයි.

මේහි තුන් පුරුෂයෙහි ම එක වචනයෙහි ජ්ඤා යි ද ප්‍රථම පුරුෂ බහුවචනයෙහි **ජාන** යි ද අංගය සිටියි. සෙසු හැම තැන්හි **එය ජානි** ය යි වෙනස් වූ බව සිතට ගත යුතුයි. **ඤාකාරාගම** හැම අංගයන් ගැන ම මේසේ යි.

25. (අ) **සෘ** (හෙතෙම) යන පදය ව්‍යංජනයන්ට පූර්ව තන්හි **ස** යි සිටී. සෘ ඡවඡති=ස ඡවඡති.

(ආ) සෙසු තන්හි 13 වන සංලක්ෂ්‍යයෙහි කී ක්‍රමය අනුව සන්ධි වේ. සෘ + අත්‍ර=සෝ + අත්‍ර=සෝ'ත්‍ර

26. අඝන්න හැර අන් ස්වරයක් පර කල්හි පූර්ව වූ ඃ යන්නේ විසර්ගය ලොප් වේ.

පුරුෂඃ ආගච්ඡති=පුරුෂ ආගච්ඡති.
නරඃ ඉච්ඡති=නර ඉච්ඡති.

27. සහ, **සාර්ධම්**, **සාකම්** යන නිපාත තෘතීයා විභක්තික පද සමග යෙදේ. සහ, හා, **සමග** යනු ඒ පද තුනෙහි තේරුම යි. **පුත්‍රේණ සහ, පුත්‍රේණ සාර්ධම්, පුත්‍රේණ සාකම්=පුත්‍රයා හා, පුත්‍රයා සමග.**

අභ්‍යාසය.

(අ) සිංහලයට නගනු.

1. අහමාසනෙ උපවිශාමි. 2. හෙ පුත්‍රාඃ, යූයමාසනෙභ්‍ය උත්තිෂ්ඨථ. 3. කුමාරාවන්‍යාඅශ්නිතාඃ (කුමාරෙණ + අන්‍යාභිඃ + අශ්නිතාඃ) 4. ව්‍යාඝ්‍රො මෘගමනුධාවති. 5. බුධා මොක්ෂ මිවඡ්නති. 6 වොරෙණ බලිවදීං මුෂ්ණිතාඃ. 7. දෙවා අසුරෛඃ සහ සාගරං මථ්නන්ති. 8. ආවාං ධාන්‍යං ක්‍රිණීවඃ. 9. සත්‍යස්‍ය දශීනෙන ජනාඃ චිරතං ජීවන්ති. 10. සඃ කෙනපාඝං හෘඝ්නත ඛධ්නාති. 11. සඃ කාව්‍යං ඉථ්නාති. 12. සිංහා මාංශ මශ්නන්ති. 13. වෘෂහොඃශනාති නෘණම්. 14. භූපො ජනානත්‍රහෘත්ණාති 15. රාජපුරුෂඃ චොරස්‍ය ශීර්ෂං ඛඩ්ගේන ලුනාති. 16. අහං මාංශෙන සාරමෙයෙණ ප්‍රාණාමි. 17. යුවාං ගෘණීවඃ. 18. භූපස්‍ය වචනෙන කුමාරෙණ වරෙ වෘණීතඃ. 19. පුරුෂො නවානි වස්ත්‍රානි ගෘහ්ණාති. 20. වයං ධර්මං ජානීමඃ 21, ව්‍යාඝ්‍රො මෘගං නඛෛඃ දෘණාති. 22. යූයං උපලෙන ධාන්‍යඃ මෘද්නීථ. 23. මාරුතො වෘක්ෂාන් ධුනාති. 26. රොගඃ ශරීරං ක්ලිශ්නාති. 27. ශිෂ්‍යෙණ උපාධ්‍යායං ප්‍රීණීතඃ.

(ආ) සංස්කෘතයට නගනු.

1. වෙනෙහි තවුසෝ ගෙඩි කත්. 2 හෙතෙම උත්සාහ යෙන් දරුවා පෝෂිත කෙරෙයි. 3. පුත්‍රයා වරයක් (තෝරා ගනී) ඉල්ලයි. 4. සොරා ගුප්තයාගේ බඩි සොරකම් කරයි. 5. කුමාරයන් දෙදෙන රජහු සතුටු කරත්. 6. මිනිස්සු වන යෙහි ගස් කපත්. 7. ගොපලු තෙම වස්සා ගෙසෙහි බඳියි. 8. මම දැන් පොත් දෙකක් මිළයට ගණිමි. 9. ඔවිනු කිරි කලඹත්. 10 රාම. නෙම රාවණයාගේ හිස් කපා දමයි. 11 සුළඟ තෙම වනයෙහි ගස්වල මුදුන් සොලවයි. 12. අපි අද කිසිවක් නො කම්හ. 13. අපි ගමෙහිදී ධාන්‍ය මිළයට ගණුම්හ. 14. සජ්ජනයෝ අධර්මය නිගනිත් (අධර්මයට නිග්‍රහ කරත්.) 15. අපි (දෙදෙන) හැම කල්හි මිත්‍රයන් සතුටු කරමු. (පිණවමු.) 16 ඉඳු තෙම වෘත්‍රයා මැඩියි. 17. දශයාගේ පුතුන් දෙදෙන ගුප්තයාගේ පොත් සොරා ගනිත්. 18. අපි මිත්‍රයන් දෙදෙනා සමඟ බොජුන් අනුභව කරමු. 19. පණ්ඩිතයෝ ශාස්ත්‍රය දනිත්. 20. ඔවුන් මුවකු පෝෂිත කරත්. 21. යෝධයෝ රණභූම ථ්ගස්වලින් වසාලත්. 22. සිංහයා නියවලින් ඇතාගේ හිස පළයි. 21 කඩ ඉඟුන් කළ දෙකක් මිළයට ගණිමු. 24. මේහෙකරු තෙම මිදුල පැදුරුවලින් වසයි. 25. හෙතෙම ගොය ධාන්‍යයෙන් පුරවයි.

10.

නිපාත.

28 ප්‍රශ්නයක් ඇසීමේදී අපි, කිං යන නිපාත මූලට යොදනු කිං යන්න ක්‍රියාවට අගිනුත් යෙදිය හැක

අපි ත්වා ගච්ඡසි ? තෝ (තුඹ) යෙහි ද ?
කිං ත්වං ගච්ඡසි ? ,,
ත්වං ගච්ඡසි ? ,,

29. "නැහැ" යන්න ඇහවීමට න යන නිපාතය ක්‍රියාවට මූලින් තබනු. **සः න ගච්ඡති.** හේ **නො** යයි.

(ක) තුම් ප්‍රත්‍යයාන්ත ශබ්ද.

පාතුම්-බොන්නට.
නතීතුම්-නවන්නට.
කර්තුම්-කරන්නට.
නෙතුම්-පමුණුවන්නට, ගෙනයන්නට.
ධාරයිතුම්-දරන්නට, උපුලන්නට.
බාලකඃ පාඨං පඨිතුම් ඉච්ඡති-ළමයා පාඩම කියන්නට කැමතියි.

අභ්‍යාසය.

(අ) සිංහලයට නගනු.

1. අහං ජලං පාතුම්ඉච්ඡාමි. 2. නිදාඝේ කාසාරෙණු ජලං ඝෘත්‍යති. 3. කමලං භ්‍රමරාන් ප්‍රීණාති. 4. ව්‍යාඝ්‍රා මෘගාන ක්‍රුධ්‍යන්ති. 5. වයමාචාර්‍යෙභ්‍ය උපදෙශමධිගච්ඡාමඃ. 6. වාඝසඃ කොකිලාන් ප්‍රඝණන්ති. 7. කිං ත්වං කලහස්‍ය කාරණං ජානාසි ? 8. සුසීදුඝණං භවති. 9. වයමාකාශෙ නක්ෂත්‍රාණි පශ්‍යාමඃ 10. මයූරා නර්තුං ජානන්ති. 11. කුම්භකාරා පාත්‍රාණි කර්තුං ප්‍රභවන්ති. 12. අපි ත්වං කුමාරං සමුද්‍රස්‍ය තීරං නෙතුම්ඉච්ඡසි? 13. අහං පාඨං චිත්තෙන ධාරයිතුං න ප්‍රාරයාම් 14. කිං යූයං පඤ්චරෙණු ශුඝාන් ද්‍රෂ්ටුම්ඉච්ඡථ? 15. ස වාණිජ්‍යං කර්තුං ගෘහාදබිර්ගච්ඡති. 16. ආවාමිත්‍ර වසතුම්ඉච්ඡාවඃ. 17. පුරුෂොඋෂ්ණමාරොඩුං න ප්‍රාරයති. 18. විශ්වාමිත්‍රා දශරථං ද්‍රෂ්ටුං ගච්ඡති. 19. ස ක්ෂෙත්‍රා රක්ෂිතුං තත්‍ර ගච්ඡති. 20. ඉදානීං ලෙඛනං ලිඛිතුං තත්‍ර එයේ උපවිශාමි. 21. වයං ගෘහමුපවෙෂ්ටුම්ඉච්ඡාඃ. 22. යූවාං යාවකෙභ්‍ය අන්නා දතුං ඉච්ඡථ. කිම් ? 24. අපි යූයං දෘෂ්ඨෙභෙ නෙතුම්ඉච්ඡථ ?

(අ) සංස්කෘතයට හරහන්න. (සන්ධිකළ හැකි තැන් සන්ධිකරණු)

1. හෙ තෙම් ගෙඞ් කන්නට නො කැමැතී සි. 2. දෘශයෝ (දෙදෙනා) බත් පිසන්නට ගෙට යෙති. 3. ළමයි බෝල කර කවන්නට කැමැති වෙත්. 4. පුරුෂයා බර උසුලන්නට හැකි වෙයි. 5 බාල සොහොයුරා එහි යන්නට කැමැති ද? 6. නැට්ටුවෝ නටන්නට හැකි වෙත්. 7. ඔව්හු (දෙදෙන) ගෙහි දොර කඩැ සිටින්නට කැමති වෙත්. 8. රජ තෙම තවුසා දක්නට ඇමැතියන් හා අසපුවට යෙයි. 9. පුත්‍රය, තෝ පාඩම් කියන්නට නො කැමැත්තෙහි ද? 10. ළමයි දුවන්නට කැමැත්තාහ. 11. අපි ශිෂ්ලම් කරන්නට විද්‍යාලයයේ මිදුලට යෙමු. 12. සොරා පෙට්ටිය අරින්නට තැත් කරයි. 13. මම වර දෙකක් තෝරා ගත්තිමි. 14. ආචාර්යෝ ශිෂ්‍යයනට අනුග්‍රහ කෙරෙත්. 15. ගොපල්ලෝ (දෙදෙනා) ගවයා ගසෙහි බඳින්.

11.

අකාරාන්ත පුනපුංසක ශබ්ද.

මේ තාක් උගත් අකාරාන්ත ශබ්දයන්ගේ සම්පූර්ණ වර නැගිල්ල නැවැත සලකනු.

පුල්ලිංගික අකාරාන්ත.

දෙව ශබ්දය.

	එක.	ද්වි.	බහු
ප්‍ර	දෙවඃ	දෙවෞ	දෙවාඃ.
සම්.	(හෙ) දෙව	(හෙ) ,,	(හෙ) ,,
ද්වි.	දෙවම්	දෙවෞ	දෙවාන්
තෘ.	දෙවෙන	දෙවාභ්‍යාම්	දෙවෛඃ
චතු.	දෙවාය	,,	දෙවෙභ්‍යඃ
පඤ්.	දෙවාත්	,,	,,
ෂෂ්.	දෙවස්‍ය	දෙවයෝඃ	දෙවානාම්
සප්.	දෙව	,,	දෙවෙෂු

නපුංසක ලිංගික අකාරාන්ත වන ශබ්දය 9 වන පාඩමේ දී ඇත. එය මේ හා සංසන්දනය කොට සමාන අසමාන තැන් සලකා බලනු.

දැන් ඉකාරන්ත පුල්ලිංගික ශබ්ද දෙනු ලැබේ.

කපි. (වඳුරා)

	එක.	බ.	බහු.
ප්‍ර.	**කපිඃ** (වඳුරා)	**කපී** (වඳුරෝ දෙදෙනෙක්)	**කපයඃ** (වඳුරෝ)
ඝ.	**කපෙ** (වඳුරා)	**කපී** (දෙදෙනෙක් වඳුරනි)	**කපයඃ** (වඳුරනි.)
ච.	**කපිම්** (වඳුරා)	**කපී** (දෙදෙනකුන් වඳුරන්)	**කපීන්** (වඳුරන්)

පූර්ව ක්‍රියා.

ගත්වා (ගොස්)
හෘත්වා (හැර ගෙන ගොස්)
දත්වා (දී)
ධාවිත්වා (දිව ගොස්)
ජීත්වා (දිනා)

මේ පූර්ව ක්‍රියා යෙදෙන සැටි: **ස තඩාගං ගත්වා** මුඛං **ක්ෂාලයති.** (හේ වැවට **ගොස්** මුහුණ **හෝදයි.**)

අභ්‍යාසය.

(අ) **සිංහලට නඟනු.**

1. කුමාරෙ යාවකාය හොජනං දත්වා ගෘහං විශති. 2. ගජෙන ධාවිත්වා වනං විශතඃ. 3. අපි යූයං නගරං ගත්වා ධාන්‍යං ක්‍රීණීථ ? 4. ජනෝ'ධර්මං ධර්මෙණ ජීත්වා සුඛමධි ගච්ඡති. 5. කිංකරෙණ තඩාගං ගත්වා මුඛං ක්ෂාලයිත්වා ආගච්ඡතඃ. 6. සත්‍යං දෘෂ්ටවා ජනාඃ චිත්තං පුනන්ති. 7. ගෘහාලඃ කුතඃචුවං හෘත්වා දණ්ඩෙනඃ දණති 8. නර්තක ආභරණෛඃ ශරීරං භූෂයිත්වා නෘත්‍යාය ගච්ඡති. 9. වයං පඤ්ජරෙ ශුකං සඃථාපයිත්වා පූජයිෂ්‍යාමඃ. 10. තෙ ක්ෂෙත්‍රාණි රක්ෂිත්වා තත්‍ර උටජෙෂු වසන්ති. 11. ධර්මස්‍ය තත්ත්වං වයං න ජානීවඃ. 12. මූෂකාවන්නාමශ්නීතඃ. 13. අහං ගිරිමාරොඪුං න ප්‍රභවාමි. 14. කුමාරෙණ කපී දණ්ඩාභ්‍යං තාඩයතඃ. 15. බාලකා වෘක්ෂෙ කපීන් දර්ශයන්ති 16. කිං ත්වං සනාන්නාය උදකං ගන්තුමිච්ඡසි? 17. සාරථිඃ කිං රථං තත්‍රානයති? 18. පුරුෂෙ භූපඝ්‍ය නිධිං රක්ෂති. 19. වනාවනං ගච්ඡති

මුනිඃ. 20. බ්‍රහ්මණෝ' තිපි පූජයති. 21. අග්නිඃ ග්‍රාමං දහති. 22. ඉදානීං රවිඃ උදගච්ඡති. 23. ව්‍යාධිඃ කුමාරං පීඩයති. 24. නෘපතයෝ ධර්මේණ රාෂ්ට්‍රාණි පාලයන්ති. 25. කපිඃ තත්‍ර වෘක්ෂේ තිෂ්ඨති.

(ආ) සංස්කෘතයට නගනු.

1. හේ මැණිකා සොරා ගෙන ගොස් ගෙහි සඟවයි. 2. මෙහෙකරුවා කඩුවෙන් සොරාට ගසයි. 3. අපි (දෙදෙන) යෑමිහු වඳිමු. 4. ව්‍යාධිහු ශරීරය පෙළත්. 5. වඳුරා ළමයාගේ අතෙන් ගෙඩිය ගනී. 6. ආචාර්‍ය තෙම ශිෂ්‍යයනට තැඟි දෙයි. 7. මිනිස්සු විහාරයට ගොස් මුනිහු වැද එති. 8. රජ යුධයේදී සතුරන් දිනයි. 9. අපි ගසින් බස්නට හැක්කමු. 10. හේ ක්‍රෝධය දිනා (පරදවා) සැප ලබයි. 11. කවියා මිතුරා ගේ වචනය අසා සිනාසි පුටුවේ ඉඳ ගනී. 12. අපි (දෙදෙන) ගිරවුන් දෙදෙනකුන් (අල්ලා) ගෙන කුඩු දෙකෙන තබා පෝෂිත කරමු. 13. උදේ කුකුළන් ගේ හඬ අසා ඇදන්වලින් නැගිටිමු. 14. ළමයා මුහුණ සෝදා කිරි බී පොත කියයි 15. ග්‍රීෂ්ම කාලයෙහි ශරීරයෙන් ඔහදිය පිට වෙයි.

(ඉ) සන්ධිකරණ. නරඃ අත්‍ර, ජනඃ ආයාති, පුත්‍රඃ ඉඛ, අශ්වඃ උත්පතති, ධනම් ඉච්ඡාමි, ඵලම් පතති.

(ඊ) ක්‍රීණාති, ප්‍රාරයති යන ක්‍රියාවල තුන් පුරුෂයෙහි ම වර්තමාන (ලට්) රූප දෙනු.

12.

ඉකාරාන්ත පුල්ලිංගික ශබ්ද.

කපි

	එ.	බ.	ෂ.
තෘ.	කපිනා (වඳුරා විසින්, වඳුරා කරණකොට)	කපිභ්‍යාම් (වඳුරන් දෙදෙනකුන් විසින්, කරණකොට)	කපිභිඃ (වඳුරන් විසින්, කරණ කොට)

ච.	භ්‍රාතරයෙ (වදුරාට, වදුරා පිණිස)	භ්‍රාතෘභ්‍යාම් (වදුරන් දෙදෙනාට, වදුරන් දෙදෙන පිණිස)	භ්‍රාතෘභ්‍යඃ(වදුරන්ට, වදුරන් පිණිස)
ප.	භ්‍රාතුඃ වදුරා ගෙන්)	,, (වදුරන් දෙදෙනාගෙන්)	,, (වදුරන්ගෙන්)

අභ්‍යාසය.

(අ) සිංහලයට නගනු.

1 ගිරෙඃ ගජෙන පතතඃ. 2. යොධාවසීභ්‍යාමරි තාඩයතඃ 3. යොධස්‍ය ඉෂ්‍වුධෙඃ බාණෙන පතතඃ. 4 නෘපතිඃ සෙනාපතිභ්‍යාං කුප්‍යති. 5. අහං පාණිභ්‍යාං ගිරිං යාචාමි. 6. කිං යූයං කපිභ්‍යඃ ඵලානි යච්ඡථ? 7. ආවාං අතිථයෙ ආහාරං දත්වා ආගච්ඡාවඃ 8. කුමාරෙ, මාගෙ අභිං දෘෂ්ටවාන්‍යස්‍යති. 9 අහම්දෘනිං සනාථාමුදධිං ගච්ඡාමි. 10 සෙනාපතිභ්‍යාං තුෂ්‍යති භූපතිඃ 11. කපිඃ අහෙඃ ත්‍රස්‍යති. 12. මාර්ජරෙ මූෂිකං මුඛෙන ගෘහිත්වා ධාවති. 13. ගෘහාලඃ කුඨාරං ගෘහ්‍ය හස්තයති. 14. කිං ත්වං සපිතෘ ත්‍රස්‍යසි? 15. මුනිඃ වර්ෂාසමයෙ ග්‍රාමෙ උෂිත්වා තතඃ පරං වනං ගච්ඡති.

(ආ) සංස්කෘතයට නගනු.

1. ඒ ධනය සොරු ගෙන වනයේ සඟවයි. 2. කුමර තෙම කඩුවෙන් සොරු ගසයි. 3. තෙපි දෙදෙන ඍෂිනට බොජුන් දෙවු. 4. රිවිහු ගෙන් රශ්මිය විහිදෙයි. 5. මුනිහු කරණකොට ගෙන සැපයට පැමිණෙමු. 6. සෙනෙවියෝ සතුරන් පරදවන්නට සැකි වෙත්. 7. ඔහෙතෙම මිත්‍රයා සතුරා ගෙන් මුදා ගනී. 8. අපි කන්දෙන් බසිමු. 9. පුත්‍රිනි, ඍෂිහු වැවට ගොස් නා මෙහි එති. 10. මුනිහු නගරයට ඇතුල් ව පිඩු පිණිස හැසිරෙති. 11. ඍෂිහු දැක මම් ආසනයෙන් නැගිටිමි. 12. මුනි තෙම ශ්‍රාවකයන් හා ගම්න් ගමට යෙයි. 13. කිවිහු කාව්‍ය ගොතත්. 14. වදුරෝ ගස නැග ගෙඩි කත්. 15. සිංහයා නියවලින් ඇතා ගේ හිස පළා මොල කයි

13.

ඉකාරාගම පුල්ලිංග.

කපි

	එ.	බ.	බ.
ෂ.	කපේඃ (වඳුරාගේ)	කපේ‍යාඃ (වඳුරන් දෙදෙනා ගේ)	කපීනාම් (වඳුරන්ගේ)
ස.	කපෞ (වඳුරා කෙරෙහි)	,, (වඳුරන් දෙදෙනා කෙරෙහි)	කපිභ්‍යු (වඳුරන් කෙරෙහි)

'ශ' ප්‍රත්‍යයාගම පුළු ක්‍රියා.

30. උපසර්ග මූලට සිටින කල පුළු ක්‍රියා පද ශ ප්‍රත්‍යය එක් වැ සෑදෙයි.

ප්‍රණම්‍ය (වැඳ) මෙහි ප්‍ර යනු උපසර්ග යි.

අභ්‍යාසය.

(අ) සිංහලයට නගනු.

1. මූෂිකෝ බිලාත් නිර්ගච්ඡති. 2. යොධෝ'රෞ ශරං ක්ෂිපති. 3. ආවාං මුනේඃ ආශ්‍රමඃ ද්‍රක්ෂ්‍යාවඃ. 4. කවිනා සහනිධෞ වසතුම්වඃ. 5. අපි ත්වං පශ්‍යසි සේනාපතේඃ අසෞ රථාම්? 6. තෞ ගෘහං ත්‍යක්ත්වා මුනේඃ ආශ්‍රමං ගච්ඡතඃ 7. වෘක්ෂේ කපෝතාන් දෘෂ්ටවා තේ උපලාන් ප්‍රක්ෂිපන්ති. 8. ව්‍යාඝ්‍රෞ කෘෂිබලස්‍ය වෘෂභෞ ගෘහ්ණීතඃ. 9. කවී අතිථිභ්‍යඃ මාහාරං දත්වා ගෘහං ප්‍රවිශතඃ. 10. චෞරා ගත්වා ගෘහපතේඃ ගෘහාද්ධනං මුෂ්ණීතඃ. 11. නෘපතේඃ පුත්‍රා වරාන් වෘණතේ. 12. තේ භූපතිං සේවිතුං න ජානතේ. 13. ආවාං මහාකාව්‍යේ ග්‍රථ්නීවඃ. 14 රාජපුරුෂාඃ චෞරාන් වධස්ථානං නීත්වා ශීර්ෂාන් ලූනන්ති. 15. අහං මාර්ජාරං දුග්ධේන පූරයාමි. 16. ගිරේඃ ශිඛරාභ්‍යාං වෘක්ෂෞ පතතඃ. 17. කුමාරඃ පුත්‍රකෞ හස්තෙන උඛෘත්‍ය දර්ශයති. 18 රාමඃ රාජ්‍යං විහාය වනං ගච්ඡති 19. ප්‍රභාතේ උත්ථාය වස්ත්‍රං පරිධාය මුඛං ප්‍රක්ෂාල්‍ය භෝජනං කෘත්වා පුස්තකං පඨාමි. 20. සකුනා වෘක්ෂේෂු නීඩානි නිර්මාය නිවසන්ති 21. සිංහෝ මෘගං ව්‍යාපාද්‍ය භක්ෂයති. 22 චෞරෝ වෘක්ෂාදවරුහ්‍ය වනං ධාවති.

(ආ) සංස්කෘතයට නඟන්න.

1. උදේ නැගිට මුන සෝදා බුදුන් වැඳ ආහාර වළඳා පුටුවේ ඉඳ පොත කියමි. 2. රාමතෙම යුධයෙහි රාවණයා දිනයි; 3. ළමයි මිදුලේ පන්දුවලින් ක්‍රීඩා කොට වෙහෙස හැර නැවත ක්‍රීඩා කරත්. 4. මිත්‍රය, ආචාර්යයාට ශිෂ්‍යයෝ සතුටු වෙත් ද? 5. ඔහු දෙදෙන සොරාගේ දැත් හසෙහි බඳිත් 6. කිවිහු (දෙදෙන) කාව්‍ය දෙකක් ගොතත්. 7. බෝසත්හු ලොවට අනුග්‍රහ කරත්. 8. සෙනාපතිහු (දෙදෙන) භටයන් හා රණබිම වැද සතුරන් මරත්. 9. ගොපල්ලෝ (දෙදෙන) නගරයට ගොස් භාජන දෙකක් මිළට ගනිත් 10. ගෝඝාතකයා ගවයා වධස්ථානයට පමුණුවා හිස සිඳියි. 11. පිණ සිත පිරිසිදු කරයි. 12. මෙහෙකරුවෝ (දෙදෙන) මොහොල් දෙකින් ධාන්‍ය මඬිත්. 13. අපි ධාන්‍ය අඹරමිහ. 14. හිම කාලය තෙම වැවේ ජලය මුදයි. (දූඹ කෙරෙයි). 16. ව්‍යාඝ්‍රයන් දෙදෙනා ගෙන් ගොනුන් දෙන්නා මුදා ගනුම්හ 16 සිවල්ලු ගම්න් කුකුළන් හැර ගෙන ගොස් මරා සති. 17. අසුරයෝ දෙවියන් පෙළති. 18. හෙතෙම යාචකයාගේ භාජනය සොරා ගෙන දියේ ලයි. 19. තෝ රථය ගෙනෙන්නට එහි යෙහි ද? 20 රජ තෙම ආශ්‍රමයට ගොස් තවුසා දැන වැඳ ඉන්පසු නුවරට එන්නට රථයට නැගී.

14.

මේ තාක් ඉගෙන ගත් ඉකාරාන්ත පුල්ලිංගිකයන් ගේ වර නැගීම.

කපි.

	ඒ.	බ්.	බ.
ප්‍ර.	කපිඃ	කපී	කපයඃ
සං.	කපෙ	,,	,,
ද්‍ව.	කපිම්	,,	කපීන්
තෘ.	කපිනා	කපිභ්‍යාම්	කපිභිඃ
ච.	කපයෙ	,,	කපිභ්‍යඃ
ප.	කපෙඃ	,,	,,
ෂ.	,,	කපේ‍යාඃ	කපීනාම්
ස.	කපෙෳ	,,	කපිෂු

උකාරාන්ත පුල්ලිංගික ශබ්ද.

ගුරු (ගුරුවරයා)

	එ.	චි	බ.
ප්‍ර.	ගුරුඃ	ගුරූ	ගුරවඃ
සම්.	ගුරෝ	,,	,,
ච්.	ගුරුම්	,,	ගුරූන්
තෘ.	ගුරුණා	ගුරුභ්‍යාම්	ගුරුභිඃ
චතු.	ගුරවෙ	,,	ගුරුභ්‍යඃ
පං.	ගුරෝඃ	,,	,,
ෂ.	,,	ගුරෝඃ	ගුරූණාම්
ස	ගුරෞ	,,	ගුරුෂු

31. **සන්ධි.** සවරයකට හෝ සෝෂ්මයකට මුලින් සිටි ඉඃ, ඊඃ, උඃ, ඌඃ, ඍඃ, ඎඃ, ඤඃ, එඃ, ඓඃ, ඔඃ, ඖඃ, යන මොවුන් ගේ විසර්ගය ට ර් වේ.

උදා: කවිඃ ගච්ඡති=කවිර්ගච්ඡති.

කවිඃ ආගච්ඡති=කවිර් ආගච්ඡති=කවිරාගච්ඡති.
ගුරුඃ වදති= ගුරුර්වදති.
ගුරෝඃ වචනම්= ගුරෝර්වචනම්.

22. **සන්ධි.** ච යන්නට පූර්ව වූ විසර්ගය ශ් වේ. උදා රාමඃ ච=රාමශ්ච= රාමශ්ච.

33. තයන්නට පූර්ව වූ විසර්ගය ස් වේ. උදා. රාමඃ තරති= රාමස්තරති= රාමස්තරති.

34. රාමඃ ච ලක්ෂ්මණඃ ච (රාමශ්ච ලක්ෂ්මණශ්ච) ගච්ඡතඃ (රාම ද ලක්ෂ්මණ ද යෙත්). මෙහි යාම් ක්‍රියාව කරන්නෝ දෙදෙනෙකි. ඒ දෙදෙනා ම අභව්‍ය පද ප්‍රථමා විභක්තියෙන් සිටී. එ බැවින් එහි ක්‍රියාව ගච්ඡතඃ යි බහු වචනයෙන් සිටින බව සැලකිය යුතු යි.

රාමශ්ච ලක්ෂ්මණශ්ච භරතශ්ච ගච්ඡන්ති (රාම ද ලක්ෂ්මණ ද භරත ද යෙත්.) මෙහි යන්නෝ දෙදෙනෙකුන්ට වැඩි වෙත්. එබැවින් ක්‍රියාව ගච්ඡන්ති යි බහු වචනයෙන් සිටින බව සිතට ගත යුතු යි.

මේ තන්හි ච යන නිපාතය මූල පදයනට නො යොදූ අග පදය හා පමණක් යෙදුවත් වරද නො වේ. **රාමඃ ලක්ෂ්මණඃ භරතශ්ච ශත්රුඝ්නශ්ච.**

35. **නමෝ, සවස්ති** යන නිපාත චතුර්ථී විභක්තිය හා යෙදේ. **නමෝබුද්ධාය** (බුදුරජුට නමස්කාර වේවා.) **සවස්ති භූපතයෙ.** (රජුට සෙත් වේ වා.)

අභ්‍යාසය.

(අ) සිංහලයට නඟනු.

1. මූෂිකෝ බිලාත් නිර්ගත්‍ය ක්‍රීඩතඃ. 2. ස පුත්‍රකා මාදෘශ ගෘහාවභිර්ගීර්ඡති. 3. ගුරුර්ව්‍යාකරණමධ්‍යාපයති 4. මෘත්‍යුර් නතූන් හරති 5. හෙ විප්‍ර, කිං ත්වං ක්‍රතුං කර්තුමිච්ඡසි? 6. මුනිර්විෂ්ණු ධ්‍යායති. 7. සාධූ විහාරා ගත්වා බුද්ධං ධ්‍යායතඃ. 8. තෝ'හනිතා වරූං පක්ථුං න ප්‍රාරයන්ත. 9. අහං තිතඋනා සක්තුං පුනාමි. 10. තෙෆ සක්ථුං ඉක්ෂෝඃ රසෙන සාර්ධං භක්ෂිතුං ඉච්ඡතඃ. 11. අජෙෆ සෙතෙෆ නිෂ්යතඃ. 12. ඉදානීං ච්‍යුරුද්‍යතෙ තරුණාඃ ශිඛරාන් ධුනාති. 13. භික්ෂූ ධර්මස්‍ය ප්‍රචාරාය ග්‍රාමාද්ග්‍රාමමටතඃ 14. ව්‍යාධිර්ජිනතූ තාම්‍යති. 15. කිං න ත්වං ශිශවෙ'ත්‍තනං දාතූ මිච්ඡසි? 16. අපි යූයං මෘත්‍යොර්න ත්‍රස්‍යථ? 17. පුරුෂෙෆ සෙතොඃසර්ෂපඃ 18. ආචාර්‍යං සදා ගුරූ සම්මාවයඃ. 19. ශිෂ්‍යා ගුරුං දෘෂ්ටවා පාදයොඃ පතිත්වා ක්‍රන්දති. 20. නමෝ ගුරවෙ. 21. ශාක්‍යමුනෙර්චනං ශ්‍රුත්වා ජනාශ්චිත්තං පුනන්ති. 22. කිං ශිෂ්‍යා නගරෙ ආපනං ගත්වා පුස්තකානි න ක්‍රීණන්ති? 23. ම්‍රගීං කර්තුං තෙ වනෙ තරූන් ලූතන්ති. 24. ගුරුශ්ච ශිෂ්‍යශ්ච රථෙන නගරෙ විචරතඃ. 25. තතෝ ආනන්දශ්ච තඩාගං ත්වා ජලෙන ඝටෙෆ පූර්ණීතඃ. 26. උපවනෙ තරුෂු විහගා නීඩාන් කෘත්වා වසන්ති. 27. සවස්ති භූපාය. 28. අග්‍රජෝ'නුජශ්ච මිත්‍රෙඃ සාකං මාගේ ගච්ඡතඃ.

(ආ) සංස්කෘතයට නඟනු.

1. ඔහු දෙදෙන සොරා ගේ දැත් ගසෙහි බඳිත්. 2. කවිහු දෙදෙන කාව්‍ය දෙකක් ගොතත්. 3. අපි සතුරන් මඩිම්හ. 4. වදුරෝ හැම කල්හි උහනට අවුත් එහි ඵල ද මුල් ද කත්. 5. යෝධයෝ සතුරන් කෙරෙහි රිංගත්. 6. අපි ගුරුන් ගේ

සමීපයේ වසන්නට කැමැත්තම්හ. 7. රෝගයෝ සත්ත්වයන් පෙළත්. 8. මම් නූල් වලින් පොත් බඳිමි. 9. ළ දරුවෝ සද දූක සිනාසෙත්. 10. අපි සතුරන් දිනන්නට හැකියම්හ. 11. සතුරන් හා යුඩ කරන්නට ඔහුට නිග්‍රය වහු ද? 12. තවුසනට ආහාර ද පාන ද නවාතන් ද දෙම්හ. 13. භටයෝ යුඩයේදී ආයුධවලින් සතුරන් ගසත්. 14. ගුරුවරයා ශිෂ්‍යයනට උක්පැණි (උක්ගසේ රස) දෙයි. 15. ප්‍රභූහු (දෙදෙනා) අපට ධනය දෙති. 16. අරක්කැමියා බත් පිස නාන්නට වැවට යෙයි. 17. රාමද ලක්ෂ්මණද සතුරන් කෙරෙහි රිගස් යවත්. (ඒසි කරත්). 18 ළමයා ගේ අතෙහි (බාහුයෙහි) ගිරවා සිටී. 19. ඔව්හු සතුරන් පරදවන්නට නො හැකි වෙත්. 20. මුනිහු මරහු ගේ භය නො සලකත්. 21. ළමයින් දෙදෙනාට උක් ගස් දෙකක් දෙමු. 22. ගෘහපතියා උක්දංඩෙන් මෙහෙකරුවා තළයි.

15.

විශේෂණ විශේෂ්‍ය.

40. **සුදු මල.** කෙබඳු පැහැති මලෙක් ද? සුදු මලෙකි. මෙහි එ මල රතු හෝ නිල් හෝ අන් පැහැ නො ව සුදු පැහැ ඇත්තෙකැ යි වෙසෙසා (=වෙන් නොට) දක්වන්නෙ කවර පදයෙක් ද? සුදු යන පදය යි. එය විශේෂණ නම්. එයින් වෙසෙසෙනුයේ (=වෙන් කොට දක්වනු ලබනුයේ) මල ය. එ විශේෂ්‍ය නාම්. මේ විශේෂණ විශෙෂ්‍ය පද දෙ වනිය ලිංගයෙන් විභක්තියෙන් වචනයෙන් සමාන කොට තබනු.

ශෙවනම් පුෂ්පම්.	සුදුමල.
ශෙවනෙන පුෂ්පෙන	සුදු මලින්
ශෙවනෙපු පුෂ්පෙපු.	සුදු මල්හි.
ප්‍රබලඃ අරිඃ	බලවත් සතුරා.
ප්‍රබලෙන අරිණා	බලවත් සතුරා විසින්.

මෙහි **ශෙවනම්** යනු ද **පුෂ්පම්** යනු ද නපුංසක ලිංගික ප්‍රථමා විභක්තික ඒක වචන යි.

ප්‍රලෑ: යනු ද **අමී:** යනු ද පුලල්ලිංගික ප්‍රථමා විභක්තික ඒක වචන යි.

'යෙවන්ං ප්‍රක්ෂේපන' යැයි කිවොත් හරි ද? වැරැදි යි. එය **ශ්‍රෙතෙන ප්‍රක්ෂේපන** යැ යි විය යුතු යි.

41. **විකර්ෂික ක්‍රියා.** සමහර ක්‍රියා කම් දෙකක් ගනී. ඒ ඒ **විකර්ෂික ක්‍රියා** නම්. **ස ශිෂ්‍යං ශාස්ත්‍රං අධ්‍යාපයති.** (හේ ශිෂ්‍යයාට ශාස්ත්‍රය උගන්වයි.) මෙහි **ශිෂ්‍යං, ශාස්ත්‍රං** යන දෙක ම කම් යි.

ස වෘෂං ග්‍රාමං නයති. (හේ ගොනා ගමට දක්කාගෙන යයි.) මෙහි **ග්‍රාමං** යනු ද, **වෘෂං** යනු ද කම් යි. මෙ දෙතන්හි ම **අධ්‍යාපයති, නයති** යන ක්‍රියා දෙක කම් දෙකක් ගත් බැවින් **විකර්මක ක්‍රියා** නම් වෙති.

ආඛ්‍යාත.

උකාරාන්ත අංග ඇති ක්‍රියා.

වර්තමාන (ලට්)

තනු (උකාරාන්ත අංග)

එක.	ද්වි.	බහු
ප්‍ර. **සෘ තනෝති**	**තෞ තනුත:**	**තෙ තන්වන්ති**
(හේ පතුරුවයි)	(ඔහු දෙදෙන පතුරුවත්)	(ඔහු පතුරුවත්)
ම. **ත්වං තනෝෂි**	**යුවාං තනුථ:**	**යූයං තනුථ.**
(තෝ පතුරුවහි)	(තෙපි දෙදෙන පතුරවහු)	(තෙපි පතුරුවහු)
උ. **අහං තනෝමි**	**ආවාං තනුව: තන්ව:**	**වයං තනුම:, තන්ම:**
(මම පතුරුවමි)	(අපි දෙදෙන පතුරුවමු)	(අපි පතුරුවමු)

42. මෙහි අංගය **තනු** යැ යි උකාරාන්ත යි එහෙත් ඒක වචනයෙහි ඒ අන්ත උකාරය ඔ කාරය ව සිටින සැටි සිතට ගත යුතු. **එසේ ම වෘ, මෘ** ප්‍රත්‍යයන්ට මුලින් එහි අග උයන්න ලොප් ව (මැකී) **තන්:** තන්මඃ කියාත් සැදෙන බව සිතට ගත යුතු. එසේ ම ප්‍රථම පුරුෂ බහු වචනයෙහි උයන්නට ව් ආදේශ ව පරසවරය හා එක්වැ සිටින බව ද සැලකිය යුතු. **තනු + අන්ති= තන්ව් + අන්ති=තන්ව්අන්ති=තන්වන්ති.**

43. කෘ (කුරු) යන අංගය මීට මදක් වෙනස් වැ වර නැගේ. මෙසේ යි:

	එ.	බ.	බ.
ප්‍ර.	කරෝති	කුරුතඃ	කුර්වන්ති
ම.	කරෝෂි	කුරුථඃ	කුරුථ.
උ.	කරෝමි	කුර්වඃ	කුර්මඃ

'සඃ කරෝති' (හේ කරයි) ආදින් වාක්‍ය සාදා ගත යුතු.

44. ශක්නු. මෙහි අංගයේ අග කොටස බැදුණු ව්‍යංජන දෙකකින් යුක්ත යි. ක්නු. මෙහි කයන්න හා නු යන්න බැදී තිබේ. මෙබඳු අංගයන්ගේ අග සවරයට (=උයන්නට) අන්ති ප්‍රත්‍යයය පර කල්හි ව් යන්න එක් වේ. එවිට ශක්නුවන්ති. වඃ මඃ ප්‍රත්‍යයයන් පර කල අංගය නො වෙනස් ව සිටී.

අංගය ශක්නු.

	එ.	බ.	බ.
ප්‍ර.	ශක්නොති	ශක්නුතඃ	ශක්නුවන්ති
ම.	ශක්නොෂි	ශක්නුථඃ	ශක්නුථ
උ.	ශක්නොමි	ශක්නුවඃ	ශක්නුමඃ

'සඃ ශක්නොති' (හේ හැකිවේ) ආදින් යොදා අර්ථ ගත යුතු.

45. ෂත්වය. අ, ආ, හැර අන් සවරයෙකින් පර වැ සිටින (ප්‍රත්‍යයෙහිවූ) ස කාරය ෂ කාර බවට පැමිණේ.

නනොෂි මෙහි සි (ස්+ඉ) යන්න වූයේ ඔ කෙරෙන් පර ව යි. එබැවින් එහි ස් යන්න ෂ් වැ නනොෂ්ඨි කියා වේ.

අභ්‍යාසය.

(අ) සිංහලයට නගනු.

1. කපිර්ඍෂිමාරොක්ෂ්‍යං ශක්නොති. 2 කිං යුෂ්මං ධර්මං න ජානීථ. 3. නෘපතෙඃ පුත්‍රා විහාරං ගත්වා මුනෙර්වචනං ශෘණ්වන්ති. 4. අහං න ශක්නොමි භාරං වොඪුම්. 5. රාමඃ ලක්ෂ්මණශ්ච තරූන් ධුනුතඃ ඵලානි ච චිනුතඃ. 6. කිං ස දුර්ජ්ජව

නෛර්ගුරොශ්චිත්තං දුනොති? 7. මොරං ප්‍රහර්තුං යුවාං ධෘෂ්ණුථඃ 8. තෙ ඉදානීං පාපං චින්තයන්ති, මරණාත් පරං නිරයං ප්‍රාප්නුවන්ති. 9. සවයෝ භූපතෙර්ගුණං ප්‍රතන්වන්ති. 10. අහං ප්‍රත්‍යූෂ දූතං ප්‍රතිෂෙණොමි 11. සජ්ජනෝ ගුරූණාං ගුණාන් විවෘණොති, දොෂාන් ආවෘණොති. 12. මාලාකාරස්‍ය පුත්‍රෙණ ප්‍රත්‍යහං ප්‍රභාතෙ උත්ථාය උද්‍යනං ගත්වා පුෂ්පාණි අවචිනුතඃ. 13. සාධවෝ ජීවිතස්‍ය විනාශෙ'පි පාපං න කුර්වන්ති. 14. වයං බුධස්‍ය ගුණාන් සම්‍යථා වර්ණයිතුං නශක්නුමඃ. 15 කිං යුවාමරිං ජෙතුං න ශක්නුථඃ. 16. කිං යූයං ගුරොර්වචනං ශෘණුථ. 17. ස සංකල්පං න විවාණාති 18. කිංකරඃ ගෘහස්‍ය කවාටාන් සංවෘණොති. 19. බුධො භික්ෂුභ්‍යෝ ලොකසත් තත්වං විවෘණොති. 20. කදර්‍යඃ ධනං සංචින්වන්ති. 21. පශ්‍ය විඛ්‍යාලඃ ප්‍රවිශකං ධුනොති. 22. නෘපතෙර්යොධාඃ ශත්‍රුභිඃ සහ යොද්ධුං ධෘෂ්ණුවන්ති. 23. බාලකා උද්‍යානං ගත්වා ඵලානි චින්වන්ති. 24. ජහා භූපං රාජ්‍යාය වෘණ්වන්ති. 25. දෙවා අසුරෙඃ සහ සාගරං මථ්නන්ති. 26. මූතෙදීශිතෙන ජනාශ්චිත්තං පුනන්ති. 25. ධනස්‍ය පරිපාලනං ක්ලිශ්නාති පුරුෂම්. 28. රාමඃ ශාරෙඃ රාවණස්‍ය ශිරාංසි ලූනාති.

(අ) සිංහලෂට නගනු.

1. වෘකඃ පුරුෂසතුඛාදාවෂ්ෂාත් පතති. 2. ක්‍රූරො බාලඃ කෘශං සුතඛං දීඝීණ දණ්ඩෙන තාඩයති. 3. සථ්ලඃ ශෘගාලසතරුණං කුක්කුටං ගෘහීත්වා දූරං වනං ධාවති. 4. දූරෙ වනෙ ආශ්‍රමෙෂු බහවස්තාපසා වසන්ති. 5. පුරුෂො මලිනා ගස්තං ෂුඩෙන ජලෙන ක්ෂාලයති. 6. නෘපතෙඃ පුත්‍රඃ ශොභනෙන රථෙන විශාලෙ නගරෙ චරිත්වා ප්‍රාසාදං ප්‍රත්‍යාගච්ඡති. 7. සෛනිකස්‍ය පුත්‍රො වෘධාය භික්ෂවෙ මධුරම්න්නං ප්‍රයච්ඡති. 8. ප්‍රිය පුත්‍ර, ආචාර්‍යඃ ඝම්පෙන මාගෙණ ගච්ඡති. 9. මලිනං ජලං පාතුමහං න ඉච්ඡාමි. 10. ගඞ්ගෙර ජලාසයෙ ශොභනානි කමලානි පශ්‍යසි කිම්? 11. ධීරඃ පුරුෂඃ ක්ෂුද්‍රෙණ පොතෙන ගඞ්ගිරං සමුද්‍රං තරිත්වා ජම්බූවීපං ප්‍රාප්නොති. 12. යොධස්‍ය ශොභනො ධවලො'ශ්වො ගඞ්ගෙර ආවාටෙ පතති. 13. ක්ෂුද්‍රෙණ සකුනෙනෙ තුණ්ඩෙන තරෙණ සර්පිත්වා මධුරෙණ සවරෙණ කූජතඃ. 14. දුර්ධස්‍ය කෘෂිබලස්‍ය පිවරං වෘෂභං ව්‍යාඝ්‍රො ගර්ත්තාති. 15. අම්ලෙ තක්‍රෙ ජලං සංයොජ්‍ය පිබසි කිම්? 16. ගුරුඃ ශිෂ්‍යාන් ව්‍යාකරණ මධ්‍යාපයති. 17. මූර්ඛඃ ශිෂ්‍යො දුශ්ලොභිවනෙර්ගුරොශ්චිත්තං දුනොති. 18. චිනීතා බාලකා සුන්දරෙන ආචාරෙණ ගුරූණාං

චිත්තමාරුධයන්ති. 19. දුජ්ජිලෝ භූපඃ ප්‍රබලං නෘපතිං ප්‍රහර්තුං න ධෘෂ්ණෝති. 20. ඝ ස්වීයං දුෂ්ටං සංකල්පං විවෘණෝති. 21. රාමඃ ලක්ෂ්මණශ්චි ශරෛඃ ප්‍රහෘත්‍ය රාක්ෂසානාං ශිරාංසි ලුනීතඃ 22. ගොපාලස්‍ය පුත්‍රෞ ශ්වේතෞ වාෂභෞ ග්‍රාමං නයතඃ. 23. ශිෂ්‍යා ගුරුං ප්‍රශ්නාන් පෘච්ඡන්ති. 24. අහං පශ්‍යාමි ශිශෝඃ කොමලෞ හස්තෞ පාදෞ ච. 25. යොධඃ ශ්වේතං ධ්වජං උත්ක්ෂිප්‍ය රථස්‍ය අග්‍රෙ තිෂ්ඨති.

(ඉ) සංස්කෘතයට නගනු.

1. වදුරෝ (දෙදෙන) උස් ගසේ මුදුනේ සිටින්. 2. තරුණ පුතු ගේ දරුණු ලෙඩ සම්පී වෙදු ගේ බෙහෙදින් සංසිඳේ. 3. දක්ෂ කවියා රජු ගේ යහපත් ගුණය රම්‍ය වූ ශ්ලෝක යෙකින් වර්ණයි. 4. සොරු ගේ දුෂ්ට පුත්‍රයාව යෝධයා කුඩා කෝටුවේකින් ගසයි. 5. දුප්පත් ගැල්කරුවා දිරා ගිය ගැලෙක තර වූ ගොනකු යොදයි 6. බල්ලා කැඩපතෙහි සිය පිළිබිඹුව දැක තැති ගෙන බුරයි. 7. විරපුරුෂයා බියකරු ව්‍යාඝ්‍රයා ගෙන් කෙවිටු ගවයා මුදා සිය ගෙට ගෙන එයි. 8. මෝඩ පුරුෂයා ශුඛ දියෙන් සවකිය වස්ත්‍රය ශෝදන්නට කැමැතියි. 9. තෙපි බුදුරජුගේ මිහිරි වූ හිත වූ වචනය අසන්නට නො කැමැත්තහු ද? 10. ඔව්හු දෙදෙන ලොකු නැවෙකින් මුහුදේ පර තෙරට යෙති. 11. අපි මෙහි ගැඹුරු බොර දියෙහි කෙසේ නම් මත්ස්‍යයන් දකිමු ද? 12. විශාල උගතෙහි උස් ගසෙක කොවුලෙක් මිහිරි ලෙස නාද කරයි. 13. ඔහු දෙදෙන පිරිසිදු කෝප්ප දෙකෙකින් උණු වතුර බොති. 14. අපිරිසිදු දිය නාන්නට අපි නොකැමැත්තමු. 15. සොර තෙම ධනවත් ගෘහපතියා ගේ රත්වන් වස්ත්‍රය පැහැර ගෙන වනයට දිව එහි පදුරෙක සඟවයි. 16. ඍෂිහු (දෙදෙන) ඇදෙහි රන් පැහැති ඇතිරියෙහි ඉදගනිත්.

16

ආඛ්‍යාත ක්‍රියා.

ලඞ් (අතීත ක්‍රියා)

පරස්මෛ පද ප්‍රත්‍යයයෝ.

	ඒ.		ඛ.
ප්‍ර.	ත්	තාම්	අන්
ම.	ඃ	තම්	ත
උ.	අම්	ව	ම

ගච්ඡ (අකාරාන්ත අංග)

ප්‍ර.	සෝ අගච්ඡති (හේ ගියේය)	තෙ අගච්ඡන්ති (ඔහු දෙදෙන ගියහ)	තෙ අගච්ඡුන් (ඔහු ගියහ)
ම.	තුවං අගච්ඡසි (තෝ ගියෙහි)	තුවාං අගච්ඡථං (තොපි දෙදෙන ගියහු)	තුවං අගච්ඡථ (තෙපි ගියහු)
උ.	අහං අගච්ඡාමි (මම ගියෙමි)	ආවාං අගච්ඡාව (අපි දෙදෙන ගියමු)	වයං අගච්ඡාම (අපි ගියමු)

කුණ (ආකාරාන්තාංග)

	එ.	බ.	ඛ.
ප්‍ර.	අකුණාත්	අකුණිංසාං	අකුණිංසු
ම.	අකුණාඃ	අකුණිංසං	අකුණිංසු
උ.	අකුණාමි	අකුණිංව	අකුණිංම.

46 නවවන පාඩමේ න කාරාන්ත අංග යන්න බලනු. ලව් විභක්තියේ මෙන් ම මෙ ලඬ් විභක්තියෙහි ද එක වචනයන්හි අංගය ආකාරාන්තව ප්‍රථම පුරුෂ බහු වචනයෙහි ද සිටී. ප්‍රථම පුරුෂ බහු වචන අන් ප්‍රත්‍යය පර කල්හි අංගයේ අග සවරය ලොප් ව සන්ධි වේ. අකුණා අන්=අකුණ් + අන්= අකුණන් කියා වේ. අන් සියලු තන්හි අංගයේ අග සවරය ඊකාර ව සිටී.

තනු (උකාරාන්තඅංග)

	එක.	බ.	බහු.
ප්‍ර.	අතනොත්	අතනුතාං	අතන්වන්
ම.	අතනොඃ	අතනුතාං	අතනුත
උ.	අතනවං	අතනුව, අතන්ව	අතනුම, අතන්ම.

47. පසළොස් වන පාඩමේ තනු යන අංගයේ ලට් විභක්ති රූප හා මෙය සසඳා බලනු. මෙහි ලඬ් විබත්හි උත්තම පුරුෂ ඒක වචන අං ප්‍රත්‍යය පර කල්හි තනු යන අංගයේ අග උසන්න අව් ඛවට පෙරළුණු බව සිත තබා ගත යුතු. අන් සියලු තන්හි ලට් විභක්තියට කී නයින් දත යුතු.

විශෙෂ රූප.

කෘ (කුරු)

	එ.	බ.	ඛ.
ප්‍ර.	අකරොත්	අකුරුතාම්	අකුවන්
ම.	අකරොඃ	අකුරුතම්	අකුරුත
ඵ.	අකරවම්	අකුව	අකුම

48. මෙහි ද උත්තම පුරුෂ එක වචනයෙහි දී අංගයේ අග අව් හීදැ යි වූ සැටි පෙනේ. සෙස්ස පසළොස් වන පාඩමේ (කෘ) කුරු යන අංගයේ ලට් රූපයට කී නයින් දත යුතු.

ශක්නු.

	එ.	බ.	ඛ.
ප්‍ර.	අශක්නොත්	අශක්නුතාම්	අශක්නුවන්
ම.	අශක්නොඃ	අශක්නුතම්	අශක්නුත
ඵ.	අශක්නවම්	අශක්නුව	අශක්නුම

42. මෙහි ද නනු අංගයේ මෙන් ම උත්තම පුරුෂ එක වචනයේ අග අව් ඔවට පත්වූ සැටි පෙනේ.

සෙසු හැම තන්හි අංගයේ වෙනස්වීම් පසළොස්වන පාඩමේ 38 වන අංකයේ දී තිබෙන ක්‍රමය අනුව දත යුතු.

50. ලඬ් විභක්ති අංගයට මුලින් අ යන්නෙක් තිතර ම එක් වේ. අගච්ඡත්, අතනොත්, අ කරොත්, අශක්නොත්.

අභ්‍යාසය.

(අ) සිංහලයට නගනු.

1. අපි සෙනාපතෙඃ කාණිෂ්ඨඃ පුත්‍රොඃ'ශ්වමාරොඪුමශක්නොත්? 2. තෙ තරූන් ධූත්වා ඵලානි අපාතයන්. 3 බාලාඃ තරොර්මූලං ගත්වා බහූනි ඵලානි අවිඳන්. 4. තෙ ජීවිතස්‍ය විනාශෙ'පි පාපං නාකුර්වීත්. 5. මූතෙජීවනං කෘත්වා ආචාර්‍යං චිත්තමප්‍රුනීව. 6. උපාසකා විහාරං ගත්වා ධම්මශෘණ්වන්. 7. සාරමෙයොඃ බාලකං දෘෂ්ටවා පුවඡ්මධ්‍රුතොත්. 8. පුරා දෙවා අසුරෙඃ සහ සාගරම්මථ්නන්. ඉ. රාමෙඃ බහූන් ශරාන් ක්ෂිප්ත්වා රාවණස්‍ය ශිරාංසි අලුනාත්. 10. දුර්ධස්‍ය පුරුෂස්‍ය සද්ධ්‍රාවජෙඃ ශෘගාලා අශෘණ්වන්. 11. රාමෙඃ ලක්ෂ්මණශ්ච

ප්‍රබලාන් රක්ෂසාන් ප්‍රහර්තුමධෘෂ්ණුතාම්. 12. අපි යුයමාවාසීං ප්‍රශ්නාන් අපෘච්ඡත? 13. ආවාං දික්ෂාවයි ගෘහීත්වා රථස්‍ය අග්‍රෙ අතිෂ්ඨාව. 14. මාජිරෑ ක්ෂුද්‍රං මුෂතං මුඛෙන ගෘහීත්වා ගෘහාත් වහිරධාවත්. 15. අපි යුවාං මලිනෙෑ හසෙතෑ පවිත්‍රෙණ ජලෙන අක්ෂාලයතම්. 16. කිං යූයඃ කාලං වෘෂභං වජමනයත? 17. න වයං ගුරොශ්චිත්තමඳුනම. 18. පුත්‍ර, කිං ත්වමද්‍ය විද්‍යුලය මගච්ඡඃ? 19. පුරා රාජගෘහස්‍ය නගරස්‍ය සමීපෙ'රණ්‍ය ආශ්‍රමෙෂු බහවස්තාපසා අවසන්. 20. අහං තක්‍රෙ උදකං සංයොජ්‍ය අපිබම්.

(ආ) සංස්කෘතයට නගනු.

1. තර මිනිසෙක් උයනේ ගස ළඟ සිටියේය. 2. ළදරු වාගේ ලෙඩ මහලු වෙදු ගේ බෙහෙදින් සංසිදුණේ ය. 3. කුමාර දාශ රජ තෙම ජානකිහරණ කාව්‍යය හෙතිය. 4. කාලිදාශ තෙම රඝුවංශ කාව්‍යයෙහි දිලිප රජු ගේ ගුණය බොහෝ ශ්ලෝක වලින් වැණිය. 5. දුප්පත් ගැල්කරුවා ගැලෙහි ගොනුන් දෙදෙනෙකුත් යෙදී ය. 6. බල්ලා ඒදංඩෙහි සිට ජලය දෙස බලා සඩකිය පිළිබිඹුව දැකැ බිරුයේ ය. 7. තෙපි බුදුරජුහු ගේ ධර්මය ඇසුවහු ද? 8. පුත්‍රයෝ දෙදෙන රජුගේ වචනයෙන් වර දෙකක් තෝරා ගත්හ. 9. අපි දෙදෙන කුඩා ඔරුවෙකින් මුහුදු තරණය කෙළෙමු. 10. මම නුවර කඩයට ගොස් පොත් දෙකක් මිලට ගත්තෙමි. 11. මම තර මිනිසා (ඕම) හෙලන්නට නො හැකි වීමි. 12. අපි උදේ උයනට ගොස් ඵල එක් රැස් කළමු. 13. බල්ලෝ දෙදෙනා පරිකයන් දැක නගුට සැලූහ. 14. රාවණගේ බලය රාමතෙම මැඩී ය. 15. ළමයි පොකුණේ දිය ලී වලින් කැලම්බූහ.

17.

සංකීර්ණන පුල්ලිංගික ශබ්ද.

නෙතෘ (නායකයා)

	එ.	ලි.	බ.
ප්‍ර	නෙතා	නෙතාරෞ	නෙතාරඃ
සම්.	නෙතඃ	,,	,,
වි.	නෙතාරම්	,,	නෙතෘන්

තෘ.	නෙත්‍රා	නෙතෘභ්‍යාම්	නෙතෘභිඃ
ච.	නෙත්‍රෙ	,,	නෙතෘභ්‍යඃ
ප.	නෙතුඃ	,,	,,
ෂ.	,,	නෙත්‍රෝඃ	නෙතෘණාම්
ස.	නෙතරි	,,	නෙතෘෂු.

පිතෘ ශබ්දය මීට මදක් වෙනස් ව වර නැගේ.

පිතෘ

ප්‍ර	පිතා	පිතරෞ	පිතරඃ
සම්.	පිතඃ	,,	,,
ති.	පිත්‍රා	,,	පිතෘභිඃ
තෘ.	පිත්‍රා	පිතෘභ්‍යාම්	පිතෘභිඃ
ච.	පිත්‍රෙ	,,	පිතෘභ්‍යඃ
ප.	පිතුඃ	,,	,,
ෂ.	,,	පිත්‍රෝඃ	පිතෘණාම්
ස.	පිතරි	,,	පිතෘෂු.

මෙහි පිත්‍රා‍ම් පිත්‍රෙෞ පිතරඃ යන රූප පමණක් වරනැගි මේදි නෙතෘ ශබ්දයට එබා වෙනස් ව සිටී. සෙස්ස එය හා සමාන යි.

අභ්‍යාසඃ.

(අ) සිංහලට නඟනු.

1. දශරථස්‍ය පුත්‍රෝ රාමඃ ප්‍රබලං රාවණමජීනාත්. 2. පිතුර් වචනමනුපාලයිතුං රාමෝ වනමගච්ඡත්. 3. ධර්මෝ ලොකස්‍ය පාතා. 4. අහං ගන්තෘ මධ්‍රිරමන්නමඃ‍යච්ඡම්. 5. කිං ත්වං ලොකාන්‍ය ශාස්තාරං බුධං න අනමඃ?. 6. කිං යූයං මෛත්‍රෙය්‍ය සරලං සංසකෘතපුස්තකං න අපඨත?. 7 විනීතාඃ පුත්‍රාඃ පිතරමනුජජඝන්. 8. පිතා පුත්‍රෙශ්ච නප්තෘභිශ්ච සාර්ධං ග්‍රාමාත් නිර්ගච්ඡති. 9. පුත්‍රඃ පිතරං සන්දෙශං ප්‍රහිණොති. 10. රාමෝ නිත්‍යං පිතුඃ සමීප මාගච්ඡති. 11. භ්‍රාතා නප්තෘභ්‍යාං සහ කථයිතුමිච්ඡති. 12. විධාතා විෂ්ණුං දෘෂ්ටුං දෙවෛඃ සහ වෛකුණ්ඨමගච්ඡත්. 13. ස ගෘහස්‍ය කර්තාරමානයති 14 හෙත්‍රෙ රීශ්වර අනුශ්‍යත්. 15. යාවක්‍රා නිත්‍යං දුතුර් නිකටමගච්ඡත්. 16. අග්‍රජා කණිෂ්ඨෙ භ්‍රාතරි අස්නිහ්‍යත්. 17. අපි ත්වමපශ්‍යා ගෘහස්‍ය ගොප්තාරං නරම්?. 18. දුෂ්ටෙන භ්‍රා සහ න විචරාම්. 19. භ්‍රාතුඃ පාණෞඃ කඳුකමපතත්. 20. ශාස්තා මොක්ෂමධිගච්ඡාම්.

(ආ) සංස්කෘතයට නඟනු.

1. දශරථ ගේ පුත්‍රයා ජනක ගේ බෑනා විය. 2. පුතා ගේ පුතා මුණුපුරා ය. 3. භික්ෂූන්ට දෙන්නන් ගේ සමීපයට යෙමි. 4. රාම තෙම පියාට ආදරය කෙළේය 5. කවි තෙම දක්ෂ මිනිසා වැණිය. 6. ඔව්හු බ්‍රාහ්මයා වැඳුය. 7. කව්හු ශ්ලෝකවලින් දූහැම් මිනිසුන් ගේ ගුණ වැඳුහ. 8. මාතියෙහි යන්නෝ ගස සමීපයේ ඉඳ ගනිත්. 9. රජ තෙම දිනන්නහුට බොහෝ ධනය දුනි. 10. බුදු රජ ලොවේ නායකයා විය 11. දෙන තැනැත්තෝ ලොව දුලබ ය. 12. මිනිස්සු සත්‍යය කියන්නන් (සත්‍යයා ගේ වක්තෘන්) වුදත්. 13. ශාස්තෘ තෙම පන්සලට වැඩ ගිලන් මහණ දක්නේ ය. 14. ලෝකයේ ශ්‍රේෂ්ඨ වක්තෘවූ බුදුරජු ගේ මධුර වචනය මම ඇසිමි. 15. ශ්‍රාවකයා ගේ දෙ නෙත් රෝගය පෙළෑ. 16. හේ නායනයාට දූස් පෙන්වී.

18.

ඉකාරාන්ත නපුංසක ලිංගික ශබ්ද.

දධි. (දී කිරි)

	එක.	ද්වි.	බහු
ප්‍ර.	දධි	දධිනී	දධීනි
සම්.	හෙ දධි, දධෙ	හෙ දධිනී	හෙ දධිනී
ද්වි.	දධි	දධිනී	දධීනි
තෘ.	දධිනා	දධිභ්‍යාම්	දධිභිඃ
චතු.	දධිඥෙ	,,	දධිභ්‍යඃ
පං.	දධිනඃ	,,	,,
ෂ.	,,	දධිඥෝඃ	දධීනාම්
ස.	දධිනි, දධෙනි	,,	දධිෂු

අක්ෂි, අඤ්ජි, සක්ථි යන ශබ්ද දධි ශබ්දය මෙන් වර නඟනු.

වාරි ශබ්දය මීට වෙනස් ව වර නැගේ.

වාදි.

	එක.	බ.	ඛ.
ප්‍ර.	වාදි	වාදිණ්	වාදිණ්
සම්.	හෙ වාදි, වාදෙ	හෙ වාදිණ්	හෙ වාදිණ්
ද්‍වි.	වාදි	වාදිණ්	වාදිණ්
තෘ.	වාදිනා	වාදිහ්‍යාම්	වාදිභිඃ
ච.	වාදිනෙ	,,	වාදිභ්‍යඃ
ප.	වාදිනඃ	,,	,,
ෂ.	,,	වාදිනොඃ	වාදිනාම්
ස.	වාදිණ්	,,	වාදිසු

අභ්‍යාසය.

(අ) සිංහලයට නගනු.

1. ගොපාලෝ දධි අමථ්නාත්, තද් තක්‍රමභවත්. 2. අඤ්ඃ පෘෂ්ඨෙන පුරුෂමවහත්. 3. වයං ශුඩෙන වාරිණා මුඛම්ක්ෂාලයාම. 4. ආවාං සුගන්ධිනි පුෂ්පාණි ගෘහීත්වා විහාරමගච්ඡාව. 5. සංග්‍රාමෙ භටා අශ්වානාරොහන්ති. 6. අහම්මිලං දධි භක්ෂයිතුං න ඉච්ඡාමි. 7. බාලකෝ දධ්නා සාකං ප්‍රභූතමොදනමශ්නාති. 8. ත්‍රිණ්ණෙ යෘතෙෂ භාන්නෝඃ කිරණාඃ වර්ණා භවන්ති. 9. සමුද්‍රස්‍ය වාරි ලවණම්. 10. දධ්නි වාරි න ප්‍රක්ෂිපාම්. 11. වානරාණාං ලාංගූලානි දීර්ඝාණි. 12 කිං න ත්වං සිතෙන සාර්ධං දධි න අශ්නාසි. 13. අසප්තානාං වර්ෂාය අගදමපිබම්. 14. වයම්යක්ෂිභ්‍යාං රූපාණි පශ්‍යාමඃ. 15. ව්‍යාධිර්භික්ෂොරක්ෂිණි අපීඩයත්.

(ආ) සංස්කෘතයට නගනු.

1. රජ ජනයන් උප්ද්‍රව කෙරෙන් රැක ගති. 2. අශ්වයෝ පොකුණට ගොස් දිය පූහ. 3. ලම්පි නගරයේ කඩයට ගොස් බංකුවෙක හිද රස කැවිලි කති. 4. භෝජනයෙන් ශරීරය පෝෂිත කළමු. 5. භය නැති පුරුෂ තෙම පයින් (කොන්ඩයෙන්) සොරුට ගැසී. 6. සත්ත්වතෙම දැසින් රූප දකි. 7 උස් පර්වතයන් ගේ මුදුන්හි ගිජුලිහිණි කුඩ සාදත්. 8. ව්ජීතපුරයෙහි සිංහලයන් ගේත් ද්‍රවිඩයන් ගේ ත් බිහි යුතු යුද්ධයෙක් වී ය 9. සිංහලයෝ සතුරන් කෙරෙහි (වෙතට) ඊ ගස් යැවූහ. (විදූහ.) 10. කුඹල් තෙම වළන් හැදීමට මැටි මැඹී. 11. ගොවියෝ (දෙදෙන) කොත් දෙක සෑහ. 12. උයනේ පුෂ්පයෝ සුගන්ධ වත් හ

(ඉ) **කපි, වාරි** යන ශබ්ද දෙක වර නැගීමේදී සමාන ව සිටින තැන් කවරේ ද? අසමාන ව සිටින තැන් කවරේ ද? සි දක්වනු.

(ඊ) තුං, තඃ යන ප්‍රත්‍යයන් හෙන් සැදුණු පද යොදා වාක්‍ය දශ යක් ලියනු.

19.

උකාරාන්ත නපුංසක ලිංගික ශබ්ද.

මධු (මී)

	එක.	ච.	බ.
ප්‍ර.	මධු	මධූනි	මධූනි
සම්.	හෙ මධු, මඃඩො	හෙ මධූනි	හෙ මධූනි
ච්.	මධු	මධූනි	මධූනි
තෘ.	මධුනා	මධුභ්‍යාම්	මධුභිඃ
ච.	මධුනෙ	,,	මධුභ්‍යඃ
ප.	මධුනඃ	,,	,,
ෂ.	,,	මධුනොඃ	මධූනාම්
ස.	මධුනි	,,	මධුෂු

අභ්‍යාසය.

(අ) **සිංහලයට නගනු.**

1. ස ඉදානීමක්ෂිභ්‍යාමශ්‍රූණි මොචයති. 2. වයං හස්තාභ්‍යාං වස්තූනි උඛරාමඃ. 3. අවකරස්‍ය දුර්ගන්ධෙ වායුරදූෂ්‍යත්. 4. තක්ෂකා දරුණා පියෙ අකුප්‍යන්. 5. මධුකරා පදෙමභ්‍යා මධු සංචිණ්වන්ති. 6. භෘංගාඃ පුෂ්පෙභ්‍ය මධූ අපිවන්. 7. අහං සවයමෙව ශ්‍රොත්‍රෙ අමූණ්ඩම්. 8. ගජස්‍ය අක්ෂිනී ලඝුනී. 9. උෂ්ට්‍රස්‍ය ඔෂ්ඨෞ විපුලෞ. 10. යොධො'රෞ ඉෂූ අක්ෂිපත්. 11. ව්‍යාධිඃ කුමාරස්‍ය ජානුනී අපීඩයත්. 12. කුමාරස්‍ය අක්ෂිභ්‍යාමශ්‍රූණි ගලන්ති. 13. තඩාගස්‍ය වාරි පථිකා අපිබන්. 14. වාරිණා කමලං විහාති, කම ලෙන වාරි විභාති. 15. ක්ෂූරකො ගෘහපතෙඃ ශ්මශ්‍රූණි අකෘන්තත්. 16. ඖංගුනොඃ මූල්‍යං න ජානීවඃ. 17 ශිශවොඃ 'ම්බූනි අඛ්‍රීඩන්. 18. දූරකා ජම්බූනි ගෘහීත්වා අඛාදන්. 19. ජන්තවොඃ වසූති ඉවජන්නි. 20. ඵලානාං දුශ්චෙෂ්ටිතස්‍ය ඵලානි සාධවොඃ නුභවන්ති.

(ආ) සංස්කෘතයට නගනු.

1. මීයේ ගඤ්ඣ මිහිරි ය. 2. මිනිස්සු වසතු (=ධනයන්) කැමැති වෙත්. 3. හේ දිවෙන් තල්ල යැපී කෙළේය. 4. ව්‍යාඝ්‍ර තෙම තියවලින් මුවා ඉරි ය. 6. රදෑ තෙම වැවෙහි වසනු සේදි ය. 6. රාමයා ගේ අතෙහි බර කඩුවක් මම දැක්කෙමි. 7. දශරථෝ දර ගෙනෙන්නට දුර කැලෑවට ගියහ. 8. ළමයා ගුරුහුගේ අතෙහි වේවැල දැක කඳුළු ගෙලි (මිදි) ය. 9. තෝ පිරිසිදු දියෙන් මුහුණ සේදිය. 10. උත්සාහයෙන් අපි දෙදෙන ධනය රැස් කළමු. 11. මම කරකැත්තෙන් ළමයාගේ හිස මුඩු කරමි. 12. බඹරුන් ගේ මුඛයෙහි ශ්මශ්රූන් ගේ සථානයෙහි වක් වූ රෝමදෙක දක්නෙහි ද?. 13. පොතෙහි බොහෝ සිත්කළු සිතියම් දිටිමි. 14. මුවා ගේ ඇස් ඉක් ය. 15. බකමූහුණා ගේ ඇස් වට ය. 16. ගුරුළා දග තයකු ගෙන ගොස් නියෙන් ඉරි ය. 17. මේසයා ගේ ශබ්දය අසා මොනරු පිල් විදහා නැටුහ. 18. බකමූහුණු තෙම ඉර එලිය දක්නට නො හැක්කේ ය. 19. ළමයි උයනට ගොස් ගල් ගසා (විසි කැරැ) අඹ නෙලූහ (කඩා දැමූහ.)

20.

ආඛ්‍යාතය.

ආඛ්‍යාතාරම්භ අංග.

යා.

වර්තමාන (ලට්) පරස්මෛපද.

	එ.	ද්වි.	බ.
ප්‍ර.	යාති	යාතඃ	යාන්ති
ම.	යාසි	යාථඃ	යාථ
උ.	යාමි	යාවඃ	යාමඃ

යාති. යයි ආදීන් අමී හත යුතුයි.

ලුඞ් (අතීත)

	එ.	ද්වි.	බ.
ප්‍ර.	අයාක්	අයාතාම්	අයාන්, අයුඃ
ම.	අයාඃ	අයාතම්	අයාත
උ.	අයාම්	අයාව	අයාම

දෘ, පා, ඛා, මා, වා, ස්නා යන මොවුන් යා අංගය සේ වරණ නගනු.

44. උපසර්ග පූර්වක අංගයන්ගේ අතීත රූප. **ප්‍රතිගච්ඡති** මෙහි **ප්‍රති** යනු උපසර්ග යි. **ගච්ඡ** යනු අංගය යි. මෙහි අතීත (ලඞ්) රූප සැදීමේදී අ යන්නක් අංගයට මුලින් එක්වන බව ඉට පාඩමේ අංකයෙහි කියන ලදී. එය එක්වනුයේ කොතනට ද? **ප්‍රති** යන්නට මුලින් එය යොදා **අප්‍රතිගච්ඡ** යැ යි සාදා ගන්නොත් හරි ද? වැරදී යි. අංගය වූ **ගච්ඡ** යන්නට ම මුලින් අකාරය යොදා **ප්‍රතිඅගච්ඡ** කියා සාදා ගත යුතු.

එවිට ප්‍රති අගච්ඡත්, ප්‍රති අගච්ඡතාම්, ප්‍රති අගච්ඡන් ආදි වශයෙන් පද සැදේ. එක ම පදයෙක මැද සන්ධි වියැ හැකි තැනක් වුවොත් එහි සන්ධිය විය යුතු ම ය. මෙහි **ති අ** දෙක සන්ධි විය යුතු. මෙබඳු තන්හි සන්ධි කිරීම හැකි වනු පිණිස පහත සඳහන්වන සන්ධි ක්‍රම සිතට ගත යුතු.

45. **සමානවර්ණ** එක් ව දිර්ඝ වේ.

අ + අ = ආ —▷ ප්‍ර + අයාත් = ප්‍රායාත්
ආ + අ = ආ —▷ ආ + අගච්ඡත් = ආගච්ඡත්
ඉ + ඉ = ඊ —▷ ප්‍රතිඉච්ඡති = ප්‍රතීච්ඡති

46. ඉවර්ණයෙන් පර ව අසවර්ණයක් (ඉයන්න හැර අන් වර්ණයක්) සිටියොත් ඉයන්නට ය් ව පර සවරය හා එක්වේ.

ප්‍රති + අගච්ඡත් = ප්‍රත් ය් + අගච්ඡත් = = ප්‍රත්‍යගච්ඡත්.

47. උ යන්නෙන් අසවර්ණයන් පරකල්හි උයන්නට ව් වේ. අනු— අගච්ඡත් = = අන්වගච්ඡත්.

48. ඝෝෂයකට පෙර හෝ සවරයකට පෙර සිටි අඝෝෂය ඒ වනියේ ම ඝෝෂය බවට හැරේ. උත් + ගච්ඡති = උද්ගච්ඡති.

49. අ + ඉ එක් ව ඒ වේ. අ + ඉච්ඡත් = = එච්ඡත්

50. අ + උ එක් වැ ඔ වේ. ප්‍ර + උකත = = ප්‍රොකත.

51. ත් + හ එක් වැ ද්ධ = = ඛ වේ. උත්හරති = උද්ධරති = උඛ්ඛරති.

අභ්‍යාසය.

(අ) ප්‍රති ගච්ඡ, ප්‍රති ආගච්ඡ, උඛර, (උත්-හර), සම් ගච්ඡ, අනු ගච්ඡ, ප්‍රාප්නු (ප්‍ර + ආප්නු), විවෘණු. සනා, පා, ප්‍රහිණු, ග්‍රන්ථ, ජාණා, අනුගෘහ්ණා යන මේ අංගයන්ගේ ලට් ලඞ් රූප දෙනු. මොවුන් යොදා වාක්‍ය විස්සක් ලියනු.

21.

නාම.

සත්‍රී ලිංගික ශබ්ද.

ආකාරාන්ත.

කන්‍යා.

	ඒ.	ඒ.	බ.
ප්‍ර.	කන්‍යා (කන්‍යා තොම)	කන්‍යේ (දෙදෙනෙක් කන්‍යාවෝ)	කන්‍යාඃ (කන්‍යාවෝ)
සම්.	කන්‍යේ (කන්‍යාව)	කන්‍යේ (දෙදෙනෙක් කන්‍යාවෙනි)	කන්‍යාඃ (කන්‍යාවෙනි)
ඒ.	කන්‍යාම් (කන්‍යාව)	කන්‍යේ (දෙදෙනෙකුන් කන්‍යාවන්)	කන්‍යාඃ (කන්‍යාවන්)
තෘ.	කන්‍යයා (කන්‍යාව විසින්)	කන්‍යාභ්‍යාම් (දෙදනකුන් කන්‍යාවන් විසින්)	කන්‍යාභිඃ (කන්‍යාවන් විසින්)
ච.	කන්‍යායෛ (කන්‍යාවට)	කන්‍යාභ්‍යාම් (දෙදෙනෙකුන් කන්‍යාවන්ට)	කන්‍යාභ්‍යඃ (කන්‍යාවනට)
ප.	කන්‍යායාඃ (කන්‍යාව ගෙන්)	කන්‍යාභ්‍යාම් (දෙදෙනකුන් කන්‍යාවන් ගෙන්)	කන්‍යාභ්‍යඃ (කන්‍යාවන් ගෙන්)
ෂ	කන්‍යායාඃ (කන්‍යාව ගේ)	කන්‍යයෝඃ (දෙදෙනකුන් කන්‍යාවන් ගේ)	කන්‍යානාම් (කන්‍යාවන් ගේ)
ස.	කන්‍යායාම් (කන්‍යාව කෙරෙහි)	කන්‍යයෝඃ (දෙදෙනකුන් කන්‍යාවන් කෙරෙහි)	කන්‍යාසු (කන්‍යාවන් කෙරෙහි)

52. සඤ්. න යන්නට පූර්‍වයෙන් සිටි ඣ් යන්න ඤ් වේ. උදා. ග්‍රාමාත් + නයති=ග්‍රාමාන්නයති.

අභ්‍යාසය.

(අ) සිංහලයට නගනු.

1. ගජඃ ඉණ්ඩායා අග්‍රෙණ තෘණානි උඩරති. 2. ක්‍රූරඃ ශාක විකඃ කශයා වෘෂභාවතාඩයත්. 3. ලතෙ පුෂ්පෙ ලීසතඃ. 4. බාලිකා පූෂපාය උද්‍යානමව්‍රජත්. 5. වෘක්ෂස්‍ය ශාඛායඃ පණීා න්‍යපතන්. 6. පිතුරාඥයා පුත්‍රෝ ජාමාතරමානයත්. 7. මණ්ඩූකා වර්ෂාසු රටනති. 8. මෛත්‍රෝ ඒණාම්වාදයත්. 9. ස ආගත්‍ය අත්‍ර පෙටිකාං කුංචිකයා ව්‍යවෘණොත්. 10. රාවණඃ සීතාං ලඞ්කාම හරත්. 11. කිං ත්වං සප්ලං සුනඛං ශෘඞ්ගලයා අබධ්නාඃ?. 12. අජයොම්ඩ්‍ය'ජපාල අනිෂ්ඨත්. 13. සෙනාපතෙඃ සුශීලඃ පුත්‍රෝ භෘත්‍යයොඃ කෘපාමකරොත්. 14. සා ගංගාං ගත්වා අසනාත්. 15. පාඨශාලායාම්සනෙෂු කන්‍යා උපාවිශන්. 16. තෙෘ ප්‍රථමායාං කක්ෂ්‍යායාං පඨනති. 17. ආවාං වෘක්ෂස්‍ය ඡායායාමුපාවිශාව. 18. ධර්මෝ ජනාන් ඝොරාන් නරකාත් පාති. 19. රම්‍යෙ උද්‍යනෙ ශීතලොා වායුරවාත්. 20. තරොර්මූලෙ ශිලායාමුපාවිශාම. 21. ත්‍රාතුඝීවනෙන දුරිකා පිතුඃ සමීපං වෙගෙන ප්‍රායාත්. 22. අස්ති නම්දුයාසන්නිරෙ විශාලොා ජම්බු තරුඃ 23. ව්‍යාධොා'රණ්‍යෙ චරිත්වා මෘගාන් මාරයති. 24. කිං යුවා මහිමපිඞයතම්?. 25. න වයං ජන්තූන් පීඩයාමඃ.

(ආ) සංස්කෘතයට නගනු.

1. යතුරෙන් පෙට්ටිය ඇරීම්. 2. ගසේ අතුවල බොහෝ කුරුල්ලෝ සිටිත්. 3. ළමයා ගංගාවේ ඉවුරේ ගසේ සෙවෙනෙහි ඉදිගති. 4. ගොපල්ලන් දෙන්නා ගේ අඹුවෝ දෙදෙනා දී කැලැඹුන. 5. වදුරෝ ගස්වල අතුවල සිටිත්. 6. වළේ තඹ කළයක් දැකිම්. 7. රාමයා ඊෂයන් විද ක්‍රූර තාටිකාව මැරී. 8. ගින්නේ දැල්ල අහසට නැංගේය. 9. තෙපි දෙදෙනා ගංගාව ගේ පරතෙරට යාමට දියට බසිවු ද?. 10. නයා තුඹස උඩ පෙනේ සරසි. 11. පාඨශාලාවේ දශීනය ශෝභන ය. 12. ගංගාවගේ දිය ඇල වලින් හෙත්වලට පමුණුවත්. 13. ගසේ ඡායාව විශාල වේ. 14. කන්‍යාවන් දෙදෙනා ගේ බළල්ලු (දෙදෙන) මියන් දෙදෙන කුන් ඇල්ලූහ. 15. රාම ද ලක්ෂ්මණ ද සීතා ද දශරථ රජුහු වැද මාලිගායෙන් නික්මුණා හ. 16. නගරයේ විශාල ශාලාදෙකෙහි බොහෝ මිනිස්සු රැස්වූහ. 17. කන්‍යාවෝ ග්‍රීවාවන් මහඟු මාලා වලින් සැරසුහ. 18. විෂණු තෙම රමාව ගේ සැමියා වේ. 19. මාලූ, වන් කොරෙන් සුවඳ හැමී ය. 20. විෂ්ණුව මිනිසාට ආභරණය වේ.

21. අපි ළිඳට ගොස් දිය බීවෙමු. 22. ඉල්ලීමෙන් මිනිසා වැරේ. 23. අහසෙහි තරු ගණන් කරන්නට හැක්කෙකි ද? 24. රාත්‍රි යෙහි සඳරැස් වේ, දහවල් හිරුහුගේ රශ්මිය වේ. 25. තරුණ වියෙහි දී සත්‍රී මිනිසාගේ ඇසට ප්‍රියවේ. 26. වැල්වලැ බොහෝ මල් පිපෙත්. 27. මල් නෙලන්නට ලතාවන්ගේ සමීපයට ගියෙමු. 30. දේවතා තොම රාත්‍රියෙහි බොහෝ දේවතාවන් හා බුදුහු සමීප යට ප්‍රශ්න අසන්නට ආ ය. 31. කෙතෙම් ගොතා ගමින් නො ගෙනාගේ ය. 32: හේ ගසින් නො වැටුණේ ය.

22.

ඉකාරාන්ත පුල්ලිංගික නාම.

භූමි. (බිම)

	එක.	බ.	බහු
ප්‍ර.	භූමිඃ	භූමී	භූමයඃ
සම්.	භූමෙ	,,	,,
වි.	භූමිම්	,,	භූමීඃ
තෘ.	භූම්‍යා	භූමිභ්‍යාම්	භූමිභිඃ
ච.	භූමයෙ, භූමයෙ	,,	භූමිභ්‍යඃ
ප.	භූම්‍යාඃ, භූමෙඃ	,,	,,
ෂ.	,, ,,	භූමයොඃ	භූමීනාම්
ස.	භූම්‍යාම්, භූමෞ	,,	භූමිෂු

අභ්‍යාසය.

(අ) **සිංහලයට නගනු.** (සන්ධි කළ හැකි තැන් සන්ධිකරණු.)

1. යෘෂෙර්මූර්ධ්නීඃ ප්‍රඝානන්නා අස්‍යති. 2. චන්ද්‍රා රාත්‍රෙෞ උදයති. 3. නෞ තඩාගස්‍ය තටෙ ශිලායාං තිෂ්ඨතඃ. 4. භූමෞ පතිත්වාති මයූරස්‍ය පිඤ්ජාණි ගෘහීත්වා වායසඃ ශරීරෙ ධාරයති. 5. සාරමෙයාණාං හඞ්ගෙන රාත්‍රිෂු චොරා අත්‍ර න ආයාන්ති. 6. සාධූනාං කීර්ති ලෝකෙ ප්‍රසරති. 7. මුනෞ භූපතෙර්නිකතිරවංවිලා අසීති. 8. වෘශෙඩ්ගා ඉදානීං භූම්‍යාං පතන්ති. 9. ඡත්‍රං වෘශෙරාතපාත් ව ජනාන් රක්ෂති. 10. දශරථඃ ප්‍රිත්‍යා පුත්‍රමාශ්ලිෂ්‍යති. 11. ඛඟාඃ පාදාභ්‍යාං භූමෙඃ වලිතුං න ශක්නුවන්ති. 12. ආවාං මුකතයෙ

බුවං භජාවඃ 13. සංසකාත භාත්‍යායාඃ පථනං ප්‍රීතයෙ භවති. 14. ජනානාං ශෞර්‍යං කීර්ත්‍යෙ භවති. 16. තත්‍ර විහාරෙ බුඩස්‍ය මූර්ති රස්ති 16. ශුකනයො ජලතිඩාවුද්භවනති. 17. ගෘහපතෙඃ කන්‍යා විපතිං ගත්වා දීපං ත්‍රිණාති. 18 ලොභෙන බුද්ධිශ්චලති. 19 කෘෂි බලො හලෙන භූමිං භාජති 20. ස ජාත්‍යා ක්ෂත්‍රියොඃස්ති. 21. ත්‍රාහමණා අහොයෙ ආහූතිරර්පයන්ති.

(ආ) සංස්කෘතයට නගනු.

1. කන්‍යාවෝ දිය නාන්නට වැවට යෙති. 2. ගෘහපති තෙම විහාරයට ගොස් බුදුරජුහු වැඳ බිමෑ හිඳ ගනී. 3. දුකින් මිදෙනු පිණිස නුවණැත්තෝ මුනිහු භජනය කරත්. 4. රාම තෙම ප්‍රීතියෙන් පුත්‍රයා වැළඳ ගනී. 5. දාශ තෙම කරඹුව බිමෑ තබයි. 6. ඇතා ගේ දතේ කෙළවර තියුණු ය. 7 ගෘහපති තෙම අඹුවන් දෙන්නාට සළු දෙකක් දෙයි. 8. දැන් ඉර බසී, නොබෝ වේලා වෙකින් රාත්‍රිය පැමිණේ. 9. චන්‍ද්‍රයාගේ කාන්තිය සිත් කළු ය. 10 අපි නුවණැත්තන්ගේ වචනය (උක්ති) අනුව යමිහ. 11. බම්මණා බුදුරජුහු දැක ජාතිය විචාරයි. 12. සඳුගේ කාන්තියෙන් රැය සිත් කළු වේ. 13. මූසයන්ගේ භක්ෂ්‍යය වංචල ය. 14. අපි නැවින් ගංගාව තරණය කරම්හ. 15 ගංගා නදිය හිමාලයෙන් ගලා එයි. 16 ලංකායෙහි මුහුදු තෙරැ බොහෝ පොල්ගස් ඇත. 17. රාවණ යා ගේ දුර්වචන වලින් සීතා ත්‍රාසයට පැමිණේ. 18. නුවණැත්තෝ මෘදු වචනවලින් මිත්‍රයන් වශයෙහි කෙරෙති. 19. පණ්ඩිතයෝ සත්‍රුනට නො කිපෙත්. 20. ධීර වූ තවුස් තෙම යෝග භාවනා කොට සිඩි ලබයි.

23.

ඊකාරාන්ත ස්ත්‍රී ලිංගික ශබ්ද.

නදී. (නදිය)

	එක.	බ.	බ.
ප්‍ර.	නදී	නද්‍යෞ	නද්‍යඃ
සම්.	,,	,,	,,
ද්‍ව.	නදීම්	,,	නදීඃ
තෘ	නද්‍යා	නදීභ්‍යාම්	නදීභිඃ
ච.	නද්‍යෛ	,,	නදීභ්‍යඃ
ප.	නද්‍යාඃ	,,	,,
ෂ.	,,	නද්‍යෝඃ	නදීනාම්
ස.	නද්‍යාම්	,,	නදීෂු.

ඊ ශබ්දය මිට වෙනස් ව වරනැගේ.

	එක.	ද්වි.	බ.
ප්‍ර.	ධීඃ	ධියෞ	ධියඃ
සම්	,,	,,	,,
ද්වි.	ධියම්	,,	,,
තෘ.	ධියා	ධිභ්‍යාම්	ධිභිඃ
ච.	ධියෙ, ධිඒ	,,	ධිභ්‍යඃ
ප.	ධියඃ, ධියාඃ	,,	,,
ෂ.	,, ,,	ධියොඃ	ධියාම්, ධීනාම්
ස.	ධියි, ධියාම්	,,	ධිෂු

ශ්‍රී, හ්‍රී, ෂුධී, දුර්ධී, භී යන ශබ්ද ධී ශබ්දය මෙනි.

සත්‍රී ශබ්දයේ එක වචන.

ප්‍ර.	සත්‍රී	ච.	සත්‍රියෙ	(ෂඤි බහු වචනය)
සම්.	,,	ප.	සත්‍රියාඃ, සත්‍රියඃ	සත්‍රිණාම්.
ද්වි.	සත්‍රීම්, සත්‍රියම්	ෂ.	,, ,,	සෙසු තැන් ධී
තෘ.	සත්‍රියා	ස.	සත්‍රියාම්	ශබ්දය මෙනි.

ආඛ්‍යාත ක්‍රියා.

ලොට් විභක්ති රූප. (පරස්මෛපද.)

	එ.	ද්වි.	බ.
ප්‍ර.	තු	තාම්	අන්තු
ම.	හි	තම්	ත
උ.	ආනි	ආව	ආම

ලෝට්.

මෙය ආශීර්ලිඞ් නියෝග ප්‍රර්ථනා ආදී අර්ථ හැඟවීමෙහි යෙදේ.

භවජ (අකාරාන්ත අංගය.)

සඃ භවජතු	තෞ භවජතාම්	තෙ භවජන්තු
(හේ ඒවා)	(ඔහු දෙදෙන යෙත් වා)	(ඔහු යෙත්වා)
ත්වං භවජ	යුවාං භවජතම්	යූයං භවජත
(තෝ යා, ඔව)	(තෙපි දෙදෙනා ඔවු)	(තෙපි ඔවු)
අහං භවජානි	ආවාං භවජාව	වයං භවජාම
(මම් යෙම් වා)	(අපි දෙදෙන යමෝ වා, ඔමු)	(අපි යමෝ වා, ඔමු)

53. අකාරාන්ත අංගයෙන් පසු ව සිටි ති විභක්ති ලොප් වේ. ගච්ඡ (ති)= ගච්ඡ

ක්‍රිණා. (ණාකාරාන්ත අංග)

	එ.	බ.	බ.
ප්‍ර.	ක්‍රිණාතු	ක්‍රිණාම්	ක්‍රිණන්තු
ම.	ක්‍රිණාහි	ක්‍රිණීතම්	ක්‍රිණීත
උ.	ක්‍රිණානි	ක්‍රිණාව	ක්‍රිණාම.

54. මේ ලොව් විභක්තියෙහි ණාකාරාන්ත අංගයන් ගේ අග ආ කාරය ප්‍රථම පුරුෂ ඒක වචන බහු වචන දෙකෙත් උත්තම පුරුෂයේ සියලු ම තැනත් එ සේ ම සිටී. අන් හැම තැන ම ඒ බවට පැමිණේ. මධ්‍ය පුරුෂ ඒක වචන හි රූපය නො මැකී සිටී.

නු. (උකාරාන්ත අංග)

ප්‍ර.	නෝතු	නුනාම්	නවන්තු
ම.	නු	නුනුතම්	නුනුත
උ.	නවානි	නවාව	නවාම

(විශේෂ රූප.)

කර (කුරු)

ප්‍ර.	කරොතු	කුරුනාම්	කුර්වන්තු
ම.	කුරු	කුරුතම්	කුරුත
උ.	කරවානි	කරවාව	කරවාම

ශක්නු.

ප්‍ර.	ශක්නොතු	ශක්නුනාම්	ශක්නුවන්තු
ම.	ශක්නුහි	ශක්නුතම්	ශක්නුත
උ.	ශක්නවානි	ශක්නවාව	ශක්නවාම

55. උකාරාන්ත අංගයන් ගේ අග සවර ය උත්තම පුරුෂයෙහි අව් බවට පැමිණේ. මධ්‍යම පුරුෂ ඒක වචනයෙහිත් අංගය නොවෙනස් ව සිටී. අංගයේ අග ව්‍යංජනය ඉන් මුලින් සිටි අකුරක් හා බැඳුණ තැන පමණක් හි යන්න ලොප් නො වේ. අන් තන්හි ලොප් වේ. සෙසු සියලු රූප පසළොස් වන පාඩමේ හි ක්‍රමය අනුව සාදා ගත යුතු.

ආශීර්වාදයෙහි මධ්‍යම පුරුෂ එක වචනයේත් ප්‍රථම පුරුෂ එක වචනයෙත් **නාත්** ප්‍රත්‍යය වේ.

ස **ජයනාත්** (හේ දිනාවා)
එවං **ජයනාත්** (තෝ දිනෙහි වා)

ණා (ආකාරාන්තාංග)

ප්‍ර.	යාතු	යාතාම්	යානතු
ම.	යාහි	යාතම්	යාත
උ.	යානි	යාව	යාම

සෙසු **පා** ආදී ආකාරාන්ත අංග ද මෙ සේ ම වරනඟනු.

අභ්‍යාසය.

(අ) **සිංහලට නඟනු.**

1. යුවාං නෞකයා නදීං තරතුම්. 2. අහං පත්‍රෙ ලෙඛන්‍යා ලිඛාමි. 3. සරසීෂු කමලානි මානසමහරන්. 4. ආවාං සනාතාය නදීං යාව. 5. නාවිකඃ ක්ෂෙපණ්‍යා නෞකාමක්ෂිපත්. 6. භර්තුඃ ඛිනං පුත්‍රිණීමෙව ප්‍රාපෙනාති. 7. හංසා බාහුල්‍යෙන පද්මිනීෂු වසනති. 8. හිමාලයාදහාගිරපී ප්‍රභවති. 9 අඞ්ගුලීනාමග්‍රෙ නඛානි පශ්‍යත. 10. කමලිනඃ සූර්‍යස්‍ය උදයෙ විකශනති. 11. කදල්‍යඃ ලඞ්කායාං සර්‍වත්‍ර ප්‍රරොහනති. 12. නමෝ ජනනෙත්‍ය. 13 කුමාරා මූරලි ගීඃ හිත්වා වාදයනතු. 14. පිතා පුත්‍රාන් තර්‍ජන්‍යා අතර්‍ජයත්. 15. කිං යුවාං නද්‍යඃ පාරං ගවඡතම් 13. නද්‍යඃ සතීරයොනීගරුණි පශ්‍යත. 17. මර්‍යුරි නතීතුං න ශක්නොති. 18 රාඤසීනාං දුරුකතිභිඃ සීතා ත්‍රාසං ප්‍රාපෙනාති. 19. ජනූන්‍යඃ පුත්‍රාන් රක්ෂනති. 20. ප්‍රෙමමය්‍යා වාණ්‍යා මිත්‍රාණි වශෙ කුර්‍වනතු ජනාඃ 20 හෙ විඝෙණා, ලොකාන් පාඡ්. 21. තෙ මුකතිං ප්‍රාප්නුවනතු. 22. ආවාං පුණ්‍යානි කරවාව.

(ආ) **සංස්කෘතයට නඟනු.**

1. මම පෑන් දෙකක් මිළට ගතිමි. 2. සත්‍රී තෙළම්මිල් ගෙතෙන්නට ගොස් වැවට බැස්සා ය. භාගීරතී නදියේ තීරයෙහි විශාල ඉඹුල් රුකෙක් ඇත. 4. සත්‍රිහු ඇඟිලිවලැ ඇහිලි මූදු දුරුහ. 5. නදීන් ගේ දියෙහි නෑමෙන් කෙසේ චිත්තයාගේ ශුද්ධියෙක් වේ ද? 6. කන්‍යාවගේ සිතෙහි ලජ්ජාව වේ. 7. ශ්‍රී තොමෝ ප්‍රාසාදයේ වෙසේවා. 8. වශිෂ්ඨ ඍෂිහුගේ බිරිඳ අරුන්ධති ය. 8. සඟළාව

වීරයාගේ සැරසිල්ල සි. 9. නාරද තෙම සවාගියෙන් පොළවට බැස්සේ ය. 10. දෘෂියට මෙහෙසී කිපුණී ය 11. තෙපි ගම හැර නගරයට යවු. 12. උජ්ජයිනී නගරයෙහි ශිවපූජාවලදී සත්‍රීන් ගේ නෘත්‍යයෙක් වීය. 13. සෙනෙවියෝ සේනාවන් හා යුඛභූමියට පැමිණෙත් වා. 14. අපි දෙදෙන මෙහි ඉද පොත කියමෝ වා (කියමු.) 15. ඉන්ද්‍රාණීය ගේ පුත්‍රයා අසුරයන් හා යුඛකරන්ට නික්මිණ. 16. බමුණ, බිරින්දන් දෙදෙනා ගේ පරුෂ බස් ඇසූ යෙහි ද? 17. නුවණැත්තෙනි, සත්‍රීන්ට නො කිපෙවු. 18. නදීන්හි නෞකාවලින් යමෝ වා. 19. සත්‍රීන් දෙදෙනා ගේ ඇඟිලි වලින් මුදු වැටුණාහ. 20. දරුව වහා ගෙට දිව ගොස් පොතුත් පැනත් ගෙන එව. 21. තෙපි යහුරු ගෙනවුත් ගෙයි දොරවල් අරිවු. 22. මම සහායන් දුකින් මුදන්නට හැකි වෙම් වා.

24.

උකාරාන්ත සත්‍රීලිංගීය ශබ්ද.

ධෙනු. (එලදෙන)

	එ.	බ.	ඛ.
ප්‍ර.	ධෙනුඃ	ධෙනූඃ	ධෙනවඃ
සම්.	ධෙනෝ	,,	,,
ව්.	ධෙනුම්	,,	ධෙනූඃ
තෘ.	ධෙන්වා	ධෙනුභ්‍යාම්	ධෙනුභිඃ
චතු.	ධෙනවෙ, ධෙනවේ	,,	ධෙනුභ්‍යඃ
පං.	ධෙනෝඃ, ධෙන්වාඃ	,,	,,
ෂ.	,, ,,	ධෙන්වෝඃ	ධෙනූනාම්
ස.	ධෙනෞ, ධෙන්වාම්	,,	ධෙනුෂු

අභ්‍යාසය.

(අ) සිංහලයට නගනු.

1. ධෙනවො වත්සෙභ්‍යඃ ක්ෂීරං විතරන්ති. 2. ආවාං ධෙනෝඃ ක්ෂීරම්විඝාවඃ. 3 ශුකඃ චංචූවා ජම්බුං ගෘහීත්වා තරොඃ ශාඛායාමුපාවිශත්. 4. කුඤ්චූරී චංචූවාහරණ්‍යමුඩරති. 5. රජ්ජ්වා ධෙනුං බධ්වා ආනයම්. 6. ධෙන්වා පුරතඃ කුණ්ඩඃ පශ්‍යසි? 7. ශතද්‍රුං නදීං නෞභයා තරාම. 8. මනීෂාණාං තනයොඃ නිත්‍යඃ 9. ජනාසනාම්බුලං

හතෙන් නිගුහනති. 10. ගෘහපතයො විජෙහෙය්‍ය ධෙනු අසවජන්. 11. ධෙනොඃ ශෘඞ්ඝ පශ්‍ය. 12. කිං ත්වං ධෙනොඝතනාත් ක්ෂිරං පාතුමිශක්නොඃ?. 13. ආමෙලන මිශ්‍රිතං දුඞ්ඛං දධි භවති. 14 රජ්ජවා ගජං තරුවබධිනාද්ගජපාලඃ. 15. රාමඃ ලක්ෂ්මණශ්ච ශරෙඃ රාක්ෂසානාං හනූරදෘණීතාම්. 16 ධෙනුදීග්ධ්‍රෙ කුපිත්වා පාදෙන ප්‍රාහරත්. 17. කර්‍ෂිකාඃක්ෂෙත්‍රං කෘෂ්ට්වා විජාන්‍යවපන්. 11. දුෂ්ටො ව්‍යාධඃ ශරං ක්ෂිප්ත්වා ධෙනුම්මාරයත්. 19 කුමාරී ශාලාං ප්‍රවිශ්‍ය ගීතං ගීත්වා විණාමවාදයත්. 20. භූපතිඃ සෙනාභිඃ සාර්ධං රණභූම්ං ප්‍රවිශ්‍ය අරීන් ජිත්වා නගරං ප්‍රත්‍යාගචජත්. 21. ගොපාඅලා ග්‍රාමං ගත්වා ධෙනුමානීය ව්‍රජෙ අස්ථාපයත්. 22. භොතී දෙවී, සුධිඅෙ සත්‍රියෙ උපහාරං යචඡ. 23. සජජනා මුකතිං ප්‍රාප්තුං බුධං භජනතු. 24. දුරකො ධෙනුං බඞ්ධනාද් මොක්ෂ්තුං නා ශක්නොත්. 25. භිරුයෝධඃ සඃග්‍රාමං වෙෂ්ටුං නා ඛඃෂෙණාත්. 26. විනීතෙ භාසේ අත්‍රාගතත්‍ය වරාන් වෘණීතාම්.

(ආ) සංසකෘතයට නගහ්‍ය.

1. ගාලෙන් දෙනක ගෙනෙව. 2. දෙන ගේ පැහැය කළු ය. 3. දෙනුන් දෙදෙනා ගේ වස්ත්‍රන් ගේ පැහැය සුදුය. 4. තරුණ සත්‍රිහු ශරිරයන්හි ආභරණ දරුහ. 5. දෙනුන් දෙදෙනා ගේ කිරෙන් දරුවා පෙ ෂිත කරවු.-6 ඔරුවකට නැගී ෂතද්‍ර නදිය තරණය කළමු. 7. මහලු සත්‍රිය ගේ හනු දෙකෙහි පිළිකා දෙකෙකි 8. හුළු කැඳින් බඩගින්න සංසිදේද? 9. සොරු දෙදෙනා රාත්‍රියේ අවුත් වත්තට පිවිස ඇතින්න බඹුනයෙන් මිදුහ. 10. අපි මුව දෙන ව්‍යාඝ්‍රයා ගෙන් මුදන්නට නො හැකි වුමු. 11. රාජපුරුෂයා වනයට ගොස් සොරා අල්ලා ගෙන දංඩෙන් තළා ලනුවෙන් බැඳ නගරයට ගෙනායේ ය. 12. අලස ෂිෂ්‍ය තෙම පොත කියන්නට නො කැමතිවි ය. 13. රජු තෙම විහාරයට ගොස් බුදුහු දුක ප්‍රශනය විවාරා සැක දුරලි ය. 14. ආවාසීයා පාසැලෙහි පස් වන පඬිතියේ කන්‍යාවන් ගේ සමීප බව දැන සතුටු ව තැගි දුන්නේ ය. 15. රජුහු ගේ බොහෝ භටයෝ සතුරන් හා යුඩකොට රණබිමෙහි වැටුණාහ. 16. දශරථ තෙම රාමයා වැලඳ හඩා දේවියගේ අදහස හෙළි කෙළේ ය. 17. දේවී තොම පුත්‍රයා සිහි කොට ශෝක කළා ය. 18. තෝ ඉතෙනීම පිණිස පුත්‍රයන් කාශීපුරයට යව ව. 19. කවිහු රාම රජුගේ කිර්තිය දිශාවන්හි පතළ කෙරෙත් වා. 20. සත්‍රී විසිර ගිය කෙස්වැටිය අතින් බැන්දා ය.

25.

සත්‍රීලිංගික ඌකාරාන්ත ශබ්ද.

වධූ. (සත්‍රී)

	ඒ.	බ.	බ.
ප්‍ර.	වධූඃ	වධ්වෞ	වධ්වඃ
සම්.	වධූ	,,	,,
වි.	වධූම්	,,	වධූඃ
තෘ.	වධ්වා	වධූභ්‍යාම්	වධූභිඃ
ච.	වධ්වෙ	,,	වධූභ්‍යඃ
ප.	වධ්වාඃ	,,	,,
ෂ.	,,	වධ්වොඃ	වධූනාම්
ස.	වධ්වාම්	,,	වධූෂු

ස්‍රෑ ආදි ශබ්ද මීට වෙනස් ව වර තැබේ.

ස්‍රෑ (බැම)

	ඒ.	ඒ.	බ.
ප්‍ර.	ස්‍රෑඃ	ස්‍රෑවෞ	ස්‍රෑවඃ
සම්.	ස්‍රෑ	,,	,,
වි.	ස්‍රෑවම්	,,	ස්‍රෑඃ
තෘ.	ස්‍රෑවා	ස්‍රෑභ්‍යාම්	ස්‍රෑභිඃ
ච.	ස්‍රෑවෙ, ස්‍රෑයෙ	,,	ස්‍රෑභ්‍යඃ
ප.	ස්‍රෑවඃ, ස්‍රෑවාඃ	,,	,,
ෂ.	,,	ස්‍රෑවොඃ	ස්‍රෑවාම්, ස්‍රෑණාම්
ස.	ස්‍රෑවි, ස්‍රෑවාම්	,,	ස්‍රෑෂු

ස්‍රෑ, සුස්‍රෑ, චිරස්‍රූ ආදිය ස්‍රෑ ශබ්දය මෙනි.

56. සිංහලයෙහි යෙදෙන ඇ යි යන්න සංස්කෘතයට නැඟී මේදී ඉති යන්න යොදනු. පිතා ආගච්ඡති ඉති කුමාරෝ වදති. පියා ඒ ඇ යි ළමයා කියයි.

57. සමානස්වර එක් ව දීර්ඝ වේ. ආගච්ඡති + ඉති = ආගච්ඡතීති.

අභ්‍යාසය.

(අ) සිංහලයට නගනු.

1. වධූනාං පුරස්තාත් වෙථි ගච්ඡති තී ඝා අවදත්. 2. කව්වීර සුවාඃ වධවාඃ භාග්‍යං ශ්ලාඝෙකෙරවණීයත්. 3. වධූ රජ්ජවා ධෙනුං බධවා ආනයති තී අශ්‍රැණිම. 4. ප්‍රසුවාඃ වචනමණතීඝත් විනිතඃ පුත්‍රඃ. 5. සවඝ්‍රි ප්‍රසුවෙ. 6. වධවාඃ භ්‍රැවොමධ්‍යෙ රක්‍තං තිලක මාසිත්. 9. භූපස්‍ය වමූ යුඛාය රණභූමිං ප්‍රාවිශත්. 8. වම්වා සාඛිං වමූපතිනීගරාත් නිගීචඡතු. 9. මුනිඃ සරය්වාසනිරෙ වසතුමෙවඡත්. 10. වීරසූනාං සන්‍රිණාං කීර්තිඃ භුවි ප්‍රසරතු. වධවා භ්‍රැවෙව ශොභතෙ සතාඃ. 12. නෘපතිර්භුවඃ පාතා'සති. 13. භුවි ජන්‍තවඃ සුඛං ජීවන්තු. 14. බුධා වධූභ්‍යා න කුප්‍යන්ති. 15. වධෙවෙ උදූනං ගත්වා විශාලස්‍ය තරොඃ ශීතලායාං ඡායායාං ශිලායාමුපාවිශතාම්. 16. ජන්‍තවොා නිජාන්‍යපත්‍යානි කෘපයා පාලයන්තු 17. ශ්වශ්‍රූ ජාමාතරං දෘෂ්ට්වා ප්‍රිත්‍යාභිමුඛමයාත්. 18. වීරසුභ්‍යඃ සන්‍රිභ්‍යඃ කෘප උපහාරාත් යච්ඡති තී තෙ 'වදන්. 19. වධෙවාඃ පුත්‍රඃ පපාං ගත්වා තුඤ්ඩං ප්‍රක්ෂාල්‍ය ගෘහ මායාත්. 20. වීරයුවාඃ පුත්‍රොෂ ප්‍රභාතෙ උත්ථාය ගෘහස්‍ය අංගනෙ ව්‍යායාමමකුරුතාම්.

(ආ) සංස්කෘතයට නගනු.

1. ගොවියෝ දෙනුන් ලතුවලින් බැඳ ගමින් නුවරට ගෙන ගියහ. 2 සත්‍රියනී, තෙපි නගරයේ රථයෙන් යන්න ා කැමැත්ත හු ද? 3. කාශී නගරයෙහි කුලසත්‍රීන් ගේ සම්මේලනයෙක් වී. 4. දශරථ රජුහු ගේ අගමෙහෙසි වූ කෙකෙයී ගේ පුත්‍ර වූ රාම තෙම සීතා කුමරිය පාවා ගති 5. ලංකාවේ අධිපතිවූ රාවණ තෙම සීතා දෙවිය සොරා ගෙන් ආයේ ය. 6. මණ්ඩාදරී තොම සවකිය සැමියා වූ රාවණයා ගේ මළසිරුර සමීපයේ බිමැ වැටී හැඬි ය. 7. මුවැත්තියෝ දෙදෙන වැද්දු දැක තැති ගෙන වේගයෙන් දිවූහ. 8. සිබාඊ කුමාරයා ගේ දෙබැම මැද ඌණීරෝමය වී ය. 9. ගෘහ පතියා ගේ නැන්දු (අඹුවගේ මව) අමුත්තන්ට මිහිරි බොජුනෙන් සංග්‍රහ කළා ය. 10. සත්‍රිහු සිය සැමියන් ගේ සතුරන් දැක බැම හැකුලූහ. 11. තුෂිත පුරයෙහි බෝසත්හු ගේ සමීපයෙහි දෙවියෝ රැස්වැ වැද, දැන් මිනිස්ලොවට යන්නට කාලඃය එහි හොස් බුදුව ලෝකයා දුකින් මුදන්නැ 'සි කිහ. 12. මනා බැම ඇති කාන්‍ය, කොම පියාගේ සමීපයෙහි සිට ළදරුවනට රසකැවිලි දුන්නා ය. 13. වැසි දිය අහසින් පොළොවෙහි වැටී ගලා ගොස් නදීන් ද

වැව් ද පොකුණු ද පිරුණි ය. 14. මියෝ එක්රැස් වැ බලලා ගෙන් මිදෙනු පිණිස උපායක් සිතුහ. 15. සත්‍රීනි, සිය සැමියන් ගේ සිත නො රිඳවවු. 16. අනුවණ සත්‍රිහු මෙහි දී පව් රැස්කොට මරණින් මතු නිරය සේ වැටී බොහෝ දුක් විඳිති 17. තැන්දණියන් ගේ බාල පුත්‍රයා ගේ දෙබැම් ශෝභන වෙත්. 18 වීරපුතුන් වැදූ සත්‍රී දිනේ වා. 19. දිවියා එලඳෙන දැක නිතර ම වේගයෙන් නගුටය සේලවී ය. 20. රාවණයා ගෙන් සීතාව මුදාගන්නට ලංකාවට යන්නට තෙපි නිහීය වවු දැ? සි රාම නෙම වඳුරන් පිළිවිසී ය. 21. 'හටයෝ දෙදෙන මෙහි සිටිත්වා තෙපි ගොස් සෙනෙවියා බඳිවු යැ' යි සුරු රජුගේ ආඥාතියා උස් හඬින් කී ය.

26.

සඞ්ඛ්‍යාගණන සත්‍රීලිංගික ශබ්ද.

මාතෘ ශබ්දය.

විතියා බහුවචනයෙහි **මාතෘඍඃ** කියා වේ. අන් සියලු තන්හි **පිතෘ** ශබ්දය මෙන් වර තැගේ. 17 වන පාඩම බලනු.

දුහිතෘ නනාන්දෘ යන ශබ්ද මාතෘ ශබ්දය සේ වර නගනු.

සවසෘ ශබ්දයේ විතියා බහුවචනය **සවසෘඍඃ** කියා සිටී. සෙසු හැම තැන්හි **නෙතෘ** ශබ්දය සේ වර තැගේ. 17 වන පාඩම බලනු

අභ්‍යාසය.

(අ) සිංහලයට නගනු.

1. දුහිතා මාතුරනන්තිකේ' සති. 2. මාතා සවසුඃ භර්තාරමනජීඝත්. 3. මාතුර්භ්‍රාතා මාතෘමාතී. 4. මාතුඃ සවසා නගරමගච්ඡත් 5. මාතෘමභ්‍යඃ සවස්‍රෙ භොජනමයච්ඡ මි. 6. පිතා දුහිතුරග්‍රෑණ්‍ය මාජීත්. 7. දුහිතෘණාං ගානෙන මාතා පිතා වාතුෂ්‍යතාම්. 8. කුමාරස්‍ය මාතා ච භ්‍රාතරෞ ච භගිනීශ්වාත්‍රාවසන්. 9. භූපතිර්මාතෘකීලෙන ශත්‍රූන් ජයතීති තේ'වදන්. 10. පුත්‍රෝ දුහිතා ච පිත්‍රෙ මාත්‍රෙ වාඥාමයච්ඡතාම්. 11. සවශ්‍රූර්මාතරි අස්නිහ්‍යත්. 12. පිතුර්භ්‍රාතා පිතෘව්‍යඃ. 13. මාතරි දුහිතුඃ පරම ආදරෝ'ඝති. 14. තන්‍යාඤ්ච්භ්‍රාතරං රාජ පුරුෂා බධ්වා කාරාගාරමනයන්. 15. කවි වීරසුවෝ මාතුර්භාග්‍යං බහුනිඃ ශ්ලොකෛරවර්ණයත්. 16. කුමාරඃ

සුධියා තනතුළු සාමර්ථ්‍යං මාත්‍රෙ අනර්ථයන්. 17. පිතා දුහිත්‍රෙ ධවලෙ ධෙනු අයච්ඡත්. 18. පිතෘතා දුහිතා මාධ්‍යාහ්නං න දු නොති. 19. ස තනාන්දෘනිඃ සාධිං උපවනං ගත්වා තරොර්මූලෙ ඵලකෙ උපාවිශත්. 20. සවසුඃ ධෙනූශ්චාරා රාත්‍රාවාගත්‍ය අටවිමහරන්.

(ආ) සංස්කෘතයට නඟනු.

1. මව ගේ මව මුත්තනීයෝ ය. 2. මව ගේ සොහොයුරියෝ කොහි ඉයත් ද? 3. රජ තෙම පුතු වැලඳ මුසපත් වැ හිඳ වැළැසි. 4. අහල්‍යා තොම රාමයා දැක පාප විපාකයේ කෙළවරට පැමිණේ. 5. ණම තෙම ලක්‍ෂ්මණයා සමග විශ්වාමිත්‍රයා පෙරටු කොට නගර යෙන් පිටත් වෙයි. 6. මවට යවන්නට දුවරු දෙන්න ලියුම් දෙකක් ලියත්. 7. මව දුව වැලඳ ගනී. 8. මවගේ වචනයෙන් දුවරු නැගිට ගී ගයති. 9. රාම තෙම සොහොයුරිය දක්නට මස්සි නා ගේ ගෙට යෙයි. 10 සාම්‍යා ගේ සොහොයුරි නැනා ය. 11. දුවගේ සැමියා බැනා ය. 12. පියා දුවරුන්ට දෙන්නට ඇඟිලි මුද්‍ර දෙකක් දෙයි. 13. බැනා එළුදෙනුන් දෙන්න ගමට ගෙන යේ. 14. මම මව ගේ වචනයෙන් නගරයට ගොස් ලොකු පෙට්ටියකුත් දික් ලනුවකුත් ගෙනෙමි. 15. මම ගීතයන් නො දනිමි, කෙසේ ගයන්නට හැකි වෙමි ද?.

27.

සර්වනාම.

අස්මද් (මා)

	එක.	ද්වි.	බ.
ප්‍ර.	අහං	ආවාම්	වයම්
	(මම)	(අපිදෙදෙන)	(අපි)
ද්වි.	මාං	ආවාම්, නෞ	අස්මාන්, නඃ
	(මා)	(අප දෙදෙන)	(අප)
තෘ.	මයා, මම	ආවාභ්‍යාම්	අස්මාභිඃ
	(මවිසින්, මා කරණකොට)	(අප දෙදෙන විසින්, කරණකොට)	(අප විසින්, කරණකොට)
ච.	මහ්‍යම්, මෙ	ආවාභ්‍යාම්, නෞ	අස්මභ්‍යම්, නඃ
	(මට)	(අප දෙදෙනාට)	(අපට)
ප.	මත්	ආවාභ්‍යම්	,,
	(මගෙන්)	(අප දෙදෙනා ගෙන්)	(අපෙන්)

ෂ.	මම, මේ	ආවයෝඃ, නෞ	අස්මාකම්, නඃ
	(මගේ)	(අප දෙදෙනා ගේ)	(අප ගේ)
ස.	මයි	ආවයෝඃ	අස්මාසු
	(මා කෙරෙහි)	(අප දෙදෙනා කෙරෙහි)	(අප කෙරෙහි)

යුෂ්මත් (තා, නුඹ)

ප්‍ර.	ත්වං	යුවාම්	යූයම්
ද්‍වි.	ත්වාම්	යුවාම්, වාම්	යුෂ්මාන්, වඃ
තෘ.	ත්වයා	යුවාභ්‍යාම්	යුෂ්මාභිඃ
ච.	තුභ්‍යම්, තෙ	,, , වාම්	යුෂ්මභ්‍යම්, වඃ
ප.	ත්වත්	,, —	,,
ෂ.	තව, තෙ	යුවයෝඃ, වාම්	යුෂ්මාකම්, වඃ
ස	ත්වයි	,, —	යුෂ්මාසු.

මේ, නෞ, නඃ, තෙ, වාම්, වඃ යන පද පදයට පසුව මිස මූලට නො යෙදේ.

ගුරුඃ මේ,	මගේ ගුරුවරයා
ගුරුඃ තෙ,	තගේ ,,
ගුරුඃ නෞ,	අප දෙදෙනාගේ ගුරුවරයා
ගුරුඃ වඃ,	තොප ගේ ,,

'මේ ගුරුඃ' ආදී වශයෙන් යෙදුවොත් වැරැදි යි.

අභ්‍යාසය.

(අ) සිංහලට නගනු.

1. යාචකායාන්න දත්වා ගෘහං ප්‍රවිශ් 2. තව කිංකරා නදීං ගත්වා මුඛං ප්‍රක්ෂාල්‍ය ආගච්ඡන්. 3. ආවාං ආවයෝඃ හස්තෞ අලං කාරෛ ර්භූෂයිත්වා නෘත්‍යාය ගච්ඡාව. 4 වයමස්මාකං ක්ෂෙත්‍රාණි රක්ෂිත්වා උටජේෂු අවසාම. 5. රාත්‍රෞ මූෂකාවාගත්‍ය අන්‍යාං වා මාඤ්නිතාම්. 6. යුවයෝඃ පුත්‍රෞ ගිරිමාරොඩුං නාශක්නුතාම්. 7. මම සාරථිඃ තව රථෙන මාං තත්‍ර නයතු. 8. අස්මාකං පුත්‍රා ධනං වෝ' රක්ෂන්. 9. දුරුණෝ ව්‍යාධිස්ත්වාං දුනොතීති මම මතිඃ. 10. කිම්ගනිර්යුෂ්මාකං ග්‍රාම මදහත්? 11. පිතා ආවාභ්‍යාං සහ විහා රං ගත්වා බුබම් පූජයත්. 12. කිං යුෂ්මාකං දුහිතරෞ මත් ත්‍රස්‍ය තඃ. 13. ධනිකෝ ගෘහපතිසතුභ්‍යං ප්‍රභූතං ධනමයච්ඡදිති අහ ම්ශ්‍රැණවම්. 14. අස්මාකං පිතා මාතා ච අස්මාසු අස්නිහ්‍යතාම්. 15,

යුවාභ්‍යාං සාර්ධං ක්‍රීඩාඔහනං ගන්තු මිච්ඡාමි. 16. යුවයොර්දුහිත රෙණ කාමීං ගත්වා ආගච්ඡතාමිති තෙ වදන්ති. 17. එසි ශරාන් ක්ෂිප්තුං තවාරිනීඔෂෙණාත්. 18. ආවයොඃ මාතා භ්‍රතරශ්ච යුව යොඃ ස්නිහ්‍යන්ති. 19. තෙ ආවාං සංග්‍රාමාය නෙතුං යත්නමකුරු තාම්. 20. ලක්ෂමණෙ මම භගින්‍යාඃ නාසිකා මකාර්ෂීදිති රාවණෙ' වදත්.

(ආ) සංස්කෘතයට නගනු.

1. තාගේ දුවගේ බෙල්ලෙහි මල්දමක් අප ගේ පුත්‍ර තෙම දැමීය. 2. තොපගේ දෙන මම් මිළට ගනිම්වා ද?. (මිළට ගණුකු?) 3. අපගේ වත්තෙහි බොහෝ කෙසෙල්ගස් වැවෙත් 4. මගේ ෑන කුඹට දෙමි. 5 දංඩෙකින් පැහැර හෙතෙම කුඹේ දෙන බිමැ හෙලි ය. 6. මගේ දෙ බැම මැද තිලකය තබව (කරව) 7. තොප කෙරෙහි තොපගේ සහෝදරයෝ සෙනහ කරත් ද?. 8. සොරා රෑ හෙට පිවිස මා ලනුවකින් බඳින්නට තැත් කෙළේය. 9. එ ඝික්මුණු ළමයි දෙදෙන අප දූ ආසනයෙන් නැගිට ඉදිරි යට ආහ. 10. ඔබ දෙදෙනටම නමසකාර වේ වා. 11. අපගේ ගුරු වරුන්ට සෙත් වේ වා. 12. කුඹලාගේ දුවරු විණා වයන්නටත් ගී කියන්නටත් හැක්කෝ ද?. 13 පිපාසාව මා පෙළයි. දිය බොන්නට සමීපයේ ළිඳට යමි. 14. මගේ සහෝදරියෝ දෙදෙන කුඹෙ දුන් දෙන්නාම තැගි දෙකක් දුන්නෝ ද?. 15. පාඨශාලායෙහි ප්‍රථම පඞ්ක්තියෙහි ආසනවල ඉඳ ගන්නට ශිෂ්‍යයෝ නො කැමැති වූහ. 16. 'ලියුමක් ලියන්නට කැමැත්තෙමි, පැනත් කඩදාසියකුත් ගෙනෙ'වයි මම කුඹේ පුතාට කිමි. හේ මගේ වචනය නො කෙළේය. 17. අපේ ජන්මභූමිය ලඞ්කාව ය, සිංහල වූ අපේ ආදිම නායකයා විජය රජ ය, හේ සවකිය සේනාව හා ලංකාවට අවුත් යක්‍ෂයන් මැඩ මෙහි ආධිපත්‍යය ලැබී ය. 18. දෙවානම්ප්‍රියතිෂ්‍ය රජුහුගේ කාලයෙහි අශොක රජුගේ පුත්‍ර වූ මහීන්ද මහා ස්ථවර තෙම මෙහි වැඩ බුඩශාසනයී පිහිටුවී ය. 19. අපගේ මහා බෝධීන් හුගේ උත්පත්තිය වෙසක් පූර්ණපොහෝ දිනයෙහි ලුම්බිනී වන යෙහි විය. 20. දෙවියන්ගේ ද මනුෂ්‍යයන් ගේ ද අභිවාඩිය පිණිස එක් නිරුත්තර වීර පුරුෂයෙක් ලොව දීර්ඝ කාලයක ඇවැමෙන් පහළ වේ. ඒ බුදුරජතෙමේ කැයි තතුදන්නෝ කිහ. 21. හේරෝද් රජුගේ සමයෙහි බැත්ලෙහෙම් පුරයෙහි ජේසු තුමාගේ උත්පත්තිය වී ය 22. පාරසිදෙශයේ මිනිස්සු පෙර සොරොඇස්තර ඍෂිහු ගේ ධර්මය අනුව ක්‍රියා කළහ. 23. මගේ ව්‍යාඝ්‍රාසය රජ්ඉසුර පිණිස නො වේ. බුඩශාසනයාගේ සංරක්ෂණය පිණස මැ යැ සි කියා ගැමුණු රජ තෙම යුඩ පිණිස යාමට ප්‍රාසාදයෙන් බැස්සේ ය.

28.

සර්වනාම.

(මොහු තුන්ලිඟුයෙහි ම වර නැගෙත්.)

කිං ශබ්දය.

(මෙය කා ශබ්දය සේ සලකා වර නගනු.

පුල්ලිංගයෙහි

	එක.	බ.	බ.
ප්‍ර.	කඃ (කවරෙක්)	කෞ (කවරදෙදෙනෙක්)	කෙ (කවුරුහු)
ද්‍වි.	කම් (කවරකු)	කෞ (කවර දෙදෙනකුන්)	කාන් (කවුරුන්)
තෘ	කෙන (කවරහු විසින්)	කාභ්‍යාම් (කවර දෙන්නෙකුන් විසින්, කරණකොට)	කෛඃ (කවුරුන් විසින්, කරණකොට)
ච.	කස්මෛ (කවරකුට)	කාභ්‍යාම් (කවරදෙන්නකුට)	කේභ්‍යඃ (කවුරුනට)
ප.	කස්මාත් (කවරකුගෙන්)	කාභ්‍යාම් (කවර දෙදෙනකුන්ගෙන්)	කේභ්‍යඃ (කවුරුන්ගෙන්)
ෂ.	කස්‍ය (කවරකු ගේ)	කයෝඃ (කවර දෙදෙනකුන්ගේ)	කේෂාම් (කවුරුන්ගේ)
ස.	කස්මින් (කවරකු කෙරෙහී)	කයෝඃ (කවර දෙදෙනකුන් කෙරෙහි)	කේෂු (කවුරුන් කෙරෙහි)

නපුංසක ලිංගයෙහි

ප්‍ර.	කිම් (කිමෙක්)	කෙ (කුමක දෙකක්)	කානි (කුමක ද)
ද්‍වි.	කිම් (කුමක්)	කෙ (කවර දෙකක්)	කානි (කුමක ද)

සෙස්ස පුංලිංගයෙහි මෙනි

සත්‍රී ලිංගයෙහි

	එ.	වි.	බ.
ප්‍ර.	කා	කෙ	කාඃ
වි.	කාම්	,,	,,
තෘ.	කයා	කාභ්‍යාම්	කාභිඃ
ච.	කස්‍යෛ	,,	කාභ්‍යඃ
ප.	කස්‍යාඃ	,,	,,
ෂ.	,,	කයෝඃ	කාසාම්
ස.	කස්‍යාම්	,,	කාසු

'කා කවර තැනැත්තියක්, කෙ කවර තැනැත්තියෝ දෙදෙනෙක්, ආදි වශයෙන් අර්ථ ගත යුතු. උදාහරණ.

මේ අන් නාමයනට විශෙෂණ ව ද යෙදේ.

කඃ පුරුෂඃ?	කවර පුරුෂයෙක්ද?
කා ස්‍ත්‍රී?	කවර ස්‍ත්‍රීයක්ද?
කිං ඵලං?	කවර ඵලයෙක්ද?
කස්‍ය පුරුෂස්‍ය?	කවර මිනිසකු ගේ?
කස්‍යාඃ කන්‍යායාඃ?	කවර කන්‍යාවක ගේ?
කස්මින් නගරෙ?	කවර නගරයෙක?
කෙෂු නරෙෂු?	කවර ගස් වලැ?

තත් ශබ්දඃ.

පුල්ලිංගයෙහි

ප්‍ර.	සඃ	තෞ	තෙ
වි.	තම්	,,	තාන්
තෘ.	තෙන	තාභ්‍යාම්	තෛඃ
ච.	තස්‍යෛ	,,	තෙභ්‍යඃ
ප.	තස්මාත්	,,	,,
ෂ.	තස්‍ය	තයෝඃ	තෙෂාම්
ස.	තස්මින්	,,	තෙෂු

නපුංසක ලිංගයෙහි

ප්‍ර.	තද්	තෙ	තානි
වි.	තද්	,,	,,

සෙස්ස පුල්ලිංගයෙහි මෙනි.

සත්‍රී ලිංගයෙහි.

ප්‍ර.	සා	තෙ	තාඃ
වි.	තාම්	,,	,,
තෘ.	තයා	තාභ්‍යාම්	තාභිඃ
ච.	තස්‍යෛ	,,	තාභ්‍යඃ
ප.	තස්‍යාඃ	,,	,,
ෂ.	,,	තයොඃ	තාසාම්
ස.	තස්‍යාම්	,,	තාසු

සඃ හෙතෙම, **සා** ඕතොම, **තත්** එය ආදී වශයෙන් අර්ථ යුතු.

මොව්හු විශෙෂණ ව ද සිටිත්. **සඃ පුරුෂඃ** එ මිනිසා, **සා සත්‍රී** ඒසත්‍රී, **තත් ඵලං** ඒ ගෙඩිය, **තස්මින් වෘක්ෂෙ** එ ගසෙහි, **තාසු නදීෂු** එ නදීන් හි, **තෙෂු වනෙෂු** ඒ කැලෑවල.

එතත්ශබ්දය.

පුල්ලිංගිඝ ප්‍රථමා ඒකවචන යෙහි **එෂඃ** යයි ද, සත්‍රීලිංගික ප්‍රථමා ඒක වචනයෙහි **එෂා** යැයි ද, සිටී. සෙස්ස **තත්** ශබ්දයේ මෙනි.

යත් ශබ්දය.

පුල්ලිංගයෙහි

ප්‍ර	යඃ	යෙෂු	යෙ
වි.	යම්	,,	යාන්

නපුංසක ලිංගයෙහි

ප්‍ර.	යද්	යෙ	යානි
වි.	යද්	,,	,,

සත්‍රී ලිංයෙහි

ප්‍ර.	යා	යෙ	යාඃ
වි.	යාම්	,,	,,

සෙස්ස තත් ශබ්දයේ මෙනි.

මොව්හු විශෙෂණ වශයෙන් ද යෙදෙති.

යඃ පුරුෂඃ යම් මිනිසෙක්, **යස්මාත් ග්‍රාමාත්** යම් ගමෙකින්, **යස්‍ය පුරුෂස්‍ය** යම් පුරුෂයකුගේ **යස්‍යාඃ සත්‍රියාඃ** යම් සත්‍රියක ගේ.?

යත් ශබ්ද යෝගය.

යස්‍ය එෂ පුත්‍රඃ සෝ මම ග්‍රාමඃ. මෙ තෙම යම්කුගේ පුතෙක් නම් එ තෙම මගේ සොකොයුරුය.

යස්‍යාං නද්‍යාං ස ස්නාති සා යමුනා. යම් නදියෙක හේ නා ද ඒ යමුනාව යි.

යස්මාත් ච මාව්‍රජසි ස මම ග්‍රාමඃ. යමෙකින් තෝ එන්නෙහි නම් එය මගේ ගමය.

යෂ්ෂෙම ච්වං පුණ්‍යකර්මයව්‍රජඃ ස මම ග්‍රාමඃ. යමකුට තුඹ පොත දුන්නෙහි ද ඒ මගේ සොහොයුරු ය.

සර්‍වනාමයෝ තුන් ලිඟුයෙහි ම වර නැගෙත්.

සර්‍ව (සියල්ල)
පුල්ලිඟයෙහි

	එ.	බ.	බ.
ප්‍ර.	සර්‍වඃ	සර්‍වෞ	සර්‍වෙ
සම්.	සර්‍ව	,,	,,
ව්.	සර්‍වම්	,,	සර්‍වාන්
තෘ.	සර්‍වෙණ	සර්‍වාභ්‍යාම්	සර්‍වෛඃ
ච.	සර්‍වස්මෛ	,,	සර්‍වෙභ්‍යඃ
ප.	සර්‍වස්මාත්	,,	,,
ෂ.	සර්‍වස්‍ය	සර්‍වයොඃ	සර්‍වෙෂාම්
ස	සර්‍වස්මින්	,,	සර්‍වෙෂු

නපුංසක ලිංගයෙහි.

ප්‍ර. බ්.	සර්‍වම්	සර්‍වෙ	සර්‍වාණ්

සෙසු තැන් පුල්ලිඟ හා සම යි.

ස්ත්‍රී ලිංගයෙහි.

ප්‍ර.	සර්‍වා	සර්‍වෙ	සර්‍වාඃ
සම්.	සර්‍ව	,,	,,
ව්.	සර්‍වාම්	,,	,,
තෘ.	සර්‍වයා	සර්‍වාභ්‍යාම්	සර්‍වාභිඃ
ච.	සර්‍වස්‍යෛ	,,	සර්‍වාභ්‍යඃ
ප.	සර්‍වස්‍යාඃ	,,	,,
ෂ.	,,	සර්‍වයොඃ	සර්‍වාසාම්
ස.	සර්‍වාස්‍යාම්	,,	සර්‍වාසු

විඤ, කතර, කතම, එකතර, අන්‍ය, අන්‍යතර, ඉතර, යන මොහු සඒ ශබ්දය මෙනි. එහ ශබ්දය ද සඒ ශබ්දය මෙනි, එහෙත් වරනැගෙනුයේ වි වචනයේ පමණි.

යත්, කිම් යන ශබ්ද ද සඒ ශබ්දය මෙනි. ය, ක ශබ්ද මෙන් සලකා වරනගනු. කෑ, කෙෑ, කෙ, කෑ, කෑ, කෙ ආදී වශයෙනි.

56 පූර්ව ශබ්දයේ පුල්ලිංගික සප්තමී විභක්ති ඒකවචනයෙහි පූර්වේ කියා රූපයෙකුත් වේ. සෙසු හැම තැන්හි ම සඒ ශබ්දය මෙනි. අවර, දක්ෂිණ, උත්තර, අපර, අධර යන මොහු පූර්ව ශබ්දය මෙනි.

(අ) සිංහලයට නගනු.

1. ආවාමෙතෙන රථෙන ගෘහං ගච්ඡාවඃ. 2. එෂ නාවිකඃ තයා සෙෂපණ්‍යා එතාං නෞකාං ක්‍රීණාති. 3. ස සාරථිඃ තයා සහ තෞ අශ්වෞ තාඩයති. 4. පශ්‍යත භෙ පුත්‍රාඃ, එතස්මින් වෘක්ෂෙ සර්‍වාඃ ලතාඃ පුෂ්පෙෂු ලීඝන්ති. 5. තාඃ අස්මාකං ධෙනවඃ ප්‍රතිදිනං තාසාං වත්සෙභ්‍යඃ ක්ෂීරං විතරන්ති. 6. එතස්‍ය තරොඃ ශාඛාභ්‍යඃ පණ්ඩානි ච ඵලානි ච අපතන්. 7. පශ්‍ය, බීජාත් එෂ අංකුරඃ ප්‍රරොහති. 8. මම පාත්‍රාත් ජලමස්‍රවත්. 9. තව එෂා ධෙනු ර්‍ත්‍යාස්‍රාදත්‍රස්‍රත්. 10 අපි පශ්‍යථඃ, ස චොරඃ තස්මාත් තරොරවරොහති. 11. මම දුහිතා තස්‍යාඃ භර්තුර්ගෘහමගච්ඡත්. 12. තව මාතා යස්‍යාඃ කන්‍යායාඃ අශ්‍රෞණීත් සා මම අනුජා භගිනී. 13. එතෞ බාලෞ ගුරොරාශ්‍රමං නානුසරතඃ. 14. පුත්‍ර, ගෘහං ගත්වා මම දුහිතරං ජාමාතරං ච ආනය. 15. ශිශවඃ තෙෂාං මාතෘණාං ශාතෙන තුෂ්‍යන්ති. 16. කිං ශ්‍රූයතෙතස්‍යාඃ ධෙනොඃ ක්ෂීරම්වක්ථඃ? 17. ස කාකඃ චංච්වා මාංසඛණ්ඩමෙකං ධෘත්වා ආගම්‍ය තස්මින් වෘක්ෂෙ එකස්‍යාං ශාඛායා මුපාවිශත්. 18. ඉදානීං වර්ෂාකාලඃ, තස්මාදෙතාසු වාපිෂු බහවොඃ මණ්ඩූකා රාත්‍රෞ උච්චෛඃ රටන්ති. 19. යා අත්‍ර වීණාං වාදයති සා මම ජාමාතු ර්දුහිතා ඉති ජානීහි. 20. ඝණ්ටායාඃ සවරං ශ්‍රුත්වා ගුරුරපෘච්ඡත් "කොඃ නු ඝණ්ටාං වාදයති" ති. 21. කස්ත්වාං ගීතං ශික්ෂයති ති ආවාභ්‍යාං මාමපෘච්ඡත්. 22. මම ජ්‍යෙෂ්ඨොඃ භ්‍රාතා මාං තං ශික්ෂයතීති අහම වදම්. 23. කා එතාං පෙටිකාමව්වාණොත්?. 24. යුවාමාකාශමූලෙොක්‍යා කිම්දෘනීං කුරුථඃ?. 21. ආවාං නක්ෂත්‍රාණි ගණයාවඃ, කිනතු තානි ගණයිතුං න ශක්නුවඃ ඉති තා වවදතාම්. 26. භ්‍යඃ

මම අග්‍රජ එකාං අජාං දණ්ඩෙන අතාඩයදිති එතාං වතීං සඩසා ගෘහං ගත්වා පිත්‍රෙ අකථයත්. 27. තස්මින් චූතතරොෂ බහුන් කපීන් දෘෂ්ටවා තාන් ලක්ෂීකෘත්‍ය වයස්‍යුපලාන් ප්‍රාක්ෂිපාම්. 28. තෙ කපයඃ කුපිත්වා චූතඵලාන්‍යවචිත්‍ය අසමාන් ප්‍රති ප්‍රාක්ෂිපන් 29. පිතා පුත්‍රෙණ ආහූය එකසෙම එකං රෞප්‍යපතං ඉතරසෙම අඩී රෞප්‍යකාංව දත්වා අකථයත් 'ගච්ඡතම්, විපණීං ගත්වා යද්වසතු ඉච්ඡථඃ තත් ක්‍රීත්වා ආනායතම්' ති. 30. තෙ කන්‍යෙ එකං දීප මානීය තං ප්‍රස්ථාල්‍ය එකස්‍ය ඵලකස්‍යොපරි සංසථාප්‍ය තස්‍ය සමීපෙ පීඨයොරුපවිශ්‍ය පුස්තකෙ අපඨතාම්.

2. සංස්කෘතයට නගනු.

1. අපි අපේ උයනට ගොස් ක්‍රීඩා කොට ගේත් නා ගෙට අවුත් කෑම කා මේ ශාලායෙහි නාත්‍යය දක්නට ආයෙමු 2. 'මෙ බර උසුලන්ට මම නො හැක්කෙමි' යි කියා ඒ මිනිසා බර බිම තබා ගෙදරට ආපසු ගියේය. 3. ළමයිනි, අද සවස අපි අර (ඒ) වනයෙහි අසපුවට ගොස් තවුසා දැක වැඳ එමු. 4. යමෙක් බාල වියෙහිදී ශුද්ධෝදන රජුට ශාක්‍යය ඉඟැන්වී ද ඒ අසිත තෙම පසු කාලයෙහි එ රජුගේ උයනෙහි වැස තවුස් දම් කෙළේය. 5. සිද්ධාර්ථ කුමාර තෙම යම් මවකගේ පුතෙක් වී ද, එ මායා දේවී තොම එ කුමරුගේ උත්පත්තියෙන් සත් වන දිනයෙහි පෘථිවිය හැර සවර්ගියට පැමිණියා ය. 6. ප්‍රජාවති දෙවි ඇගේ නංගී ය. ඕ සිඛාර්ථ කුමරහු පුත්‍රස්ථානයෙහි තබා පෝෂිත කළාය. 7 බාල වියේදී සජීමිත්‍ර බ්‍රාහමණ තෙම සිදුහත් කුමරුට ශිල්ප ද ශාස්ත්‍ර ද ඉගැන්වියැ යි නාගසේන සථවිර තෙමේ කී ය. 8. ශුප්‍රබුද්ධ රජුගේ යම් දුවක් වූ ද, එ යශෝධරා තොම එ සිද්ධාර්ථ කුමාරයාගේ භාර්‍යා වූවාය. 9. පස්වන ජෝර්ජ් නාපතිහුගේ යම් මුත්තනියක් වූ ද, ඒ වික්ටෝරියා රජනී කොමෝ එ සමයෙහි සියලු බ්‍රිතාන්‍ය අධි රාජ්‍යයෙහි පාලිකාව වූ ය. 10. අශෝක රජුගේ යම් අසන්ධිමිත්‍රා නම් දේවියක් වූ ද, ඇගේ ආඥයෙන් රාජපුරුෂයෝ ගොස් බෝධි වෘක්ෂය වැනසූහ. 11. යම් වැවෙක බොහෝ පිපුණු නෙළුම් මල් දකිම් ද ඒ වැවට ගොස් නාන්නට මම කැමැත්තෙමි. 12 යම් සත්‍රීන් දෙදෙනාකුන්ගේ සැමියන් දෙදෙනා රාජපුරුෂයෝ යදමින් බැඳ ගෙන ගියාහු ද, රජ තෙම ඒ සත්‍රීන් දැක අනුග්‍රහ කොට 'මොවුන් මුදවුඇ' යි එ රාජ පුරුෂයනට අන කෙළේය. 13. එ දෙනු වරෙහි ජන ගෝ එක් තැනෙක රැස් ව උත්සව කළහ 14. යම් ශාවකයන් දෙදෙනකුන්ට අද තෙපි ආහාර දුන්නහු ද, ඔවුහු අවුත් ඒ ප්‍රවෘත්තිය කියා මගෙන් (මා) ද වසත්‍ර දෙකක් ඉල්ලූහ. 15. යම්

මාලාවන් දෙනක් මගේ සහෝදරියෝ දෙදෙන ගෙතුහු ද, ඒවා සරණ නොට ගෙන ඔව්හු බොහෝ මුදල් ලැබූහ. 13. මේහි එක් මැලෙක් දිග ය, අනෙක කොට ය. මේ දිග වැලෙහි බොහෝ ශෝභන මල් ය. මට මේ මල දෙන්නට කැක්කෙහි ද? 17. යම් සඳෙක් රාත්‍රියෙහි සිය සඳරැසින් පෘථිවිය හොබවා ද, නේ නක්ෂත්‍රයන් ගේ අධිපතියැ යි කව්හු කියත්. 18. මේ පෘථිවිය ද අහස් සියලු ග්‍රහයෝ ද සූර්‍යයා වටේ යෙති යි ශාස්ත්‍රඥයෝ කියත්. 19. යම් ගසෙකින් නුඹේ පුතා වැටුණේ ද, ඒ ගස මම පොරොවෙන් නපා හෙළිමි. 20. යම් ගුහායෙකු එළු දෙනක් හා පැවවු වූහු ද, දිවියා හිවලකුත් සමග එහි ගොස් බවුන් ගේ කථාව අසා බිය ගෙන ආපසු දිව්ය. 21. ඒ සාවාගේ වචනය අසා සිංහ තෙම ඌකුණ කරා අවුත්, එය එබී බලා, සවකිය පිළිබිඹුව දැකැ අන් සිංහයෙකැ යි සිතා කිපී එහි පැන්නේ ය. 22. අපව රජකු දුන මැනවැ යි එක් කාලෙක මැඩියෝ වාහස්පතීහු ඇදුහ. 23. හෙතෙම 'මේ තොපගේ රජයැ යි කියා කොට කැබෙල්ලක් වතුරෙහි ලූයේ ය. 24 මගේ එක් ගොහොයුරියක ගේ සැමියා පාඨශාලායෙහි ශිෂ්‍යයනට ව්‍යාකරණ උගන්වයි, අනෙකියගේ සැමියා එක් ප්‍රවෘත්ති පත්‍රයෙක සංස්කාරකයෙක් ය.

අභ්‍යාසය.

(ඉ). සිංහලයට නගනු.

1. අපි යුවාං තත් නගරං ගත්වා ධාන්‍යං ක්‍රීණීථඃ. 2. සඃ ශාලාසත්‍කාං කුක්කුටීං හත්වා දන්තෛර්දශති. 3. ආවාමේ තස්මින් පංජරේ එතාන් ශුකාන් සංස්ථාප්‍ය පූරයිෂ්‍යාවඃ. 4. ආවාමේ තං ගිරිමාරොඪුං ශක්නුවඃ. 5. තෞ කුමාරෞ තමහිං උභාභ්‍යාං දණ්ඩාභ්‍යං තාඩයතඃ. 6. එතෙ ශිශවඃ තෙෂු වෘක්ෂෙෂු තාන් කපීන් දර්‍ශයන්ති. 7. නෘපතිරේතාභ්‍යාං සෙනාපතිභ්‍යාං කුප්‍යති. 8. තා එතසෛම අතිථයෙ' න්නං දත්වා සනාතුං තාං නදීං ප්‍රයාන්ති. 9. තමඃ සමේහ්‍යා බුබුධෙහ්‍යඃ. 10 තෙ චොරා නගරෙ සමේෂාං ගෘහපතීනාං ගෘහාන් ප්‍රවිශ්‍ය ධනං මුෂ්ණන්ති. 11, එතෙන දූසෙන සාර්ධං තස්‍ය යාවකස්‍ය කලභෝ'ස්ති. 12. වයං එතස්‍ය මුනෙරාශ්‍රමං ද්‍රෂ්ටුං ගච්ඡාමඃ. 13. සර්‍වාන් ජනාන් ප්‍රෙතුමේකොා න ශක්නොති 14. කොා ගෘහපතිනා සාර්ධං එතෙන රථෙන තස්මින් නගරෙ යාතු මිච්ඡති? 15. කස්‍යාඃ දෙවත්‍යාඃ පුත්‍රොා නෘපතිං වරං වෘණීතේ?

16 තයොර්ගිඩෝඃ ශිඛරාභ්‍යාං මෘගෞ පතතඃ. 17. එෂ කුමාරඃ උභාභ්‍යාං හස්තාභ්‍යාං ශිලාං උඩෘත්‍ය දර්ශයති. 18. කෙ තාඃ වාතීඃ ජානන්ති. 19. කඃ සංග්‍රාමං ගත්වා එතෂ්‍ය නෘපතෙරරිභිඃ සහ යොද්ධුං ධෘෂ්ණොති? 20. බුධස්‍ය ඝජීන් ගුණාන් සම්‍යඃ වර්ණයිතුං කඃ ප්‍රභවති. 21. තෞ කාශෞ පුරුෂෞ තසමාත් තුංගාත් තරොඃ පතතඃ. 22. ඉදානීං වාජෙටිඃ පතන්ති, සමේ ජනාඃ ස්වියාඃ ඝජීඃ කාතය සත්‍යක්ත්වා ගෘහාන් ගච්ඡන්ති.

(ආ) **සංස්කෘතයට නඟන්න.**

1. එක් කුඩා කුරුල්ලෙක් මේ ගසේ මිහිරි (ගඩින්) නාද කරයි. 2. පින් මද වූ අර ගොවියාගේ දුම්ල එලදෙන එක් දිවි යෙක් අල්ලාගනී. 3. එ සත්‍රීහු දෙදෙන සවකිය දුෂට කල්පනා හෙලි නො කරති. 4. ඒ කවි තෙම කවර රජකුගේ ගුණයක් වණා ද? 5. මේ ළමයාගේ දරුණු ලෙඩ ඒ තරුණ වෙද තේ බෙහෙදෙකින් සංසිඳේ. 6. මේ මෝඩ කෙල්ල අර පොකුණෙහි පිරිසිදු දියෙන් සිය කිලිටු මුහුණ සෝදන්නට නො කැමතිවී. 7. සියලු සතුන් කරා මාර තෙම ඒ යැ සි රියදුරුගේ වචනය අසා කුමාරතෙම උයනේ ක්‍රීඩා හැර නුවරට ආපසු යෙයි. 8. සමහර වෘක්ෂවල ගෙඩි නැත. 9. කවුරු මේ උයනෙහි ගස්වල සියලු මලුත් සියලු ගෙඩිත් රාත්‍රියෙහි අවුත් කඩත්ද? 10. සවාමීනි, අර වනයෙන් රාත්‍රියෙහි බොහෝ වදුරෝ අවුත් මේ වැල්වල සියලු දලු කති. 11. අපි මෙ අපිරිසිදු දියෙන් අත් සෝදන්ට නො කැමැත්තමු. 12. මේ ඇඟිල් දි සමඟ බත් කන් නට කවරෙක් කැමැත්තේ ද? 13. ඒ දුගී පුරුෂයාගේ එක් ඇසක් අන්ධය, අනිත් ඇස ද රෝගයෙක් පෙළයි. 14. මේ මී පැණි පිරිසිදු නැත. 15. ඉෝ මෙ කසයෙන් ළමයාට තළනි ද? 16 අපි මේ දම් වැල් වලින් බිල්ලන් බඳිමු 17. අර සහෝදර යාගේ වචනයෙන් කිපුණු මෝඩ ලදුරිය පියාගේ සමීපයට වේග යෙන් යෙයි. 18. මෙ යතුරින් පෙට්ටිය අරින්නට හැකි වෙයි ද? 19. ඍෂිහු කෙරෙහි මෙ නුවර සියල්ලන්ගේ අවල භක්තියෙක් වේ. 20. මෙ කුඩා නැවින් එ නදිය තරණය කරන්ට හැක්කහු ද? 21. මෙ එලදෙනට කවරෙක් තෘණ දෙයි ද? 22. ඒ පුරුෂ යාගේ දකුණු බැමෙහි ව්‍රණයෙක් ඇත්තේ ය. 23. මේ ඔහුගේ මව ය, ඒ මැගේ පියා ය. 24. මේ ලිදුම් දෙක දුවරුන් දෙන් නාට යවමි. 25. සැමියා ද, භාර්‍යාව ද, දුවරු දෙන්නා ද, පුතා ද යන මෙ සියල්ලෝ එක් නැවෙක නැගී මුහුදු තරණය කරත්.

29.

සර්වනාම.

ඉදම් (මේ)
පුල්ලිඟයෙහි.

	එ.	ව.	බ.
ප්‍ර.	අයම්	ඉමෞ	ඉමෙ
ද්‍ව.	ඉමම්	,,	ඉමාන්
තෘ.	අනෙන	ආභ්‍යාම්	එභිඃ
ච.	අස්මෙ	,,	එභ්‍යඃ
ප.	අස්මාත්	,,	,,
ෂ.	අස්‍ය	අනයොඃ	එෂාම්
ස.	අස්මින්	,,	එසු

නපුංසක ලිංගයෙහි

ප්‍ර.	ඉදම්	ඉමෙ	ඉමානි
ද්‍ව.	,,	,,	,,

ශෙස්ස පුල්ලිඟයෙහි මෙනි.

ස්ත්‍රී ලිඟයෙහි.

ප්‍ර.	අයම්	ඉමෙ	ඉමාඃ
ද්‍ව.	ඉමාම්	,,	,,
තෘ.	අනයා	ආභ්‍යාම්	ආභිඃ
ච.	අස්‍යෙ	,,	ආභ්‍යඃ
ප.	අස්‍යාඃ	,,	,,
ෂ.	,,	අනයොඃ	ආසාම්
ස.	අස්‍යාම්	,,	ආසු

ආඛ්‍යාත.

විධි ලිඬ
පරස්මෙ පද ප්‍රත්‍යයයෝ.

	එ.	ව.	බ.
ප්‍ර.	යාත්	යාතාම්	යුඃ
ම	යාස්	යාතම්	යාත
උ.	යාම්	යාව	යාම

57 අකාරාන්ත අංගයන්ට පරව සිටි යාත් ආදීන්ගේ යා යන්න ඒ යන්නෙක් වේ. යුෂ් විඛත ඒෂුඃ කියාද, යාම් විඛත ඒයම් කියාද වෙනස් වේ.

උදාහරණ:-

ගවේ†ඊත්=ගවෙෂත්
ගවේ†ඊයුඃ=ගවෙෂ්‍යුඃ
ගවේ†ඊයම්=ගවෙෂයම්
} අංක 49 සන්ධි විධිය බලනු.

ගවේ (අකාරාන්ත අංග.)

	එ.	ඒ.	බ.
ප්‍ර.	සඃ ගවෙෂත්	තෞ ගවෙෂතාම්	තෙ ගවෙෂ්‍යුඃ
ම.	ත්වම් ගවෙෂඃ	යුවාම් ගවෙෂතම්	යූයම් ගවෙෂත
උ.	අහං ගවෙෂයම්	ආවාම් ගවෙෂව	වයං ගවෙෂම

58 අවි. සඃ ගවෙෂත්, ඔහු යාවූතු, ඔහු යකොත් මැනවි, හේ යේවා, ඔහු යනවා ඇත.
කිං ස ගවෙෂත්? කිම හේ යන්නේ ද?

ත්වං ගවෙෂීඃ නුඹ යා යුතු (තෝ යව),
නුඹ යන්නැ

යදි ඉවෂසි තත්‍ර ත්වං ගවෙෂඃ කැමැති නම් නුඹ එහි යන්නැ.

ත්වං ගවෙෂඃ ඔබ වඩිනු මැනවි, තෝ යෙහි වා.

මේ නයින් අන් පදවල ද අවි ගත යුතු.

ක්‍රීණා (නා කාරාන්ත අංග.)

	එ.	ඒ.	බ.
ප්‍ර.	ජානීයාත්	ජානීයාතාම්	ජානීෂ්‍යුඃ
ම.	ජානීයඃ	ජානීයාතම්	ජානීයාත
උ.	ජානීයාම්	ජානීයාව	ජානීයාම

ශෘණු (උකාරාන්ත අංග)

ප්‍ර.	ශෘණුයාත්	ශෘණුයාතාම්	ශෘණුයුඃ
ම.	ශෘණුයාඃ	ශෘණු යාතම්	ශෘණුයාත
උ.	ශෘණුයාම්	ශෘණුයාව	ශෘණුයාම

කෘ (කුරු) [විශෙෂ රූප]

ප්‍ර.	කුර්‍යාත්	කුර්‍යාතාම්	කුර්‍ව්‍යුඃ
ම.	කුර්‍යාඃ	කුර්‍යාතම්	කුර්‍යාත
උ.	කුර්‍යාම්	කුර්‍යාව	කුර්‍යාම

යා (අකාරාන්ත අංග)

ප්‍ර.	යායාත්	යායාතාම්	යායුඃ
ම.	යායාඃ	යායාතම්	යායාත
උ.	යාතාම්	යායාව	යායාම.

අභ්‍යාසය.

(අ) සිංහලට නඟනු.

1. සාධ්‍වීමං න ත්‍යජෙත්. 2. යතෙනන ශිෂ්‍යාන් පාඨයෙත්. 3. හෙ පුත්‍ර, අහිතං නාවරෙඃ. 4. පුරුෂ ඉදානීං ජලං න පිබෙත්. 5. කථං තෙ බාලාඃ සර්‍වාන් ජනාන් නිඝෙඳ්‍යුඃ. 6. තාඃ සත්‍රියඃ සත්‍යං බොධෙය්‍යුඃ. 7. කිමර්‍ථං යුවාමසමාකං පුස්තකානි මූෂෙතම්? 8. රාමස්‍ය සකාෂාත් චොරඃ ඝර්‍මරං ඝවෙෂත්. 9. සෙනිකෙඃ සාකමිදානිමෙවාහං යුඛාය ඝවෙෂියම්. 10. තෙ ශිෂ්‍යා ගුරොඃ සමීපෙ තිෂ්ඨෙය්‍යුඃ 11. මම පුත්‍රාඃ තෙෂාං මිත්‍රෙඃ සඛ කන්දුකෙන ක්‍රීඩනතු. 12. විනීතඃ ශිෂ්‍යො ගුරොඃ පාත්‍රාත් න පිබෙත්. 13. අග්නි සතද් වනං දහෙත්. 14. තස්‍ය ගිරෙඃ ශිඛරාත් තෙ සර්‍පේ මෘගාඃ පතෙය්‍යුඃ 15. අහං තස්මින් අරෙෂ ඉමං බාණං මුඤ්චෙයම්. 16. බුධඃ ක්‍රොධමක්‍රොධෙන ත්‍යජෙත්. 17. අහං සත්‍යෙනාලිකං ජයෙයම්. 18. සත්‍යං භනෙත්, න ක්‍රුධ්‍යෙත්. 19. හෙ පුත්‍රාඃ, භෘංගානාං සමීපං මා ඝවෙඡත; තෙ දශෙය්‍යුඃ 20. ලවනං ශුකාය න යචෙඡත්. 21. හෙ පුත්‍රෙෂ, යුවාම් ප්‍රති දිනං බුධං පූජයෙතම්. 22. යෙ ධනමිච්ඡන්ති තෙ උතසාහං න ත්‍යජෙය්‍යුඃ. 23. යෙ සුඛං වාංඡන්ති තෙ අසාධූනාං සංසර්‍ගං පරිහරෙය්‍යුඃ. 24. හෙ පුත්‍ර, ආලස්‍යං පරත්‍යජෙඃ. 25. ක්‍රොධං යතෙනන වර්‍ජයෙත්.

(අ) සංස්කෘතයට නගනු.

1. ඔහු දැන් කඳුලු බුදනවා ඇත. 2. දරුව නැතිවුව, ඇස් හරුව. 3. මේ ෑස්සෝ තෙලුම් මල් වලින් මේ පැණි එක්කාසු කෙරෙත්. 4. දරුව, තගේ මානය දුර ලව. 5. බලව, ඒ සජියා ගෙට පිවිසෙනවා ඇත. 6. ඒ පළිතයෙන් මේ නදිය මතු වෙයි. 7. පරෙවි කිරිල්ලගේ මේ පැටවුන් නො අල්ලව 8. යම් කෙනෙක් පව් කෙරෙද්ද ඔවිහු දුක් විඳිත්. 9. ඔහුගේ වචන තොප දෙදෙන සිහි කළ යුතු. 10. අපේ ගමට යාමට කවර දිනයෙකි පිටත් විය යුතු ද? 11. කවරෙක් සතුරන් දිනන්නේ ද යි (දිනනවා ඇද් ද යි) මම නො දනිමි. 12. පියා අක්කරු පුතුව තළන්නේය (තැළිය යුතු.) 13. යමක් කරන්නට නුඹ අණකරන්නෙහි ද එය මම කරන්නෙමි (මා කරණවා ඇත.) 14. අනෙකකුගේ ශරීරයේ විකළ බවක් දැක කවට කම් නො කළ යුතු. 15. දෙවය මැඬ ලන්නට කවරෙක් හැකි වන්නේ ද? 16. පුත්‍රයිනි, විහාරයට ගොස් බණ ඇසිය යුතු 17. දුව, මෙහි අවුත් මේ ආසන යෙහි හිද ගෙන මේ දි කලඹන්නැ. 18. එහි කවුරුන් සමඟ තෙපි දිය නාන්නට යන්නහු ද? 19. මේ ඔරුවෙන් නදිය තරණය කරණු මැනවි. 20. ප්‍රේමමය වචන යෙන් මිත්‍රයන් වශයෙහි කළ යුතු. 21. යම් කෙනෙක් ශාස්ත්‍ර දනිත් ද ඔවුන් කරා බොහෝ ශිෂ්‍යයෝ තොයෙක් දිශා වලින් පැමිණෙත්. 22. හික්මුණු පුත්‍රයා මවගේ ද පියා ගේ ද වචන අනුව සිටිය යුතු. 23. ළමයිනි, සැමදා ම උදේ නැගිට ගෙයි මිදුලේ ව්‍යායාම කරවු (කළ යුතු.) 24. මගේ සහෝදරයා තොප දෙදෙනාට නගරයට ගොස් පැනකුත් පොතකුත් ගෙනවා ඇත. 25. වැඩිමහලු සහෝදරයා බාල සහෝදරයාට සෙනහ කළ යුතු.

30.

සර්වනාම.

අදස් (අර, අසුවල්)

පුල්ලිංගයෙහි.

	ඒකා.	බ.	බහු.
ප්‍ර.	අසෞ	අමූ	අමී
ෂ.	අමුම්	,,	අමූන්

තෘ.	අමුනා	අමූභ්‍යාම්	අමිභිඃ
චි.	අමුෂ්මෛ	,,	අමිභ්‍යඃ
ප.	අමුෂ්මාත්	,,	,,
ෂ.	අමුෂ්‍ය	අමූයොඃ	අමීෂාම්
ස.	අමුෂ්මින්	,,	අමීෂු

නපුංසක ලිංගයෙහි.

ප්‍ර. වි.	අදඃ	අමූ	අමූනි

සෙසු තැන් පුල්ලිංගයෙහි මෙනි.

ස්ත්‍රීලිංගයෙහි.

ප්‍ර.	අසෞ	අමූ	අමූඃ
චි.	අමූම්	,,	,,
තෘ	අමූයා	අමූභ්‍යාම්	අමූභිඃ
චි.	අමූස්‍යෛ	,,	අමූභ්‍යඃ
ප.	අමූෂ්‍යාඃ	,,	,,
ෂ.	,,	අමූයොඃ	අමූෂාම්
ස.	අමූෂ්‍යාම්	,,	අමූෂු

තද් ශබ්දය අනභිමුඛයෙහි ඉන්නකුද අදස් ශබ්දය ඇත සිටින්නකුද හැඟවීමට යොදනු ලැබේ. ඒ, අර, තෙල යන වචන වලින් ඒ අර්ථය සිංහලයෙන් අඟවනු ලැබේ.

විභෙෂණ වූ තන්හි.

අසෞ පුරුෂඃ	අර පුරුෂ තෙම.
අමූනා පුරුෂෙණ	අර පුරුෂයා විසින්.
අමුෂ්මින් පුරුෂෙ	අර පුරුෂයා කෙරෙහි.
අදඃ වනම්	අර වනය.
අමීෂු වනෙෂු	අර කැලෑවල.
අසෞ කන්‍යා	අර කන්‍යා තොම.
අමූෂ්‍යාං ලතායාම්	අර වැලෙහි.

තෂීව යෙදෙන තන්හි,

අසෞ ගවජති.	ඒ (අර) තැනැත්තා යයි.
අදඃ පතති.	එය වැටේ.
අසෞ වදති.	ඕ (අර තැනැත්ති) තොමෝ කියයි.
අමූෂාම් භූෂණානි.	අර සත්‍රීන් ගේ ආභරණ.

58 යදිඃ-අනියමින් යමක් කිවමනා කල්හි බොහෝ විට විධිලිඞ් විභක්තින් යුත් වාක්‍යයකට යදි යන නිපාතය එක් කරණු ලැබේ. 'යදි සෝ ගවෙජත් අහමපි ගවෙජයම්'. හේ ඊන්නේ නම් (ඔහු යතොත්), මමත් යන්නෙමි. (මෑත් යෑ හැකියි, මාත් යනවා ඇත.)
ලිඞ් විභක්ත ඇති වාක්‍යයෙහි ද මේ යෙදේ. යදි ස ජීවති භද්‍රාණි පශ්‍යති'. ඉදින් හේ ජීවත් වේ නම්, මනා දෑ (=අභිවෘඞ්ධිය) දක්නේය.

59 යදි-තර්හි. උඩ කී පරිදි මූල වාක්‍යයේ 'යදි' යන්න යෙදුණ විට දෙවැන්නෙහි මූලට තර්හි යන්න යෙදේ. යදි ස පෘපං කුර්‍යාත් තර්හි නිරයං ව්‍රජෙත්. ඉදින් හේ පව් කරන්නේ නම් ඒ හෙයින් (=ඔහු පව් කරතොත්) නිරයට යන්නේය. (=යනවා ඇත, යා යුතු, යා හැක්ක.)

60 සචෙ යනු ද අනියම යෙහි මූලට යෙදේ. සචේ ස ගවෙජත්. ඉදින් ඔහු යතොත්.

චෙත් යන්න ක්‍රියාවට අගින් යෙදේ.

අභ්‍යාසය.

(අ) සිංහලයට නගනු.

1. අමීහ්‍යෝ ගිරිභ්‍යෝ බහවඃ පාෂාණාඃ පතන්ති. 2. තෙ එභිලීගුඞ්ගෙසතාන් සෙනානාන් තාඩයන්ති. 3. අමීභ්‍යඃ කුමාරෙභ්‍යෝ, මූභ්‍යඃ කුමාරීභ්‍යශ්චව මොදකානි යචෙජඃ. 4. පශ්‍යත, අමූෂ්‍ය ගිරෙඃ ශිඛරාදවතරති අසෞ මෘගඃ. 5. අමූයොනීදෙශුඃ සඞ්ගම, පවිත්‍රඃ. 6. අමූෂාං සත්‍රීණා මෙතත් ධනම්. 7. අමූෂ්‍යාඃ වාපිකායාඃ එතත් ජලම්. 8. අමූඃ නද්‍යඃ ෂුෂකා අභවන්. 9 අමූනි පුෂ්පාණි අත්‍ර මූෂකා භක්ෂයන්ති. 10. අදඃ මම උදකුනම්. 11. අමූ කුමාරෙ

තත්‍ර ක්‍රීඩතඃ. 12. යත් ස තදනීම්වදත් න තදහම්දනීං සමරාම්. 13. එතත් පාත්‍රං ස්‍රවති, අතඃ එතසමාත් පාත්‍රාත් සර්‍වං ජලං බහිර්වෙජත්. 14. යදි තවං භූම්ං න ගලෙඃ, පිතා තවාං හර්ත්සයෙත් 15. යදි තවං තත්‍රම්වෙඡඃ තර්හි දධි මජ්නියාඃ. 16. සවෙ ශ්‍රය මෙහෙය්‍යා භොජ්තං න යවෙඡත තර්හි ඉමෙ අසමාත් සථානාත් යාස්‍යඃ. 17. යදි ස්‍රුවාමෙතාන් වරථාන පීඩයෙතං තෙ ස්‍රුවාං දශෙස්‍යඃ. 18. යදි මම වචනං ශෘණ්‍වයාත, ස්‍රුඃඛං භිතං සාධ්නු යාත. 19. තවාං ප්‍රහර්ත්තුං කො නාම ධෘෂ්ණුයාත්. 20. යෙ දුශ්චිෘතිං කුර්‍වන්ති තෙ දුර්ගතිං ප්‍රාප්නුවන්ති. 21. ප්‍රියාය මිත්‍රාය මෙ කං දූත මිදනිං ප්‍රහිණොමි? 22. සුචරිතෙන පුත්‍රඃ පිතරෙ ගුරුං ච. ප්‍රිණීයාත්. 23. අහොඃ! තෙ අමුෂ්‍ය හස්තෙන පාදෙ ච වෘක්ෂෙ බධ්වා අසමාත් සථානාත් ප්‍රාස්‍රුඃ. 24. යදි ස්‍රුවාමෙතං තරුං ශ්‍රිතියාතං බහ්වනි ඵලානි පතෙයුඃ. 25. යදි වයං බාල සංස්කෘත බොධිනීං පඨෙම සංස්කෘත භාෂයා වාක්‍යානි රචයිතුං ශක්නුයාම්.

(ආ) සංස්කෘතයට නඟනු.

1. නුඹ ශ්ලෝකයක් බඳින්නෙහි නම් මම නුඹට තෑග්ගක් දෙන්නෙමි. 2. අද ඔහු පියාට ලියුමක් යවනවා ඇත. 3 අර පර්‍වතයෙහි ගුහාවන්හි පෙර බොහෝ සෘෂිහු වුසූහ. 4. මගේ ගෙය රක්නා තැනැත්තේ මේ බල්ලා ය. 5. නුඹලා දින පතා පාසලට නො යතොත් ඇදුරහු දඬුවම් කරණවා ඇත. 6. යම් කෙනෙක් නුඹලාට නිදු කොළෝ නම් ඒ අසුවල්ලු යැ යි කිය හැක්කහු ද? 7. රාවණයා ගේ දුෂ්ට ක්‍රියායෙන් රාක්ෂසයනට අවැඩක් ම විය. හැක්කැ යි විභීෂණ තෙම දැන ගත්තේ ය. 8. ඔබ තර්ජනය නො කරතොත් මම ඒ ප්‍රවෘත්තිය කියන්නෙමි. 9. යමෙක් මේ වස බොන්නේ ද ඔහු මැරෙණවා ඇත. 10. රාත්‍රි යෙහි අර දෙදෙනා අවුත් මෙ ලදුරියන් ගේ ආභරණ පැහැර ගත්හ. 11. අද ම ගමට ගොස් මගේ පියාට මේ හස්න දැන්විය හැකි නම් නුඹට තෑග්ගක් දෙන්නෙමි. 12. ඒ නොභික්ෂූණු ළමයින් දෙන්නා හා සෙල්ලම් කරන්නට ගියොත් (=යන්නහු නම්) තොපට මේ වේවැලින් තලන්නෙමි. 13. ඉදින් තෙපි දුසිරිත් කරන්නහු නම් ලෝකයා තොපට නින්ද කරණවා ඇත. 14. අපි සියල්ලෝම මෙහි සැපෙන් කල් යවම්හ. 15. තෙපි කවර නුවරෙකින් මෙහි ඒවු ද? මේ කවරෙක් ද? ඕ කවරී ද? අර අය කව්ද? 16. අපි කොළොම් පුරයෙන් එමු. මේ මගේ බාල සොහොයුරා ය. මෝ බාල සොහොයුරි ය, අර මගේ මිත්‍ර

යා ගේ පුත්‍රයෝ ය. 17. යම් පුතෙක් ධාර්මික නො වේ නම් ඔහු හෙන් පියාට හෝ කුලයට කවර වැඩෙක් ද? 18. මේ ලදුරියන් දෙදෙන සතුරන් ගෙන් බේරාගෙන මෙහි ගෙනෙමි. 19. අශරණ වූ මොවුන් මේ (ලදුරියන්) දෙදෙනාට යම් උපකාරයක් කරණු කැමැත්තෙහි තම දුන් එය කරණු මැනවි. 20. ඉදින් මගේ වචනය නො කරන්නහු නම් මෙහි නො විසිය යුතු ය.

31.

සංඛ්‍යා ශබ්ද.

එක.	1	ෂඩ් ,,	26
ද්වි.	2	සප්ත ,,	27
ත්‍රි.	3	අෂ්ට ,,	28
චතුර්.	4	නව ,,	29
පංචන්.	5	එකොනත්‍රිංශත්	
ෂෂ්.	6	ත්‍රිංශත්.	30
සප්තන්.	7	එක ,,	31
අෂ්ටන්.	8	ද්වා ,,	32
නවන්.	9	ත්‍රයස් ,,	33
දශන්	10	චතුස් ,,	34
එකාදශන්.	11	පංච ,,	35
ද්වාදශන්.	12	ෂට් ,,	36
ත්‍රයොදශන්.	13	සප්ත ,,	37
චතුර්දශන්.	14	අෂ්ට ,,	38
පංචදශන්.	15	නවත්‍රිංශත්.	
ෂොඩශන්.	16	එකොනචත්වාරිංශත්	39
සප්තදශන්.	17	චත්වාරිංශත්.	40
අෂ්ටාදශන්.	18	එකචත්වාරිංශත්.	41
නවදශන්.	19	ද්වා ,,	42
එකොනවිංශති		ත්‍රයශ් ,,	43
විංශති.	20	චතුශ් ,,	44
එකවිංශති.	21	පංච ,,	45
ද්වාවිංශති.	22	ෂට් ,,	46
ත්‍රයොවිංශති.	23	සප්ත ,,	47
චතුර්විංශති.	24	අෂ්ට ,,	48
පංචවිංශති.	25	අෂ්ට ,,	48

නව ,, එකොනපංචාශත්	49
පංචාශත්.	50
එකපංචාශත්.	51
ෂා ,,	52
ෂි ,,	52
ත්‍රයඃ ,,	53
ත්‍රි. ,,	53
චතුඃ ,,	54
පංච ,,	55
ෂට් ,,	56
සප්ත ,,	57
අෂ්ටා ,,	58
අෂ්ට ,,	58
නව ,, එකොනෂෂ්ටි	59
ෂෂ්ටි.	60
එකෂෂ්ටි.	61
ෂා ,,	62
ෂි ,,	
ත්‍රයඃ ,,	63
ත්‍රි ,,	
චතුඃෂෂ්ටි.	64
පංචෂෂ්ටි.	65
ෂට් ,,	66
සප්ත ,,	67
අෂ්ට ,,	68
නව ,, එකොනසප්තති	69
සප්තති.	70
එක ,,	71
ෂා ,,	72
ෂි ,,	
ත්‍රයස්සප්තති	73
ත්‍රිසප්තති	
චතුස්සප්තති.	74
පංචසප්තති.	75
ෂට්සප්තති.	76
සප්ත ,,	77
අෂ්ටාසප්තති.	78
අෂ්ට ,,	
නව ,, එකොනාශීති	79
අශීති.	80
එකාශීති.	81
ද්‍යශීති.	82
ත්‍र්‍යශීති.	83
චතුරශීති.	84
පඤ්චාශීති.	85
ෂඩශීති.	86
සප්තාශීති.	87
අෂ්ටාශීති.	88
නවාශීති.	89
එකොන නවති	
නවති.	90
එකනවති.	91
ෂා ,,	92
ෂි ,,	
ත්‍රයොනවති	93
ත්‍රි ,,	
චතුර්නවති.	44
පංචනවති.	95
ෂණ්ණවති.	96
සප්තනවති.	97
අෂ්ටානවති	98
අෂ්ටනවති	
නවනවති.	99
එකොනශත.	
ශත.	100
විශත.	200
ත්‍රිශත.	300
ෂහස්‍ර.	1000
දශශත.	
අයුත.	10,000
ලක්ෂ.	100,000
ප්‍රයුත.	1000,000
කොටි.	10,000,000

එක ශබ්දය සර්වශබ්දය මෙන් තුන් ලිඟුයෙහි ම වර තෙතුන්.
මේ ශබ්දය ඒවචනයෙහි පමණක් වර නැගේ.

පුල්ලිඟයෙහි.	නපුංසක ලිඟ යනු ලිඟ දෙක්හි.
ඒවචන	ඒවචන
ප්‍ර. සං. වෙෆ	ප්‍ර. සං. වෙ
ඒ. ,,	ඒ. ,,
තෘ. වාභ්‍යාම්	ඉතිරි විබත්හි පුලල්ිංගයෙහි මෙනි.
ච. ,,	
ප. ,,	
ෂ. වයොඃ	
ස. වයොඃ	

ත්‍රිශබ්දය.

මෙය බහුවචනයෙහි ම වර නැගේ.

	පුං.	නපුං.	ස්ත්‍රී.
ප්‍ර.සං.	ත්‍රයඃ.	ත්‍රීණි.	තිස්‍රඃ
ඒ.	ත්‍රීන්	,,	,,
තෘ.	ත්‍රිභිඃ.	(සෙස්ස පුලල්ිංගයෙහි	තිසෘභිඃ
ච.	ත්‍රිභ්‍යඃ.	මෙනි.)	තිසෘභ්‍යඃ
ප.	,,		,,
ෂ.	ත්‍රයාණාම්.		තිසෘණාම්
ස.	ත්‍රිෂු.		ත්‍රිසෘෂු.

චතුර්ශබ්දය.

බහුවචනය.

	පුං.	නපුං.	ස්ත්‍රී.
ප්‍ර.සං.	චත්වාරඃ	චත්වාරි	චතස්‍රඃ
ඒ.	චතුරඃ	,,	,,
තෘ.	චතුර්භිඃ	(සෙස්ස පුලල්ිංගයෙහි	චතසෘභිඃ
ච.	චතුර්භ්‍යඃ	මෙනි.)	චතසෘභ්‍යඃ
ප.	,,		,,
ෂ.	චතුර්ණාම්		චතසෘණාම්
ස.	චතුර්ෂු		චතසෘෂු.

පංචන්, ෂඩ්, සප්තන්, අෂ්ටන් ශබ්ද ලිංගත්‍රයයෙහි ම සම යි.

ප්‍ර. ස. වි	තෘ.	ච. ප.	ෂ.	ස.	(විබත්)
පංච.	පංචභිඃ	පංචභ්‍යඃ	පංචානාම්	පංචසු	(පංචන් ශබ්දය)
ෂට්.	ෂඩ්භිඃ	ෂඩ්භ්‍යඃ	ෂණ්ණාම්	ෂට්සු	(ෂට් ශබ්දය)
සප්ත.	සප්තභිඃ	සප්තභ්‍යඃ	සප්තානාම්	සප්තසු	(සප්තන් ශබ්ද)
අෂ්ට.	අෂ්ටභිඃ	අෂ්ටභ්‍යඃ	අෂ්ටානාම්	අෂ්ටසු	(අෂ්ට ශබ්දය)
අෂ්ටෞ	අෂ්ටාභිඃ	අෂ්ටාභ්‍යඃ		අෂ්ටාසු	

නවදශන් ශබ්දය තෙක් ඉතිරි න්කාරාන්ත සංඛ්‍යා ශබ්ද පංචන් ශබ්දය සේ වර නගත්‍ර. ඔහු හැම ත්‍රිලිංගයෙහි සම සි.

එකානවිංශති ශබ්දය පටන් **නවනවති** ශබ්දය තෙක් සියලු ශබ්ද එකවචනයේ ම සත්‍රිලිඞ්ගයෙහි වර නැගේ. එසින්, **විංශති, ෂෂ්ටි, සප්තති, අශීති, නවති** යන ශබ්ද මෙහි 41 වන පිටේ පෙනෙන භූමි ශබ්දය සේ ඒක වචනයෙහි වර නැගේ. **ත්‍රිංශත් චත්වාරිංශත් පංචාශත්** යන ත් කාරාන්තයන්ගේ වර නැගීම එක සම සි.

ත්‍රිංශත් ශබ්දය.

ඒකවචන

ප්‍ර.	ත්‍රිංශත්, ත්‍රිංශද්
ස.	” ”
වි.	ත්‍රිංශතාම්
තෘ.	ත්‍රිංශතා
ච.	ත්‍රිංශතෙ
ප.	ත්‍රිංශතඃ
ෂ.	”
ස.	ත්‍රිංශති

ලක්ෂ ශබ්දය හැර යන සහස්‍ර ආදි ඉතිරි අකාරාන්ත ශබ්ද 13 වන පිටේ පෙනෙන වන ශබ්දය සේ වර නැගේ.
ලක්ෂ ශබ්දය පුල්ලිංග සත්‍රිලිංග දෙක්හි **දෙව** ශබ්ද **කන්‍යා** ශබ්ද මෙන් වර නැගේ. 17, 39 පිටු බලනු.

කොටි ශබ්දය ද භූමිශබ්දය මෙනි.

එකවචනයෙහි වර නැගුණත් බහු අර්ථයක් දෙන බැවින් මොහු බහු වචනයට විශෙෂණ ව සිටිත්.

උදාහරණ:-

එක විංශතිඃ කුමාරාඃ, (ළමයි විසිඑක් දෙනෙක්),
ශතං කන්‍යාඃ, (කන්‍යාවෝ සියයක්)

61 එකශතම් (එක් සියයක්). මෙසේ ම ද්විශතම්, දෙසිය යෙකි; ත්‍රිශතම්, තුන්සියයෙක. මේ ආදි නපුංසක ආදි ශබ්ද ශත ආදි ශබ්දයනට මුලින් යොදා අර්ථ ගත යුතු.

එකාසිය එක, එකසිය දෙක ආදිය කෙසේ සංඝාතයෙන් යෙදිය යුතු ද? යත්: අධික ශබ්දය හෝ උත්තර ශබ්දය ඒ එක ම් ආදි ශබ්ද වලට පසු ව එක්කොට ඉන් පසු ශත ශබ්ද ආදිය යොදා ගතයුතු.

මෙසේ මුලට එක් වන ශබ්දයන් ගේ අගට පංචන් ආදියේ ණ් නැත්නම් වුවොත් එය මැකෙයි.

එකාධික ශතං (එක-අධික-ශතං), එකොත්තරශතං (එක-උත්තර-ශතං) 101. පංචාධික විශතං. 205; අෂ්ට ත්‍රිංශදධික නවශතොත්තර එකසහස්‍රං. 1938. *

අභ්‍යාශය.

(අ). සිංහලයට නඟනු.

1. එෂ වත්සරෝ'ඛ්‍යාන් රථෙ යොජයති. 2. අම්භෙහ්‍යා ඛ්‍රාහ්මණෙභ්‍යා ධනං දෙහි. 3. චතුර්ණාං මුනීනාමසෙෂ ආශ්‍රමඃ. 4. එතෙ බාලාශ්චතසෘෂු පාඨශාලාසු පඨන්ති 5. ස්ත්‍රිඃ සත්‍රියො, ධුනා අසමින් ගෘහෙ වසන්ති. 6. මම චත්වාරි මිත්‍රාණි යසමින් ක්‍රීඩාඞ්ගනෙ ක්‍රීඩන්ති, තත් සථානමඞ්ග ගච්ඡාමි 7. වෙෂ පුරුෂෙණ වෙ පුෂෙප ගෘහීත්වා විකාරං යාත්‍ඃ. 8. වාක්‍යාං

* මෙහි තවත් ක්‍රම ඇත. ඒ ඉගෙන පඬිකම් සඳහා ලියවෙන සංස්කෘතාවතරණිකා නම් පොතේ දැක්වේ.

මිත්‍රාභ්‍යාං සාර්ධමාවාං ක්‍රීඩාඛ්‍යතං ගවජාව. 9. පංව පුරුෂාණේව පංච සත්‍රියශ්ච මාතේණාගවජන්. 10. කිං න පශ්‍යසි අමීෂාං පංචානාං පුෂපාණාං ශොභාම්.? 11. අෂ්ටෙව බාලකාඃ අෂ්ටානාං කුමාරිකානාං ගානං ශ්‍රැණොති. 12. අෂ්ටසු පුස්තකෙෂු එතෙෂ්වෙව ශ්ලොකෙෂ්වෙව පශ්‍යාම්. 13. අහං තසෙම පුරුෂාය පංච විංශතිං රෞප්‍යකාණ්‍යගවජම්. 14. අස්‍ය කරෙ ඉදානීං ත්‍රිශතං රෞප්‍යකාණ්‍යපශ්‍යම්. 15. අෂ්ටාවිංශත්‍යා කුමාරෙඃ සාර්ධම්ඛං නදාඃ සත්‍රීරම්ඛවජම්. 16. තසම්න් ග්‍රාමෙ ෂෂ්ටිජනා වසනති. 17. මහාභූතානි පංවෙවෙති වදනති. 18. ත්‍රිශතං ව පංච ෂුතිශ්ච දිනානි එකස්‍ය සංවත්සරස්‍ය. 19 ත්‍රය සත්‍රිංශත් මූෂිකා ඛිලාන් නිර්ගත්‍ය සිංහස්‍ය සමීපෙ අක්‍රිඛන්. 20. ෂට් වොරා ගෘඛපතෙ ගෘහං රාත්‍රෞ ප්‍රවිශ්‍ය මංජූෂාං විවෘත්‍ය ත්‍රයසත්‍රිංශදධිකාෂතං රෞප්‍යකාණ්‍යමුෂණන්. 21 අමී රාජ්‍ඥපුරුෂා ඉදානීං අමුෂ්‍යෙඃ වයොශෙචාරයොඃ ශීඝ්‍රී ලුනීප්‍රඃ. 22. රාමඃ සීතා ලක්‍ෂ්මණශෙවති ත්‍රයො ජනාඃ දශරථං නෘපතිං තස්‍ය තිස්‍රඃ දෙව්‍යශ්ච ප්‍රණම්‍ය ප්‍රාහාදුන්නිරග්‍රඃ. 23. පශ්‍යත, එකාදශ ශිශවොඃ මඛුති ක්‍රීඩනති. 24. එතස්‍ය පුස්තකස්‍ය මූල්‍යං රෞප්‍යකාණාං පංචෙති වදනති. 25. ව්‍යධොඃ රණ්‍යෙ වරිත්‍වා චෙෂ මෘගෙෂ මාරයිත්‍වා තයොර්චයොම්‍යං ෂං කාචෙනාදග නගරං ප්‍රාගාත්.

8 (ආ) සංස්කෘතයට නගනු.

1. මේ ළමයි ක්‍රීඩාවන්හි චතුර ය. 2. දරුව බලව, අර ගස මූල අර බැළලී කටුපුවකු අල්ලාගෙන පෙළ සි ඇගෙන් ඌ මුදව. 3. අර මිදුලෙහි ගේකුරුල්ලෝ තුන්දෙනෙකුත් ගේකිරිල්ලියෝ තුන්දෙනෙකුත් ශෙල්ලම් කරති. 4. මෙහෙකරුව මේ ගෝනුස්සන් තිදෙනා පේළාවෙහ බහා ගෙනගොස් ඇත විසිකරව. 5. ඊගේ පරෙව්ගෝ දෙදෙනෙක් මෙහි ආය. 6. දැන් අර මකුළුවා ගේ දැලෙහි කලාමැදිරියෝ සතර දෙනෙක් වැටුණාහ. උන් එයින් මුදව. 7. අපේ යෝධයෝ රණබිමට වැද යුඛ කොට සතුරන් දෙසිය පණස් දෙනෙකුන් ගේ හිස් කැපූහ. 8. අපේ පාඨශාලායෙහි දෂ්ෂ ළමයින් දහතුන් දෙනෙක්නට දිශාපති තෙම අද උදේ තැගි දුන්නේය. 9. තෝ දැන් ගොස් පෙළිවියක් කඩයෙන් මිළයට ගෙනා යුතු. 10. ඒ මල් සත මා පිණා ලත්. 11. ගඟට නැග අඹගෙඹි දශයක් කඩාදමව (=ඉහලව) 12. අපි දෙදෙන අර ඝජියාගෙන් තැනිගත්තමු. 13. ශිෂ්‍යයෝ තුන්දෙන ආචාර්‍යයන් දෙදෙනාගේ පාමුල වැටී වැන්දහ.

14. අර කවුළු සතර විවෘත කරවූ. 15. රාම තෙම ඉර දහයෙකින් රාවණයාගේ දශ හිස් කපා දැමී ය. 15. අහෝ උස් ගසෙන් අර කිරිල්ලිය ගේ පැටවු පස් දෙනා ම වැටුණාහ. 17. සතළිස් අව දෙනෙක් මිනිස්සු නැවෙක නැඟ ගගේ එගොඩට ගියහ. 18. මම අද කඩයට ගොස් කෝප්ප දුසිමක් මිළයට ගනිමි. 19 ඒ පින්මද බොවියා ගේ එළුවන් සදෙනා සිවල්ලු අල්ලා ගත්හ. 20. මේ පාසැලෙහි ළමයින් තිස්දෙනෙකුන් ගේ ඇදුම් කිලිටු ය, ඉතිරි සැව නවදෙනා ගේ ඇදුම් පිරිසිදුයැ යි පරීක්ෂා තෙම කී ය. 21. මේ පඬිතියෙහි ළමයි කවුරු ද? සියල්ලෝ ම මෙහි එවූ යැ යි ඇදුරු තෙම ඔවුන් කැඳවීය (=අඬගැසීය). 22. අපේ විද්‍යාලයයෙහි ශිෂ්‍යයෝ නවසිය අසූ නව දෙනෙකි. 23. ඒ බ්‍රාහ්මණ තෙම ශ්ලෝක විසිහයෙකින් රජුහු පැසැසීය. 24. මේ කරඬුවයෙහි පොල්ගෙඩි හසිය පණස් තුණෙකි, මිළයට ගනු කැමැත්තෙහි නම් දැන් ම ඒ සියල්ල මිළදී ගත මැනව. 25. බිම්සර රජ දසදහසක් ජනයන් හා බුදුරජුන් වෙත ගොස් දහම් අසා සත්‍ය අවබෝධ කෙළේය. 26. ලක්දිව භික්ෂූහු දස දහසෙකි. 27. අත් දෙකේ ඇඟිලි දශගෙහා, පා දෙකේ ඇඟිලි දශයෙක, සියලුම ඇඟිලි විස්සෙක 28. මේ ගේත් වත්තත් හේ රුපියල් දෙලොස් දහස් පන්සියේකින් ඒ ද්‍රව්‍ය ධනපතියා ගෙන් මිළයට ගත්තේ ය. 29. අර වැල් තුණෙහි බොහෝ මල් රාත්‍රියෙහි පිපෙත්.

(ඉ) ගෙවල් එකසියවිසිතුණෙක, උළු එකදුස් දෙසියයෙකින්, ගස් විසිතුණෙක, ඇදන් අසූ දෙකෙක, නගුල් එක්සිය අටෙකින්, පෙව්ටි අවසියයෙකින්. මේවා සංඝෘතයට නගනු.

(ඒ) සංඝෘතයට නගනු. 125, 1256, 12567, 123456, 1234567, 12345678.

32.

සංඛ්‍යා පූරණ ශබ්ද.

පුංනපුං සක දෙක්හි.		ස්ත්‍රීලිංගයෙහි.
ප්‍රථම.	පළමු වන	ප්‍රථමා
විතීය.	දෙ වෙනි	විතීයා
තෘතීය.	තෙ වෙනි	තෘතියා
චතුර්.	සතර වන	චතුර්ථී
පංචම	පස් වන	පංචමී
ෂෂ්ඨ.	ස වන	ෂෂ්ඨී
සප්තම.	සත් වන	සප්තමී
අෂ්ටම.	අට වන	අෂ්ටමී
නවම.	නව වන	නවමී
දශම්.	දශ වන	දශමී
එකාදශ.	එකොළොස් වන	එකා දශී
ද්වාදශ.	දෙළොස් වන	ද්වා දශී
ත්‍රයොදශ.	තෙළෙස් වන	ත්‍රයොදශී

විංශතිතම.	විසි වන	විංශතිතමී
විංශ.	,,	විංශී
එකවිංතිතමී	එක්විසි වන	එකවිංශතිතමී
එකවිංශ	,,	එක විංශී.
ත්‍රිංශත්තම	තිස් වන	ත්‍රිංශත්තමී.
ත්‍රිංශ	,,	ත්‍රිංශී.
එකත්‍රිංශත්තමී	එක්තිස් වන	එකත්‍රිංශත්තමී.
එකත්‍රිංශ	,,	එකත්‍රිංශී
චත්වාරිංශත්තම	සතළිස් වන	චත්වාරිංශත්තමී.
චත්වාරිංශ	,,	චත්වාරිංශී.
පඤ්චාශත්තම	පණස් වන	පඤ්චාශත්තමී.
පඤ්චාශ	,,	පඤ්චාශා.
ෂෂ්ටිතම	සැට වන	ෂෂ්ටිතමී.
එකෂෂ්ටිතමී	එක්සැට වන	එකෂෂ්ටිතමී.
එකෂෂ්ට	,,	එකෂෂ්ටී.

සප්තතිතම	සැත්තෑ වන	සප්තතිතමී.
එකසප්තතිතම	එක්සැත්තෑ වන	එකසප්තතිතමී.
එකසප්තත	,,	එකසප්තතී.
අශීතිතම	අසූ වන	අශීතිතමී.
එකාශීතිතම	එක්අසූ වන	එකාශීතිතමී.
එකාශීත	,,	එකාශීතී.
නවතිතම	අනූ වන	නවතිතමී.
එකනවතිතම	එක්අනූ වන	එකනවතිතමී.
එකනව	,,	එකනවී.
ශතිතම	සිය වන	ශතතමී.
විශත්‍යතම	දෙසිය වන	විශතතමී.
සහස්‍රතම	දහස් වන	සහස්‍රතමී.
ලක්‍ෂතම	ලක්‍ෂ වන	ලක්‍ෂතමී.

උදාහරණ:-

අයං	ප්‍රථමඃ පුත්‍රඃ	මේ පළමු වන පුත්‍රයා ය.
ඉදං	ප්‍රථමං පුත්‍රකම්.	මේ පළමු වන පොත ය.
ඉයං	ප්‍රථමා දුහිතා.	මේ පළමු වන දූ ය.
එෂ	සප්තමඃ ශිෂ්‍යඃ	මේ සත් වන ශිෂ්‍යයා ය.
එතත්	සප්තමං පුස්තකම්.	මේ සත් වන පොත ය.
එෂා	සප්තමී විහකතිඃ	මේ සත් වන විභක්තිය ය.
අසෞ	එකාදශඃ පුරුෂඃ.	අර එකොළොස් වන පුරුෂයා ය.
අදඃ	එකාදශං ඵලම්.	අර එකොළොස් වන ගෙඩිය ය.
අසෞ	එකාදශී කන්‍යා.	අර එකොළොස් වන කන්‍යාව ය.

සෙසු තැන් ද මෙ නයින් දත යුතු.

62. මෙහි ප්‍රථම ආදි අකාරාන්ත ශබ්ද පුල්ලිංගයෙහි **පුරුෂ** ශබ්දය මෙන් ද, නපුංසකලිංගයෙහි **වන** ශබ්දය මෙන් ද වර්ත්තනු. ප්‍රථමා ආදි ආකාරාන්ත ශබ්ද **කන්‍යා** ශබ්දය මෙන් ද, චතුර්ථී ආදී ඊකාරාන්ත ශබ්ද **නදී** ශබ්දය මෙන් ද වර්ත්තනු.

පදයන් ගේ යෙදීම සිංහලයට නගන්නට දෙන සංස්කෘත වාක්‍ය පරික්‍ෂාවෙන් කියවීමෙන් දත හැක්ක.

63. **නිඛාරණය.**

බොහෝ දෙනෙකුන් ගෙන් එකකු තෝරා ගැන්මේ දී ඒ බොහෝ දෙනා අඟවන පදය ඉඟි **කෝ සප්තමී** විභක්ති යෙන් සිටී.

උදාහරණ:-

ශිෂ්‍යයන් සීස් දෙනා ගෙන් පළමු වැන්නා සුමිත්‍රා ය. මෙය සංස්කෘතයට හැරීමේ දී "ත්‍රිංශතඃ ශිෂ්‍යාණාං ප්‍රථමඃ සුමිත්‍රඃ' කියා හෝ 'ත්‍රිංශති ශිෂ්‍යේෂු ප්‍රථමඃ සුමිත්‍රඃ' කියා සිරිය යුතු යි.

අභ්‍යාසය.

(අ) සිංහලයට නගනු.

1. යාවත් ස වනෙ වසති තාවත් ඵලාන්‍යෙව අත්තු. 2. යථා සා ශොභනා‍ං කථාමාඛ්‍යාති තථාත්මමපි කිං නාඛ්‍යාසි? 3. යො ජාගර්ති තස්‍ය රාත්‍රිර් දීර්‍ඝා. 4. ස රාජා ධර්මේ සත්තො ධර්මමවිහාය මාතෘවත් ප්‍රජාන් පාතිසම. 5. පුත්‍ර, කිමර්‍ථං රොදිෂි? උදකෙ ගතෙ සෙතුබන්ධ ඉව සර්‍වථා නිෂ්ඵලෝ'යං තව විලාපඃ. 6. යථා ස වකත්‍ති තථා කරොති. 7. යථා ත්වං කෘරොෂි තථා වක්‍ෂි. 8. නාහං මිථ්‍යා‍ං වාවං වව්මි. 9. ඉදානීං මම දුහිතා ශ්‍වශුරමෙතු, තස්‍යා හතීා ඉතො ගාතු. 10. උපනයනාත් ප්‍රාඞ් න ත්‍රිජෝ වෙදනධීයීත. 14. ව්‍යාධො වනෙ විවරන් මෘගාන් හනති. 12. තෙ ශූරා හවා යුෂ්මෙ ශත්‍රූන් ඝනන්ති. 13. කුශලවෙෂ වාල්මිකෙඃ ශඝත්‍රුවිදූමධ්‍යෙයානාම්. 13. නාහ මස්‍ය තඩාගස්‍ය ජලෙන සනාම්. 14. ප්‍රජානා‍ං කාමදුඝා කපිලා නාම කාවිත් පුරී ආසීත්. 15. ගොපාලබාලකාඃ ශ්‍රී කෘෂ්ණං සත්‍යවන්ති 16. අද්‍යෙව බුඩං ශරණමුපෙහි. 17. ස්‍ත්‍රී ලොකං දුරාචාරාත් පාති. 18. ඵලහරිත වෘක්ෂෙෂු මධුර ක්‍රෙෂ්ංවාදාඃ පක්‍ෂිණොා මධුරං රුවන්ති. 19. වාතායනගතා සා සත්‍රීඃ කිමර්‍ථං රොදිති? 20. යො ජනතුෂු සතතං මෛත්‍රීං කුරුතෙ ස සුඛං සවපිති. 21. ප්‍රියෙ, සමාඛසිහි ඉය මාගතා තව දුහිතා. 22. සත්‍යංබ්‍රූයාත් ප්‍රියං බ්‍රූයාත්, න බ්‍රූයාත් සත්‍යමප්‍රියම්. 23. මා දීනං වචෝ බ්‍රූහි. 24. තෙ භූමාවසටපන් ඵලානි වාජක්‍ෂුඃ. 25. ප්‍රියෙ, කිං ත්වං ජීවතතං පුත්‍රං මෘතං මත්වා වෘථා විරෙෂි?

(ආ) සංස්කෘතයට නගනු.

1. නල තෙමේ සියලු ශිල්ප ද විදූ ද උගත්තේ ය. 2. ඔහු ගේ බිරින්ද පුතුන් දෙදෙනකුන් ප්‍රසූත කළා ය. 3. ඔව්හු උදේම නැගිට නදියෙහි නෑහ, හිරු පිදූහ, මහත් භක්තියෙන් සතව කළහ. 4. පුත්‍රය, නොඟඩන්න, සැනසෙන්න, මව් දැන් එනවා ඇත. 5. ළමයිනි, සත්‍යය කියවු, මව්පියනට කීකරු වවු, උත්සාහයෙන් ධර්‍ම ශාස්ත්‍ර උගනිවු. 6. දැන් සැනපෙවු කෙට ඉතා උදෙන් ම පිබිදෙවු. 7. භික්‍ෂුව දම් දෙසන කල්හි උපාසකවරු සමීපයෙහි බිමැ පැදුරුවල හිඳිත්. 8. 'තෝ ශූර පුතකු ප්‍රසූත කෙරෙහි වා'යි සෘෂි තෙමේ ඇයට ආශීර්‍වාද කෙළේ ය. 9. ඔහු විසින් ශක්‍ති පරිදි ශිල්ප ශාස්ත්‍ර උගන්නා

ලද්දේය. 10. ඒ යාගයෙහි බොහෝ සිවුපාවෝ නසන ලදහ. 11. අපි ඔවුන්ගේ වචන නො ඇදහුමු. 12. නින්ද කටයුත්ත නන් නො පසසව. 13. ගංගාතීරයේ අසපුවෙක ඊයේ රාත්‍රියෙහි අපි ශයනය කළමහ. 14. මෙහි ශිෂ්‍යයෝ ඉතා හික්මුණෝ යැ යි මව වැටහේ. 15. මෙහි සුලභ ඉතා හමයි. 16. පාසලේ ශිෂ්‍යයන් අතුරෙහි ඉතා දක්ෂ වූ සේන තෙමේ සෙස්සන් විසින් පසසනු ලැබේ. 17. දශරථයා ගේ භාග්‍යවූ කොසලල්‍යා තොම වෛත්‍ර මාසයෙහි නව වන දින ඉරමුදුන් වේලෙහි රාමයා ප්‍රසූත කළා ය. 18. පාණ්ඩවයන් විසින් ශුඛ ශිල්පය ද්‍රෝණයාගෙන් ඉගෙන ගන්නා ලද්දේ ය. 19. කෙසේ නම් මම ධනවතෙක් වන්නෙම් දැ?යි හේ නිතර සිතී ය. 20. ගුණයෙන් හා ඥානයෙන් සම්පන්නවූ බොහෝ ක්ෂත්‍රියයෝ ත් බ්‍රාහ්මණ්‍යෝ ත් උන්වහන්සේ අනුව ගියහ 21. කිම? තෙපි අද ගංගා නදියෙහි නැවහු ද? 22. අපි දෙදෙන තක්සලායෙහි දී ත්‍රයාය ශාස්ත්‍රය උගනුමෝ වා. 23. රාවණයා මළ කල්හි මන්දෝදරී තොමෝ ළඟ හිද උස්හඬින් හැඬුවා ය. 24. කළ දුෂ්ට කම් ඇති තෙමේ වචනය මවිසින් අදහන ලදැ'යි නො සිතව. 25. මුදේ පාවෙන එක් දර කඩෙකුත් තවත් දර කඩෙකුත් යම්සේ හමුවන්නාහු ද, හමු ව වෙන්ව යන්නාහු ද සත්වයන් ගේ සම්‍යෝගමය ද එබඳු ම ය. 26. දරුව කුමට හඬහි දැ යි මව කීවා ය.

(ඉ) ශාස්, අධි + ඉ, රෑ, හා, තන්, ජෘ යන ධාතු ලවී, ලඩ්, ලොව්, විධිලිඞ් යන විභක්ති කෙසේ කතෘ කාරකයන්හි වර තෙතුන්.

(ඊ) ධාතු ගණ දශයේ උනුනට ඇති වෙනස උදාහරණ සහිත ව දක්වනු.

(උ) සිංහලයට නගනු. (කලු අකුරු ඇති පදවල සමාස විග්‍රහකොට කවර සමාස දැ යි පැහැදිලි කරනු.)

1 උද්වේගිනං පුරුෂසිංහ මුපෙති ලක්ෂ්මී
දෛවේන දෙයමිති කාපුරුෂා වදන්ති
දෛවං නිහත්‍ය කුරු පෞරුෂමාත්මශක්‍ත්‍යා
යත්නෙන කෘතෙ යදි න සිධ්‍යති කෝ'ත්‍ර දෝෂඃ

2 නාගෝ හාති මදෙන, කං ජලරූපගෝ,පුණ්ඩරීකානා ගවීරී,
ශීලෙන ප්‍රමදා, ජවෙන තුරගෝ,-නිත්‍යෝතසංවම්භිරම්
වාණී ව්‍යාකරණෙන, හංසම්ධුනෙර්-නදාඃ,
සභා පණ්ඩිතෝ,
සත්පුත්‍රෙණ කුලං, නාරපණ වසුධා,-ලෝකත්‍රයං
විජණුතා

3 සජීං පරවශං දුඃඛං-සච්මාතම්වශං සුඛම්
එතච්ඡත්වා සමාසෙන-ලක්ෂණං සුඛදුඃඛයෝඃ

4 යදිවෙච්ඡේත් ශාශ්වතිංප්‍රිතිං-ත්‍රීණි දොෂාණි වර්ජයෙත්
ද්‍යූතම්ථිප්‍රශොඝඤ්ච-පරොවෙෂ දූර දර්ශනම්

5 අකාලතඳ මනාසීඤ්ච-දීඝිරොඝමනාර්ජවම්
වතුරෝ විඩි වාණ්ඩාලාන්-ජාත්‍යා ජාගෙත පංචම්ඃ

6 සුඛං සටපිත්‍යනාණවාන්-ව්‍යාධිඝුක්තශ්ච ගෝ නරඃ
සාවකාසඤ්ච ගෙව ඝුඩිකෙත-යඤ්ච දුරෙනී සංගතඃ

7 මෙත්‍රීං සද්භිඃ සමං කුර්‍යාත්-ගෙනහං සත්සු තු සර්වථා
සංසර්ගං සාධුභිඃ කුර්‍යාදසතඤ්ඛනං පරිත්‍යජෙත්

8 ගෙවෙත ගෙව ඝුදෙව වෘධගෙවද්‍ය නාෂාතිථින්
විඝ්ඨාත්‍යාර්පිතඃ කුර්‍යාන්නාවමන්‍යෙත කානපි

9 ගුරූණාං ඝන්නිධෙ තිෂ්ඨෙත්-සගෙදෙව විනයාන්විතඃ
පාදප්‍රහාරණාදීනි-තත්‍ර නෙව සමාවරත්

10 කථං ඝඤ්ඣපවිතං ත්‍රිවංඝානං ච වහසෙ සමම්?
නූනං ව්‍යාඝෝ න විප්‍රස්ඛං-ගංස්‍යතෙන ඝුතා මෘගාන්

11 කෝ'ථිඃ පුත්‍රෙණ ජාතෙන-යඃ න විද්‍යාන්නධාර්මිකඃ
කිං තයා ක්‍රියතෙ ධේනවා-යා න සූතෙ න දුග්ධදා

12 න සා විද්‍යා න තදූනං-න තච්ඡිල්පං න සා කලා
න තත් ගෙෂ්ඨීං හි ධනිනාං-යාවගෙකෙර්‍ය්‍යා ගීයතෙ

13 නිමෙෂමපි පතිතෙ හර්මෙය-මශ්‍රුඝිඝෙතාති ඝෙදෙවතාම්
නිමෙෂමපි ම්‍රියතෙ තුභ්‍යං-ප්‍රදාස්‍යාම්‍යුපයාචිතම්

14 අපෘෂ්ටා'ත්‍රාප්‍රධානෝ යෝ-බ්‍රූතෙ රාඥඃ පුරඃ කුධිඃ
න කෙවලමසම්මානං-ලභතෙ ච විඩම්බනම්

15 පාදපං කඤ්චිදාරුහ්‍ය-තත්ඵලාගෙෂු සුඝංවතම්
අගෙන සම මාරුනිඝාත්‍ර-සීතගම්නි තර්කයන්

51. පාඩම.

ණිජන්ත.

ප්‍රයෝජ්‍ය ක්‍රියා ණිජන්ත නම්.

කර්තෘවාචක අංශය. ධාතුවට අශ යන්න එක්කිරීමෙන් ණිජන්ත අඩංගය සැදේ. ද

a. අශ යන්න පර කල්හි ධාණන්ත හලට පූර්ව වූ හ්‍රස්ව ය ව ගුණ වේ. උදාහරණ. බුධ් + අය + ති=බොධ් අයති=බෝධයති (අවබෝධ කරවයි.)

b. අය යන්න පර කල්හි සවරාන්ත ධාතූන්ගේ අන්තය ව ත්, හලන්ත ධාතූන්ගේ නො බැඳි හලට පූර්ව සවරයත් වෘඩි වේ. උදාහරණ. කෘ + අය + ති=කාර් අය ති=කාරයති; නශ් + අය + ති=නාශ් අය ති=නාශයති.

c. සම්හර කඵ ආදි ධාතූන් ණ් සවරයට වෘඩි නො වේ. උදාහරණ. කථයති. (කියවයි)

d. කම් ආදි කිහිපයක් හැර ඉතිරි සියලු අම් හාකාරාන්ත ධාතූන්ට ද වෘඩි නො වේ. කමයති. (යවයි)

e. ආකාරාන්ත ධාතූන් කෙරෙන් ද, ආ කාර ඛවට පෙර එණු එ, ඒ, ඔ කාරාන්ත ධාතූන් ගෙන් ද පර ව ප් ආගමය වේ. ඥා + ප් + අය + ති, ධෙ (ධා) + ප් + අය + ති, ශෙ (ශා) + ප් + අය + ති, දෘ (දෘ) + ප් + අය + ති=ඥාපයති, ධාපයති, ශාපයති, දර්ශයති.

[මේ ක්‍රමයෙන් වෙනස් ව හැදෙන ණම් වර්ගයේ ආඛ්‍යාත අංග මේ පොතේ දෙවෙනි භාගයෙහි දැක් වේ.]

කර්මවාචකාංශය. කර්තෘවාචකාංගයේ අශ භාගයට ලෝප් කොට ශ විකරණය එක් කරනු. ඉන් පසු ආත්මනෙ පද ප්‍රත්‍යයන් එක් කිරීමෙන් ණිජන්ත කර්මවාචක ක්‍රියා සැදේ.

(කර්තෘවාචක)	පාවයති	පිසවයි.
(කර්මවාචක)	පාව්‍යතෙ	පිසවනු ලැබේ.

ද මෙහි 157, 158 පිටුවල චුරාදි ගණික ධාතූන් හැන කී දෑ නැවත සිහිවනු.

අනීත කෘදනන. **පාවිත** (පිසවනලද), **කාරිත** (කරවන ලද), **ශ්‍රුපිත** (දන්වන ලද), **දූපිත** (දෙවන ලද),

පුළු ක්‍රියා. **පාවයිඩා** (පිසවා), **කාරයිඩා** (කරවා), **ශ්‍රුපයිඩා** (දන්වා)

තුමනන. පාවයිතුම් (පිසවන්නට), කාරයිතුම් (කරවන්නට), දූපයිතුම් (දෙවන්නට)

මෘ (මැරී යාමෙහි) යන ධාතුවෙන් **මරති** (මැරෙයි) කියා සැදේ. ඒ අකර්මක යි. එහෙත් **ණිජන්ත** රූපය වූ **මාරෙති** (මරයි) යන්න සකර්මක යි. **සෘ මෘගං මාරයති.** (හේ මුවා මරයි.) මෙසේ අකර්මක ධාතුව **ණිජන්ත** වීමෙන් සකර්මක වන බව දත යුතු.

ලවා යන අර්ථයෙහි බොහෝ සෙයින් තෘතීයාව ද කිසි තැනෙක ද්විතීයාව ද යෙදේ. **සෘ සූදෙන ඔදනං පාවයති.** (හේ අරක්කැමියා ලවා බත පිසවයි.) **ස භෘත්‍යෙන** (භෘත්‍යං) කටං **කාරයති.** (හේ දාසයා ලවා කළාලය කරවයි.)

ණිජන්ත ක්‍රියා සහිත වාක්‍යය කර්ම කාරකයට පෙරැළීමේ දී **ලවා** යන අර්ථය ලැබූ පදය ප්‍රථමා විභක්ති ගනී.

තෙන සූදෝ ඔදනං පාව්‍යතෙ (ඔහු විසින් අරක්කැමියා ලවා බත පිසවනු ලැබේ.)

තෙන භෘත්‍යෝ කටං කාර්‍යතෙ. (ඔහු විසින් දාසයා ලවා කළාලය කරවනු ලැබේ.)

යැවීම්, ඉගැන්වීම, දැන්වීම, කැවීම යන අර්ථ ඇති **ණිජන්ත** ක්‍රියා ඇති වාක්‍යයෙහි **ලවා** යන අර්ථයෙහි ඒතීයා විභක්ත වේ. **සෘ ජනාන් සඛ්‍යුම් ගමයති.** හේ ජනයන් ලවා සඛ්‍යුයට ගමන කරවයි. (ජනයන් සඛ්‍යුයට යවයි) **සෘ වෙදෙන් ශිෂ්‍යාන් වෙද ග්‍රාහි.** හේ වේදයන් සිසුන් ලවා දැන ගැන්ම කරවයි. (සිසුනට උගන්වයි.) **සෘ පුත්‍රුම් අත්‍රනං බාදයති.** හේ පුතු ලවා ආහාර වැළඳීම කරවයි. (පුතුට කෑම කවයි.)

ඉම් වාක්‍ය කර්ම කාරකයට පෙරළු විට මෙසේ යි.

තෙන ජනාෘ සඛ්‍යුං ගම්‍යතෙන

තෙන ශිෂ්‍යාෘ වෙදෙන් වෙද්‍යතෙන

තෙන පුත්‍රෘ අත්‍රනං බාද්‍යතෙ

අභ්‍යාසය.

(අ) සිංහලයට නඟනු.

1. යාචකඃ සටපුත්‍රෙභ්‍යරත්නානං ප්‍රතිග්‍රාහයති. 2. යදු'ක්තං ශෛශවෙ මාතුරනන්තරෙ අභ්‍රිඛම්, 'අනෙන ප්‍රොක්තමෙතද් වචනං තාන් දිවසාන් මාං සමාරයති. 3. ඉන්ද්‍රා මාතලිනා අර්ජුනං සවර්ම්මතාරයත්. 4. පාණ්ඩවකෙශරවාණාං යුධිෂ්ඨිර වාතතානතං සඤ්ජයො ධෘතරාෂ්ට්‍රමශ්‍රාවයත්. 5. පිත්‍රා'ඥප්තෙනා 'සෙන කුමාරඃ ප්‍රතිදිනං ධෙනූඃ ශතෙන අවාරයත් තාශ්ච ජලම පායශත්. 6. පිත්‍රා සුශීලඃ කුලීනො යුවා සවාං දුහිතරං විවාහ්‍යතෙ 7. සත්‍යාභිසන්ධො දශරථො රාඩ්‍රාමං වතුර්දශ වර්ෂාණි වනෙ ප්‍රාවාසයත්. 8. පාප්මානො ජනා සවයම්පි ප්‍රාණාන් ඝනන්ති පරෙරපි තාන් ඝාතයන්ති. 9. ක්‍රූරහර් තුර්දුශ්චරිතානි යොෂිතං ත්‍රෙපයන්ති. 10. ස ප්‍රාතරුත්ථාය ආශ්‍රමං ගත්වා තත්‍ර පංච පරිව්‍රාජඃ අභොජයත්. 11. පිතා පුත්‍රෙණ දරිද්‍රෙභ්‍යා ධනං දාපයති. 12. ස පිතෘන් සවයී මඝමයත්. 13. ගුරුශ්ශිෂ්‍යාන් වෙද මධ්‍යාපයති. 14. රාමෙ ඛ්‍රාහ්මණෙඃ පුත්‍රම්භ්‍යසෙවයත්. 15. ස ඛ්‍රාහ්මණෙභ්‍ය රාජානං ධනං යාචයති. 16. විදුෂා ඛ්‍රාහ්මණෙන රාජකුමාරො නීතිං බොධ්‍යතෙ. 17. විප්‍රා දශරථං යාගමකාරයන්. 18. රාමඃ සීතාං වනමදශීයත්. 19. නෘපතිඃ කවින් ප්‍රාසාදමාතාය්‍ය සම්භාව්‍ය ච කොශාධිකාරිණා නෙභ්‍යා ධනමදාපයත්. 20. ජනමේජයඃ දශීතං මාං සුඛමනුභාවයති. 21. භාර්‍යා විශ්ලෙ ෂිතඃ කශ්චිදුෂෂා මෙඝෙන සවප්‍රවෘත්තිං හාරයිතුමෙවශත්. 22. අල්පාපි වෘත්තිර්මහානර්තමප්‍යශ්නිං නිර්ව්‍යාපයිතුං ශක්නොති. 23. මෙකෙයා දශරථෙන රාමෙ වනං ප්‍රව්‍රාජිතඃ. 24. වනෙ සිංහ ව්‍යාඝ්‍රයොර්භීමානො මිගාන් සෙනාගා'නිලු බ්ධෙන ජම්බුකෙන විනාශිතඃ. 25. වායුනා පරිවර්ධිතෙන දවාග්නිනා වනෙ සවෙ ශ්වාපද උවෙජිතාඃ.

(ආ) සංස්කෘතයට නඟනු.

1. මේ ගොපල්ලන් ලවා කිරි දෙවී ය. 2. ජලය තෙමේ ආත්මය නො තෙමයි, සුළඟ එය නො වියලයි, ගින්න ද එය රත් නො කරයි. 3. ජනක රජ රාමයා ලවා සීතාව පාවා ගැන් වී ය. 4. ළමයා මල් නෙලා කූඩයේ තැබී ය. 5. වසිෂ්ඨ තෙම දින පතා රජු ලවා යාග කැරැවී ය. 6. වෘෂභය තෙම මුදුනෙන් දූනි උළෙහිය විදිම්නුත් තමා ඇසිරූ කරන්නවුන් මේ

උණය සීය සෙවනීන් සංසිදුවයි. 7. සූයි තෙමේ විල්හි නෙලුම්මිල් පුප්වයි. 8 අදුරෙහි සිටි මුදුන ඝුන් තලගස ගසෙයකු මෙන් ජනයනට (ජනානාං) භය උපදවයි 9. මෙඝ කරුවනි, ත්‍රිමඝයන් පිසිත වූ තොප සොඹියා සිසිල් දියෙන් නාවවු. 10. සත්පුරුෂයෝ තමන්ගේ (ආත්මනඃ) ගුණයන් තුමූ ම හෙළි නො කෙරත් 11. පියා විසින් පුත්‍රයා ගොවි තැන් උගන්වනු ලැබේ. 12. පුතුන් විසින් මව්පියවරු සුවයි යට යවන ලදහ. 13. මෙහෙකරුවන් ලවා මේ වත්ත ඉඩ කරවවු. 14. ශෝකයෙන් ආතුරවූ මා සතුටු කරනට යුඝතා කොසේ නම් හැක්කෙහිද? 15. හේ සිහන්නා ලවා රජ (ගෙන්) ධනය ඉල්ලවී ය. 16. මා විසින් කරවනලද ගෙහි ගෙතෙම් සිය පුතුන් වස්වා ගමට ගියේ ය 17. පොරෝ වලින් කපා මේ ගස් ගෙලා ලිය යුතු. 18. මහර්ෂි තෙම පිටත් වුණු රජ කුමරුන් දැක චිත්‍රකූටයෙහි රම්‍ය ආශ්‍රමයට ඔවුන් ලවා පෙරලා ආයේය 19. ඔහු ලවා මගේ පුත්‍රයා මේ නුවර සියල් ලන් ගෙන් ඉතා ම උසස් තැනැත්තා කරවව. 20. භාග්‍යයෙන් යුකතයා ගෙලන්නට නො සිතමු.

---

52 පාඩම.

යඬන්ත

නැවත නැවත හෝ අතිශයයෙන් යමක් කිරීම හඟවන ක්‍රියාපද යඬන්ත නම්.

කතෘවාචකාඛ්‍ය a. ධාතුවට පර ව ශ ප්‍රත්‍යයය යොදා ධාතු වේ මූල් ව්‍යංජනයට ඒක කරනු ලැබේ.
b. අභ්‍යාස භාගයේ සවරය අ යන්නෙක් නම් එය දික් වේ. ඉ ආදී සවරයෙක් නම් ඒව ගුණ වේ. බෙහෙවින් මීට එක්වනුයේ ආත්මනේපද ප්‍රත්‍යයයෝ ය. [c. හම් ආදී සමහර ධාතූන්ගේ අභ්‍යාස භාගයෙන් පරව අනුනාසිකයෙක් වේ.]

නිදසුන්.

	ලප්.	දීප්.	ගම්.
a.	ලලප්ය	දිදීප්ය	ජඟම්ය
b.	ලාලප්‍ය	දෙදීප්‍ය	c. ජඞ්ගම්‍ය

ලාලප්‍යතෙ. නැවත නැවත හෝ බොහෝ සෙයින් දෙඩයි.

දෙදිප්‍යතෙ. අතිශයයෙන් බැබළේ.

ජඞ්ඝම්‍යතෙ. බොහෝ සෙයින් ගමන් කෙරෙයි.

කර්මවාචක රූප. ආත්මනෙ පද ප්‍රත්‍යයයන් එක් කොට සාදන ඝඩන්තරූපය ම කර්මකාරකයේ ද යෙදේ. **තෙන සෙධ්‍යතෙ.** ඔහු විසින් බොහෝ සෙයින් ඉසිනු ලැබේ.

කෘදන්ත රූප: දෙදිප්‍යමාන (බොහෝසේ බබ්ලන) **ජංඝම** (නිතර පාගේ ඇවිදින)

සන්නන්ත

ඉවර්ති (කැමැතියි යන අර්ථ ඇති) ක්‍රියා **සනන්තන්ත** නම්.

සනාදාවාවකාඛ්‍ය. a ධාතුවට **ස** ප්‍රත්‍යය එක් කොට ධාතුවේ මූලකුර ඒකි කිරීමෙන් **සන්නන්ත** අංගය ලැබේ. b. ධාතුව **සේව්** නම් **ස** ප්‍රත්‍යයට මුලින් **ඉ** යන්නෙක් එක් වේ. c. අනිව් නම් එය නො වේ. d. ධාතුවට විකු වූ කල අභ්‍යාස භාගයේ අ යන්නෙක් වී නම් එය **ඉ** කාරබවට පෙරළේ. e. ස්වරයෙන් පටන් ගැනෙන ධාතුවෙක් නම් ඒ මුල් ස්වරයෙන් පසුවූ ව්‍යංජනයට විකු ව අභ්‍යාස භාගයට **ඉ** යන්නෙක් එක් වේ.

උදාහරණ.

සේව්	**අනිව්**	**ඝඩාදිම (සේව්)**
පඨ්	තන්	අව්
පඨ් + ස	තන් + ස	අව් + ස
a. පපඨ් + ස	a. තතන් + ස	e. අවිව් + ස
b. පපඨ්ඉ + ස	c. තතන්ස	b. අවිව්ඉස
d. පිපඨ්ඉස	d. තිතන්ස	e. අවිඉව්ඉස
පිපඨිෂ	තිතංස	අවිවිෂ

ප්‍රත්‍යයන් එක්ව පිපඨිෂති, තිතංසති, අවිවිෂති ආදිය වේ. **පිපඨිෂති** (කියනු කැමැති වේ.) **තිතංසති** (පතුරුවනු කැමැති වේ.) **අවිවිෂති** (ඇවිදිනු කැමැති වේ.) **චිකීර්ෂති** (කරනු කැමැත්තේය.) **පිපාසති** (බොනු කැමැත්තේය.)

කම්වාචකාඛ්‍ය සනන්තත කතෘවාචකාංගයට ය විකරණය එක් කොට අංගාදාත අ කාරයට ලොප් කොට ආත්මනෙ පද ප්‍රත්‍යයයන් එක් කිරීමෙන් කම්වාචක ක්‍රියාරූපය සැදේ. පිපයිෂ යනු අංගය යි. **පිපයිෂ්‍යතෙ** ආදීන් එහි කම්වාචක රූප වේ.

'ත' ප්‍රත්‍යයාන්ත: විකිර්ෂිත, පිපාසිත, බුභුක්ෂිත

'තුම්' ප්‍රත්‍යයාන්ත: විකිර්ෂිතුම්, පිපාසිතුම්, බුභුක්ෂිතුම්

පූර්ව ක්‍රියා: විකිර්ෂිත්වා, පිපාසිත්වා, බුභුක්ෂිත්වා

සන්නන්ත නාම. සන්නන්ත අංගයට උ කාරය යෙදීමෙන් සන්නන්ත නාම සැදේ. විකිර්ෂ + උ=විකිර්ෂු. පුංලිංගයේ ගුරු ශබ්දය මෙන්ද ස්ත්‍රීලිංගයේ බෙනු ශබ්දය මෙන් ද නපුංසකලිංග ලේ මධු ශබ්දය මෙන් ද වර නැගේ. සකර්මක ධාතූන්ගෙන් හැදෙන මේ වගීයේ කෘදන්ත නාම සමග කර්ම විභක්තියෙන් සිටී. ජලං පිපාසුඃ (දිය බොනු කැමැත්තා). පාඨං පිපඨිෂුඃ (පාඩම් කියනු කැමැත්තා). නදීං තිතීර්ෂුඃ (නදිය තරණය කරනු කැමැත්තා). අ ප්‍රත්‍යය එක් කිරීමෙන් සන්නන්ත භාව නාම සැදේ. විකීර්ෂා (කරනු රිස්ස), පිපාසා (බොනු රිස්සා), පිපඨිෂා (කියනු රිස්ස), බුභුක්ෂා (කනු රිස්ස). මේ ආකාරාන්තයෝ කන්‍යා ශබ්දය මෙන් වර නැගෙන ස්ත්‍රීලිංගිකයෝ යි.

අභ්‍යාසය.

(අ) සිංහලයට නගනු.

1. මුමූර්ෂුණේසජම්ව මා ත්වං පෙෂරුෂං ජහාහි. 2. රාජන්, යදි ත්වං එතාං ක්ෂිතිමධෙනුං දුඩුක්ෂසි, තර්හි අවූං ලොකං වත්සමිව ප්‍රභාණ. 3. මෘතස්‍ය ලිප්සා ච කෘපණස්‍ය දිත්සා ච න මයා දෘෂ්ටපූර්වා. 4. ස නාමා සාගරං තිතීර්ෂති. 5. අසිතෝ බෝධිසත්ත්ව දිදෘක්ෂයා කපිලවාස්තුමගවත්. 6. ශාක්‍යාඃ කොලියාශ්ච ස්‍රුග්ඝ්‍යසවෙඃ රොහිණ්‍යා නද්‍යා උභයෙ සතීරයෙඃ සන්නද්‍යාපතන්. 7. රාමෝ ලංකාං ජිගම්ෂුඃ සමුද්‍රෙ සෙතු මබධ්නාත්. 8. සංසාරසාගරං තිතීර්ෂවෝ සම්‍යක් සම්බුබෝධයිෂවං මාගීමනුජිගම්ෂවෝ. 9. සමෙ ජනතවෝ නිසඛීතඃ ඉෂවමඹිප්සවෝ, අනිෂවං පරිජිහීර්ෂවෝ. 10. මායාදෙවී ශාල වෘක්ෂමූලෙ සථිතා වෘක්ෂස්‍ය ශාඛාං නිනාමයිෂුදක්ෂිණංහස්ත මුදඤ්ජයත්. 11. ඉමං ස්‍රුග්ඝ්‍යුං බාලකං ප්‍රෙඛායාං නිඛාය යාවත්තිදිවංගම මාසෙකුලය. 12. ශාස්ත්‍රමධ්‍යෙතුං තත්‍ර වුමිත්‍රයං

නිව්වත්‌ත්‍යෑ ස ආඩ්ගලිපම්ගමත්. 13. පංජරබ්ඩෑ සකුණෝ
මුඹුක්‍කුරුත්පතති. 14. ගුරුණාම්වම්‍යාදම්චිකිර්ෂුස්සමූණ්ඩා
ජක්‍ඛ්ල්ප්‍යතෙ. 15. ව්‍යාඝ්‍රෝ මාංසං ජ්‍යගිල්‍යතෙ. 16. බුඩ
ඝෝෂස්‍ය සාම්ප්‍යං දර්‍ශයිතුම්වඡ්‍ඡන්හිණ්ඩා තල්ලිඛිතෙ ග්‍රන්ථෙ
අවෙච්‍යත. 16. රොගාතෝ'යං දුරතෑ ගෘහං ප්‍රවිඡ්‍ය
ඝොෂුප්‍යතෙ.

(අ) සංස්කෘතයට නඟනු.

1. තෙතෙඊ න්‍යායෙ දර්‍ශනාදිෂ උගනු කැමැත්තේ බර
ණෑසට පිවත්ව ගියේ ය. 2. අපි මෙහි බිම්බෑ මැටුණු ගෙඩි.
එකතු කරනු කැමැත්තම්හ 3 ඔහු ගේ ශ්‍රුඩ කිරීමේ ආශාව
තව ම දුරු නොවී ය. 4. ඔව්හු ඛණ අසනු කැමැත්තෝ නිතර
මෙහි එති. 5. දෙනු කැමැත්තෙන් මෙහෙයුණු ඒ ධනපති
තෙම ශාවකයනට අන්නපාතාදිෂ බොහෝ සේ දෙයි. 6. සතු
රන් නසනු කැමැත්තෙහි තම් පළමුකොට තමන් තුළ වූ රාගාදී
සෙලඟ සතුරන් නසව. 7. එහි ගෘහවල පළිහුම්වා හිත්තින්හි
ගැටුණු සදරුස් අතිඝ්‍රින් බබලයි. 8. ඒ ළමයි කවපාඩම්
කර ගනු කැමැත්තාහු පාඩම් නැවත නැවත කියත්. 9.
දියේ වැටුණු වලල්ල සොයන්නේ හේ නැවත නැවත නදියෙහි
කිම්දෙයි. 13. ඔවුහේ මරණය විවින් විට සිහි කෙරෙමින් ඒ
ළදරිය නැවත නැවත හඬයි.

නාඹධාතුක ක්‍රියා

නාම්ය ම ධාතුවක් සහාව ගෙන සාදන ක්‍රියා මෙයින් අභි
ප්‍රෙත යි. 'මෙන් හැසිරේ' 'කැමැති වෙයි' ආදි නොයෙක් අර්
යන්හි ෂ ප්‍රත්‍යය එක් කරනු ලැබේ.

ෂ පර කල්හි නාම්යේ අග අ හෝ ආ යන්න ඊ බවට
පෙරැළේ. ඉසට ඉ, උ දිස් වේ. ඍ කාරය ඉ කාර බවට
පෙරැළේ. ඔ කාරය අව් බවට ද, ඖ කාරය ආව් බවට ද
පෙරැළේ. පදාන්ත අනුනාසිකයට ලොප් වේ. මේ හැර තවත්
වන වෙනස් කම් පහත දක්වෙන නිදසුන් වලින් සිතට ගත යුතු.

පුත්‍ර	පුත්‍රීයති	පුතකු පතයි.
වෘෂ	වෘෂීයති	ගොනකු ලබනු කැමැති වෙයි.
කවි	කවීයති	කවියකු වනු කැමැති වෙයි.
ශෝ	ශව්‍යති	ගවයන් පතයි.

රාජන්	රාජ්‍යති	රජකු පතයි.
දිව	දිව්‍යති, දිව්‍යති	සවඟිය පතයි.
මධු	මධ්‍යති, මධ්‍යති	මී කැමැති වෙයි.
දධි	දධ්‍යති, දධ්‍යති	දිහි කැමැති වෙයි.
වෘෂ	වෘෂ්‍යති	ගොනකු පතයි.
අශ්‍ව	අශ්වෂ්‍යති	අසකු පතයි.
ක්ෂීර	ක්ෂීරෂ්‍යති	කිරි පතයි.
ලවණ	ලවණ්‍යති	ලුණු ලෙව කනු කැමැති වෙයි.
තපස්	තපස්‍යති	තවුස් දම් කෙරෙයි.
නමස්	නමස්‍යති	වඳියි.
යශස්	යශස්කාම්‍යති	යශස පතයි.
කෘෂණ	කෘෂණ්‍යයතෙ	කෘෂණමෙන් කෙරෙයි.
ශබ්ද	ශබ්දයතෙ	ශබ්ද කෙරේ
උන්මනස්	උන්මනායතෙ	කැලඹූ සිත් ඇති වෙයි.
සුඛ	සුඛායතෙ	සැප විඳී.
සත්‍ය	සත්‍යාපයති	සත්‍යය හෙළි කෙරෙයි.
අර්ථ	අර්ථාපයති	තේරුම් හෙළි කරයි.
වෙද	වෙදයති	වේදය උගන්වයි.

කර්මවාචක ක්‍රියා.

නාමධාතුක අංගයට ආත්මනෙ පද ප්‍රත්‍යයයන් එක් කිරීමෙන් එහි කර්මකාරක ක්‍රියා රූපය සැදේ. නමස්‍යතෙ. වඳිනු ලැබේ.

අභූත තද්භාවය.

පළමුවෙන් නො වූ ප්‍රකාරයක් වීම අභූත තද්භාව නම්.

මේ අර්ථයෙහි භූ, කෘ ධාතූනට පුළුවූ කාමයා ගේ අග අවණ්ය ඒ කාර බවට ද, ඉ හෝ ඊ කාරය දීඝී බවට ද ෂෘ කාරය ෂී කාර බවට ද පැමිණේ.

කෘෂණ (කළු) කෘෂණී භවති (නො කළු වූයෙක්) කළු වෙයි.
කෘෂණී කරොති. (නො කළු ව තුබුණ දැයක්) කළු කරයි.
කෘෂණී භූත (කළු වූ)
කෘෂණී කෘත (කළු කරනලද)

ශුචි (ශුච) ශුචි භවති (මූල දී ශුච නොවී තිබී) ශුචිවේ.
ශුචි කරොති (මූල දී ශුච නො වූවක්) ශුචි කෙරෙයි

ලඝු (කොට) ලඝු භවති. (කොට නුවූයෙක්) කොට වෙයි.
ලඝු කරොති. (කොට නො වූවක්) කොට කරයි.

මාත්‍ර මාත්‍රි භවති (පූර්‍වයෙන් මව් නො වූයෙක්) මව් වෙයි. මාත්‍රි කරොති. (මව් නො වූවකු) මවක කරයි.

2. අරුස්, මනස්, චක්‍ෂුස්, වෙතස්, රහස්, රජස් යන මොවුන් ගේ අන්‍තය ද, න් කාරාන්‍තයා ගේ අන්‍ත්‍ය න් කාරය ද ලොප් වේ. ඉක්බිති ඉතිරි සවරය උඩ දුන් නීති අනුව වෙනස් වේ.

අරුස්. (අරු) අරු භවති. (වණ වෙයි)
අරු කරොති. (වණ කරයි)

බ්‍රහ්මන්. (බ්‍රහ්ම) බ්‍රහ්මී භවති. (බ්‍රහ්ම නො වූවෙක්) බ්‍රහ්මයෙක් වේ.
බ්‍රහ්මී කරොති. (බ්‍රහ්ම නො වූවකු) බ්‍රහ්මයකු කරයි.

3. නිපාතයනට පර ව ද භූ කෘ ධාතු මේ අර්‍ථයෙහි යෙදේ.

බහිඃ බහිර් භවති. පිට වෙයි.
බහිර් කරොති. පිට කෙරෙයි.

(අ) සිංහලයට නගනු.

1. උද්‍යතෙ විහංගශාබකාශ්චුඞ්කුර්‍වන්‍ති. 2. කිමයං ශබ්‍ද ඉතෙ?. 3. ඝත්‍රැමුන්මූලයෙත් ප්‍රාඥස්තීක්ෂ්ණං කීක්ෂ්ණෙන ඝත්‍රැණා 4. එහි වාමහං ශුඞ්කරොමි. 5. තස්‍ය ගදීහොඃති භාරවහනාදුර්බලො මූර්‍ඡුරහවත්. 6. කොඃපි ශස්‍යරක්‍ෂකොඃ ධූසරකම්බලකෘතතත්‍රාණො ධනුඃකාණ්ඩං සජ්‍යීකෘත්‍යාවතත කාණයා එකානෙත සථිතඃ. 7. විද්‍යුපරික්‍ෂාවිකීර්‍ෂවො තෙ ව්‍යාඝ්‍රාසථිනි සමාසාද්‍ය ව්‍යාඝ්‍රං ජීවයිතුං යතනං චක්‍රුඃ. 8. එකද මගධාධිපතිඃ මාලවෙන්‍ද්‍රං මානසාරං ජිගීෂුර්මහතා බලසම්භාරයෙන සංග්‍රාමභූම්මවාතරත්. 9. ස තස්‍ය නදස්‍ය පශ්චිමතීරෙ කාසම්ඃ ශ්චිත් ඝුවෙෂ ලතාමණ්ඩපෙ තාම්වාසයත්. 10. අනඝිඥෙ භවාන් සෙවාධර්‍මස්‍ය, තත් කථමෙනං වශීකරිෂ්‍යසි. 11. කිං සවාමිපාදන මශ්‍රෙ'සතස්‍යං විඥප්‍යතෙ? 12. දුඃඛ වෘෂභ, සවාමි පිඞ්ගලක ස්වාමාකාරයති. 13. සවාමිප්‍රසාදරහිතෙෂ භෘත්

සෝමකණ්ඩෙන කරවකදම්භකෙන මන්ත්‍රයෙතෙ. 14. යදා කස්‍යවිදෙදුවං ප්‍රත්‍යකූලමස්‍ති තදා තස්‍ය බන්ධවෝ මිත්‍රාණි ච විපක්ෂීභවන්ති. 15. සවේ පක්ෂිණ එකචිත්තීභවෙයුඃ, ඉදං ජාලං ච හෘත්වා උඩ්ඩයෙරන්. 16. ශකටානාං ධුර්‍ය්‍ය නියුක්තා වෘෂභා අන්‍යෙභ්‍යඃ සාධාරණ වෘෂභෙභ්‍යඃ පිවරතරා සන්ති. 17. පුත්‍ර දර්‍ශනෙන මාතෘහෘදයං ද්‍රවීභූතම්. 18. මාගේ පදවී ඛලූ තෙ විෂමීභවන්ති. 19. ඝ තුරගඝම්පඝ්ටපතනානාං රුවිර කලාපමම්ලූරං බාණලක්ෂ්‍යීවකෘර. 20. අසම්ං නිපතිතාමම දෘවිපාකපරායතෙ. 21. පත්‍යා ඝරණී හෘණීයතෙ? 22. ගාත්‍රාණි ශිථිලාඝන්නෙන තාපෙණෙකා තරුණායතෙ. 23 ඝ මාඝඃ ඝාසපඝීනීමිලිතාක්ෂිං මෘගීං ඝාඛෙතකා ඛඩ්ඩයත. 24. ඝ ප්‍රාරිප්සිතස්‍ය ග්‍රන්ථස්‍යාවිඝනපරිඝමාපනාඝෙ ප්‍රාගෙව බුබං තමඝ්‍යති.

(ආ) ඝංස්කෘතයට නඟනු.

(කළු අකුරින් ඇති පද නාමධාතුක ක්‍රියාගෙන් හෝ අභූත තද්භාවාර්ථ වාචක ක්‍රියාගෙන් තැනට සුදුසු සේ ගොදනු.)

1. තමා ගෙන් සිය පුතු වෙන්වීමේ දී මවගේ සිත ශෝක ගෙන් දියවෙයි. 2. වර්ෂා ඍතුගෙහි වලාකුල් කැළඹී වෙති. ඝන වෙති) නමුත් සැඩ සුලඟින් විසිරුවනු ලැබෙත්. 3. කපට ගහළුවන් විසින් කරනලද බොරු සතුති ඇති ඔතවත් මූර්ඛයා තමා පණ්ඩිතයා කොට සිතයි. 4. ඉඳුජිත්හුගේ මරණය අසා රාවණ තෙම නොසතුටු සිතැත්තේ වී ය. 5. කාම සැපයට පිළිකුල් කරන තුවණැත්තෝ වන වැද තපස් කරන්නාහු මිනිසුන්ගෙන් පිරුණු නගර අතු හොහොන් සේ සල කති. 6. නිදිමරන්නහුට රාත්‍රිය ද, විඛාපත් තැනැත්තහුට ගොදුන ද දික් ව හැඟේ. 7. මව ගෙන් වෙන් වූ ලදරුවාට දවස වර්ෂගෙක් ව පෙනේ. 8. ක්‍රොධය සිත කිලිටු කරයි, මුහුණ විරූප කරයි. 9. සියලු උපද්‍රව මලකනු කැමැත්තෙන් හේ දෙවියනට බෙහෝ ඔහුති කරයි. 10. ප්‍රියාවගේ මරණයෙන් හටගත් ශොකය පෙන්වනු නො කැමැත්තේ හේ සිත දැඩි කෙළේය.

(ඉ) සිංහලයට නඟනු.

1 ආත්මනඃව පරෙෂාඤ්ච-යඃ ඝමීක්ෂ්‍ය බලා බලම්
අනන්තරං නෙවජානාති ඝ තීරස්ක්‍රියතෙ'රිභිඃ

2 ඉඝ ලොකෙ හි ධනිනාං-පරෙ'පි ඛවජන්‍යඃතෙ
ඛවජනෙ'පි දරිද්‍රාණාං-ඝපීද, දුර්ජීන්‍යඃතෙ

3 දූෂයං වෛදිකං කර්ම-ත්‍රිජාතදීයති සම සඃ
ආත්මජෙන තතො යුඩෙ-වාසවං වාප්‍යපිඛයත්

4 තදිය තරුරත්නානි-ප්‍රකරාතාශය කිංකරෙඃ
සථාපයිත්‍වා තු ලඞ්කායාමවසවඩ විරාය සඃ

5 අථාගතිරුපිතඃ කශ්චිද්-ගෘහීත්වා පාශසං වරුම්
එතත් ප්‍රාශය පත්නිස්තම්භිත්‍යුකත්වා' දානෘපාය සඃ

6 භුඛරං තං සමුත්පාට්‍ය-ගෘහීත්වා පුනරාගතඃ
තාසාං ගතෙන වෛ සථීන්-රාසවාදිනජීවයත්

7 තවිදිත්වා'ථ වාල්මීකිරාතිගෙතාං නිජාශ්‍රමම්
අනතථීර්තතීං සමාශවාස්‍ය-තත්‍රෙවාවාසයත් සුඛම්

8 සුහෘදි නිරනතරවිතෙන-ගුණවති භෘතේ‍ය'නුවර්තතිනී
කලත්‍රෙ
සාමිනි සෙෂහෘදයුකෙත-නිවෙද්‍ය දුඃඛං සුඛීභවති

9 අලකතකො යථා රකෙතා-නිෂ්පිඛ්‍ය පුරුෂසතථා
අබලාභිඃ ලාඤකතඃ-පාදමූලෙ නිපාත්‍යතෙ

10 කුලපතනං ජනගහීං-බඞ්ගනමපි ජීවිතව්‍යසඤෙහම්
අඞ්ගීකරොති කුලටා-සතතං පරපුරුෂසංසකතා

11 අත්‍රානතරෙ නිවිඩමාසිතබොධිමූල
මාවෙගවාතහිඞ්ෂෙණයිශුර්මුනීන්ද්‍රම්
අධ්‍යාස්‍ය මත්තකරිණං ගිරිමෙඛලාඛ්‍ය
මාහුතසෙන්‍යනිවහො නිරගාදනඞඃ

12 එකොපි විස්ඵුරිත මණ්ඩලචාපචක්‍රං
කඃ සිඤ්චුරාජමභිෂෙණයිතුං සමර්ථඃ

13 වහ්නිස්තභ්‍යජලායතෙ ජලනිධිඃ-කුල්‍යායතෙ තත්ක්ෂණා
තෙමරුඃ සථලපාශිලායතෙ මෘගපතිඃ සද්‍යඃ කුරංගායතෙ

ව්‍යාලො මාල්‍යගුණායතෙ විෂරසඃ-පීයූෂවච්ඡායතෙ
යස්‍යාංගෙ ඛිලලොකවල්ලහතමං ශීලං සමුන්මීලති

51

ආඛ්‍යාත විභක්ති.

ආඛ්‍යාත විභක්ති දශයෙකි.

ලට්, ලිට්, ලුට්, ලෘට්, ලෝට්, ලඩ්, විධිලිඩ්, ආශීර් **ලිඩ්, ලුඩ්, ලෘඩ්** යනු ඔවුනට ව්‍යවහාර නම් ය.

මොවුන් ගෙන් මේතාක් දැක්වුණේ **ලට්, ලෝට්, ලඩ්, විධිලිඩ්** යන සතර පමණෙකි. ධාතුගණ වෙන් කරන **විකරණ** ප්‍රත්‍යයයන් එක් වනුයේ මොවුනට පමණ ය. අනිත් විභක්තීන් සඳහනාට ඒ විකරණ එක් නො වේ.

ලට්.

තමා ගේ ඉන්ද්‍රියගතට හමු නො වූ අතීතයේ වූවක් හැඟවීමෙහි මේ විභක්ති යෙදේ. සිංහලයට නැගීමේදී ක්‍රියාව අගට **ලු, ල** යන ප්‍රත්‍යයයන් යෙදීමෙන් මෙහි අදහස හැඟවේ. **'දුන ඝනි ල, දුන ඝනි ලු'** ආදි වශයෙනි.

විභක්ති ප්‍රත්‍යයයෝ.

	පරස්මෛපද.			**ආත්මනෙ පද.**		
	එ.	**බ.**		**එ.**	**බ.**	
ප්‍ර.	**අ**	**අතුස්**	**උස්**	**එ**	**ආතෙ**	**ඉරෙ**
ම.	**ථ**	**අථුස්**	**අ**	**සෙ**	**ආථෙ**	**ධ්වෙ**
උ.	**අ**	**ව**	**ම්**	**එ**	**වහෙ**	**මහෙ**

ධාතුවට මේ ප්‍රත්‍යයයන් එක් කිරීමේදී පහත සඳහන් උප දෙස් සිහි කළ යුතු.

1. ධාතුවේ මූලකුරට විඳ වේ.

2. **ව්‍යංජනාදි** (ව්‍යංජනයක් මූලට ඇති) ප්‍රත්‍යයන් පර කල්හි **ෂෙව්** ධාතුව අගට **ඉ** යන්නෙක් එක් වේ (**ෂෙව්, ෂෙවිව්, අනිව්** ධාතු යනු 131 පිටේ 114 අංකයේ තෝරා දී ඇත.)

3. මෙහි පරස්මෛපදී **එකවචන** ප්‍රත්‍යයයන් පමණෙක් **සපිත්** ය. ඔවුන් පර කල්හි **භලන්ත** ධාතුවේ අන්ත හල් කුරට පුළුල් වූ හ්‍රස්ව **ඉ, උ, ඍ** කාරයනට ගුණ ද අකාරයට වෘඩි ද වේ. ධාත්වන්තය **ආ** කාරයෙක් වී ය. ම් එය ඔ කාර බවට පැමිණේ අන් සවරයෙක් ධාත්වන්තය වී නම් ඊට වෘඩි වේ.

බුධ. u (දැනගැන්මෙහි)

පරස්මෛපද.

	එ.	බ.	බ.
ප්‍ර.	බුබොධ	බුබුධතුඃ	බුබුධුඃ
ම.	බුබොධිථ	බුබුධථුඃ	බුබුධ
උ.	බුබොධ	බුබුධිව	බුබුධිම

ආත්මනෙ පද.

	එ.	බ.	බ.
ප්‍ර.	බුබුධෙ	බුබුධාතෙ	බුබුධිරෙ
ම.	බුබුධිෂෙ	බුබුධාථෙ	බුබුධිධ්වෙ
උ.	බුබුධෙ	බුබුධිවහෙ	බුබුධිමහෙ

බුධ් ධාතුවට විඩ වූ විට බුබුධ් කියා වේ. අ ප්‍රත්‍යයාදිය පර කල්හි අනක හල්කුර වූ ධ් යන්තෙන් පුළු වූ ඳ් යන්නට ගුණ ව බුබොධ කියා සිඛ විය. බුබුධ් + අ=බුබොධ් + අ=බුබොධ.

මෙය සෙට් ධාතුවෙකි. එබැවින් උඛ අංක 2 දරන උප දෙස් අනුව ථ, ව, ම ආදී ව්‍යංජනයක් මූලට ඇති ප්‍රත්‍යයයක් පර ව සිටි තන්හි ඉ කාරයක් එක් ව බුබොධිථ, බුබුධිව, බුබුධිම යන ආදිය සිඛ විය.

අර්ථ.

(සඃ) බුබොධ. (හේ) දැන ගත්තේ ලු.
(තම්) බුබොධිථ. (තෝ) දැන ගත්තෙහි ලු
(අහම්) බුබොධ (මම්) දැන ගත්තෙම් ලු=මා දැන ගත් තැ සි අන්‍යයෙක් කියයි.

මේ නයින් සෙසු පදයන්හි ද අර්ථ උගත යුතු යි. උත්තම පුරුෂයෙහි මෙය යෙදෙනුයේ කලතුරෙකිනි.

සමහර ධාතුහු මේ ක්‍රමවලට වෙනස් ව වර තැගෙති.

(a) අවණ්ණන්ත ධාතු හැර දීඝ ස්වරයක් මූලට ඇති ධාතු ද බැඳි අකුරුවලට මුලින් ඉවණ්, උවණ්, ඍවණ් ඇති ධාතු ද (සාළ්ජ් හැරයි) ඒ කාර ඔකාරාන්ත ධාතු ද, (b) දශම ගණික ධාතු ආදින් ගේ අශ භාගාන්ත අංග ද, (c) දශ්, අශ්, සාශ්,

ආස් යන ධාතු ද යන මොවුනට අගින් ආම් ප්‍රත්‍යය එක්ව ඉන් පසු කෘ, භූ හෝ අස් ධාතුවේ ලිව් රූපය එක් වේ. ධාතුව පරස්මෛපදී නම් කෘ ආදීන් ගේ පරස්මෛපදී රූපය ද, ධාතුව ආත්මනෙ පදී නම් කෘ ධාතුවේ ආත්මනෙ පදී රූපය ද ආම් භාගයට පර ව සිටී. භූ, අස් ධාතු දෙකේ සෙදීමේ මෙ සේ වෙනසක් නැත. (d) උෂ්, විද්, ජාගෘ, හි, ස්‍ථි, හෘ, ෂ්ණු, දරිද්‍රා යන ධාතූහු උඛ දූක්වූ ක්‍රම ඉදකට ම වර නැගෙත්. ආම් ප්‍රත්‍යයයෘ පර කල්හි විද් ධාතුව හැර සෙස්සන් ගේ සවරයට ගුණ වේ. (e) නවම ගණයට අයත් ධාතුවෙක් නම් ආම් ප්‍රත්‍යයයට පුථියෙහි ද විකරණයට පැමිණ සිටී. සෙස්සෝ එසේ නොවෙත්.

කථ් (අංගය. කථය)

පරස්මෛපදයෙහි

	එ.	මී.	බ.
ප්‍ර.	කථයාංචකාර	කථයාංචක්‍රතුඃ	කථයාංචක්‍රුඃ
ම.	,, චකර්ථ	,, චක්‍රථුඃ	,, චක්‍ර
උ.	,, චකාර	,, චක්‍රිව	,, චක්‍රිම

ආත්මනෙ පදයෙහි

ප්‍ර	කථයාංචක්‍රෙ	කථයාං චක්‍රාතෙ	කථයාං චක්‍රිරෙ
ම..	,, චකෘෂෙ	,, චක්‍රාථෙ	,, චකෘඞ්වෙ
උ.	,, චක්‍රෙ	,, චකෘවහෙ	,, චකෘමහෙ

'කථයාංබභූව, කථයාමාස' ආදි වශයෙන් හෝ වර නගනු.

ධාතු සඵලපයෙක ප්‍රථම පුරුෂ ඒකවචන පමණෙක් දෙනු ලැබේ. ඒ අනුව සෙසු රූප ද සොයා ගත යුතු.

ධාතුව		ලිව් ප්‍රථම පුරුෂ ඒකවචනය.
(A)	ඊහ්. a	ඊහාං චක්‍රෙ, ඊහාම්බභූව, ඊහාමාස
	උන්ද්. p	උන්දාං චකාර, උන්දාම්බභූව, උන්දාමාස
(B)	කථ් (කථය) P	කථයාං චකාර, කථයාම්බභූව, කථයාමාස
(C)	දය්. a.	දයාං චක්‍රෙ, දයාම්බභූව, දයාමාස
	ආස්. a,	ආසාං චක්‍රෙ, ආසාම්බභූව, ආසාමාස
(D)	උෂ්. p.	උවොෂ, ඔෂාංචකාර, ඔෂාම්බභූව, ඔෂාමාස
	විද්. P	විවෙද, විදාංචකාර, විදාම්බභූව, විදාමාස
(E)	භි. p	බිභාය, බිභයාංචකාර, බිභයාම්බභූව, බිභයාමාස

කම් වාචක ක්‍රියා.

ලිවී විබක්තිහි කම් වාචක ක්‍රියා රූප එහි කර්තෘවාචක ආත්මනෙ පද රූප මෙනි. බුබුඤ (දැනගන්නා ලද්දේ ල) පෙසව (පිසන ලද්දේ ල), චෙතෙන (පතුරුවන ලද්දේ ල) ජඤඤෙ (ගන්නා ලද්දේ ල), කථයං වත්‍රු, කථයාමාසෙ, කථයං බභූවව (කියන ලද්දේ ල.)

අභ්‍යාසය.

(අ) සිංහලයට නඟනු.

1. චතුර්දික්ෂු වායුජීවෙන. 2. දූරිකා උද්‍යානං ගත්වා උද්‍යානපාලං එලානි ගයාවෙ. 3. මාධවනමාකර්ණ්‍ය සභේ ජනාඃ සකොපා බභූවුඃ 4. මාතුලොඃපි තාන් සවගෘහමාගතාන් දරිද්‍රානවලොක්‍ය න සඞ්ගෘහ්‍යාමාස. 5. තතසෙ මාතෘදූමං වත්‍රුඃ. 6. සිමෙන රාඥ ධරාං ඔවිඤ්ඡතා කලා දපරෙ රාජා සවදුහිතුඃ සදෘශොෙ න දදෘසෙ 7 සා රාජදුහිතා සරොවර මෙකමවතීර්‍ය තත්‍ර රාජහංසං දෂ්ටවාඔඛුජං දෘෂ්ටිවා ක්‍රීඩාර්‍ථං ක්ෂිපෙත්තතරීයා තං බබන්ධ. 8. ස දුර්විණීතඃ කුමාරඃ පිතුරග්‍රජස්‍ය ච ශාසනමතික්‍රම්‍ය භුවං බභ්‍රාම. 9. මාලවෙන්‍ද්‍ර ශ්‍රුත්වතුරඞ්ගබලෙ, ද්‍රිඝතඃ සවිත්‍රහෙ දපි ඉව යුධාවතීර්ණං මගධාධිපතිමභිජගාම. 10. කෘපාක්‍රාන්තහෘවතා මගධෙශ්වරෙ මාලවෙන්‍ද්‍රං ප්‍රක්ෂිණසකල සෛන්‍යං පුනඃ සවරාජ්‍යෙ සථාපයාමාස. 11. ස රාජා විජයප්‍රථුලලමනඃ සවරාජධානිං ප්‍රත්‍යෙත්‍ය සකලාං ධරාං ශාසදපි අනපත්‍යතයා ජාතදෙන්‍යො නාරායණමජස්‍රමාරාධයාමාස. 12. සිංහබාහුපුත්‍රො විජයො යක්ෂාවාසං ලංකාඛ්‍යමාවක්‍රාම. 13. එකදා රාජා මන්ත්‍රිභ්‍යා වක්ත්‍රෙ ප්‍රත්‍රිශන්නන්නම්බුං දෘෂ්ටවා සවපෙනාසීතඃ සවමන්ත්‍රිණං ශුකනාසං සභීං සවප්නවෘත්තාන්තං කථයාමාස. 14. භගවාන් විශ්වපතිරෙකදා ඉන්‍ද්‍රාදිභිර්දෙවවෘන්දෛර්මහර්ෂිභිශ්ච සාර්ධං සංලපන් සවං ලොකමධිතස්ථෙ. 13. සෘෂි සතාං හසනතීවලොක්‍ය කොපාවිෂ්ටඃ කමණ්ඩලුජලෙන උපසපෘශ්‍ය ශප්තුං ප්‍රවක්‍රමෙ. 16. පිත්‍රා නිෂිධ්‍යමානොඃපි දුර්මෙධාඃ දුඃශීලෙ, මත්‍ර්‍යලොකං ගච්ඡ ඉති සරස්වත්‍යං ශශාප. 17. අථාපරෙද්‍යුඃ උදිතෙ භගවති සවිතරි මූනිශාපසම්භ්‍රිග්නා සරස්වති සාවිත්‍රහ්‍යා සහ මහිතලමවතතාර 18. ස ශ්‍රුත්වා අක්‍රුරසිතාං තාමවලොකයතාං පදාතීනාං මුඛාත් ශ්‍රුත්වා තාං කන්‍යාං දිදෘක්ෂුඃ තූෂ්ණීම්භූතෙන වාජිනා තත්ප්‍රදෙශමාගමත්. 19. ධූනීනාං වචනං ශ්‍රුත්වා ස විජෙඃනූනමෙතෙ සත්‍යං කථයන්තීති දධ්‍යෞ.

20. තෙ ශිෂ්‍යා ගුරුඃ්‍යුක්තකලාපයිත්වා 'නුඥං ලබ්ධ්වා පුත්‍රකාණි නීත්වා ප්‍රවවාදුඃ. 21. අථ රාජා තාඃද්ශාසත්‍රවිදුඃ්‍යතාලොක්‍ය සවිවාතාඃුය ප්‍රොවාච. 22. රාජා බ්‍රහ්මණස්‍ය ප්‍රතිඥං ශ්‍රුත්වා ප්‍රහෘෂ්ටොා විසමයාන්විතසතෛසෙම සාදරං තාන් කුමාරාන් සම්ප්‍රිය පරාං නිර්‍ෘතිං ජාජගාම. 23. සංජීවකාභිධාතො වෘෂභො ශම්බූතාකවජමවතීර්ණඃ සන් පඞ්කපූරමාසාද්‍ය කලිතපාදෙ ශුගභංගං විධාය නිෂසාද. 24. ස ආයුඃශෙෂතයා යම්බූතාඃුලිල ම්ශ්‍රෙඃ ශිශිරතරවාතෙරාපාඃුාතිතශරීරඃ කථංචිදප්‍යුත්ථාය යම්බූතාතවම්පුපෙදෙ. 25. ස වාපල්‍යාත් අඞ්ස්ථාවිතසතමහම්පවිශ්‍ය පාණිභ්‍යාං කීලකං සංගෘහ්‍ය උතපාටයිතුමාරෙභෙ.

26. අජා සිංහප්‍රසාදෙන-වනෙ චරති නිර්‍භයම්
රාමම්ෘෂාද්‍ය ලඞ්කායාං-ලෙභෙ රාජ්‍යං විභීෂණඃ

27. ශ්වාවාගතෙත්‍යෙව චණ්ඩාල-ඝෘහං පරිවිතස්‍ය සඃ
චණ්ඩාලඃුනඃ ප්‍රණයාල්-ලුලොඨෛකස්‍ය පාදයොඃ

28. පූජිමාසත්‍ය වතෙ ක්වාපි-වානරා යූථවාරිණඃ
තෙ ශීතෙ ජාතු ඛද්‍යොතං-දෘෂ්ට්වාඝ්නීරිති මෙනිරෙ

29. ප්‍රශොපාතමානමත්‍රෙසතා-හෙජෙ ධර්‍මෙණාතුරඃ
අඝෘඩ්නුරාදදෙ සොඃ'ථ මසකතඃ සුඛමණ්ඩූත්

30. දුදොහ ගාං ස ඔඝ්‍රඃ-ශස්‍යාය මඝවා දිවම්
සමපිනිම්යෙනොභෙෆ දධතුර්භුවනචයම්

31. අථාභ්‍යර්ච්‍ය විධාතාරං-ප්‍රයත්නෙන පුත්‍රකාම්‍යයා
තෙන දම්පතී වශිෂ්ඨස්‍ය-ගුරොඃ ජිග්මතුරාශ්‍රමම්

32. තයොර්ජිඝෘහතුඃ පාදුන්-රාජා රාඥී ච මාඝධී
තෙන ගුරුර්ගුරුපත්නී ච-ප්‍රීත්‍යා ප්‍රතිනනන්දතුඃ

33 මන්ත්‍රිණඃතු වශිෂ්ඨොඃක්තත්‍යා-දෙහං සංරක්ෂ්‍ය භූපතෙඃ
දූතෙඝතාමානයාමාසු-ර්හරතං මාතුලාලයාත්

34. මන්‍යෙදරීං මයසුතාං-පරිණීය දශාතතඃ
තස්‍යාමුතපාදයාමාස-මේඝනාදාභිධං සුතම්

35. පුරෙව ජනයාමාස-ජාම්බවතතං ච පදමජඃ
එවමන්‍යෙ ච ඍබ්බඃ-කපිනජතයන් බහූන්

(ආ) සංස්කෘතයට නගනු. (පමාස කවහැකි තැන් එසේ යොදනු.)

1. මවගේ ඇතයෙහි හෝනා රාම කුමර රාත්‍රියෙහි සද දූක එය ඉල්ලා හැඩුයේ ල. 2. පුතු ඔතසන්නට අන් උපා යක් නො දක්නා මව් තොමෝ ලොකු කැපපතක් ගෙනවුත් පුතු අතැ තබා සඳෙහි පිළිඹිඹුව දූක්වූ ල. 3. සුප්‍රියයා බුදු රදුනව නින්ද කරන විට ඔහු සිසු බ්‍රහ්මදත්තයා බුදුගුණ අති ශයින් වැණී ල. 4. අශොක මහ රජහු දඹදිව රජය කරවන කලැ ඔහු පුත් මහින්ද සථවිර තෙම ලක්දිවට ආයේ ල. 5. ගෙඩි කන පලාකන ප්‍රාණීහු මස්කනාවුනට වඩා ශරීරශක්තියෙන් වැඩෙත්. 6. නින්දව වැටුණු මම සවප්නයෙන් දෙඩුයෙමි ල. 7. අයොධ්‍යායෙන් නික්ම සිතා ලක්ෂ්මණ දෙදෙනා සමග වන යෙහි ඇවිදිනා රාම තෙම සුජිතඛාව විසින් දක්නා ලද්දේ ල. 8. සිනලූ සැපතින් ඉන්ද්‍රපුරයට අපහාස කරන එ පුරය එහි ජනයන්ගේ සැපතින් ප්‍රීතිමත්වූ ශ්‍රීදෙවියගේ සිතහව මෙන් බැබලුණේ ල. 9. කංසයාට බියෙන් වසුදෙවයා බසින් සිය පුත් කෘෂ්ණයා වසුදෙවයාගේ ගෘහයට පමුණුවන ලද්දේ ලු. 10. වැඩෙන ඒ සිඛාඩී කුමාර තෙම සියලු විද්‍යාවන්හි පර තෙරට පැමිණියේ බ්‍රාහ්මී නම් අළුත් ලිපි විශෙෂයක් නිපද වූයේ ලු. 11. පෙර භාරතවර්ෂයෙහි ශ්‍රියෙන් සමෘඩ වූ පණ්ඩිත යන් විසින් සෙවුනා ලද නිතර විපින්හි යාම් රිම් කරන ජනයා ගෙන් ආකිණී වූ විටින්විට ඇසෙන 'එවු, කවු, බොවු' යන වචන වලින් ද හස්‍යාශ්චොදින්ගේ හා වයනු ලබන තූසීයන් ගේ නාද යෙන් ද ඝොෂවත් වූ සාගල නම් මහා නගරයක් වූයේ ලු. 12. ඒ දුෂ්ට කුමාරයා මරණු ලැබේවා යි ඇතැම් ඇමැතියෝ රජුට දූක්වූ ලු. 13. හුදෙකලා වූ මගේ වාසයෙන් කවර ප්‍රයෝජන ද? තවත් ප්‍රාණීහු ඇති වන්නාහු නම් මැනැවැ යි. බ්‍රහ්මයා සිතී ලු 14. රාවණයාගේ නපුරුකම් වලින් පෙළුණු දෙවියෝ බ්‍රහ්මයා වෙත ගොස් එ පවත් සැළකළෝ ලු. 15. ශ්‍රේෂ්ඨ ද රජතෙම ශ්‍රෙෂ්ඨ කුමරෙක් උපතැ යි අසා බියපත් ව රාජපුරුෂයන් ලවා ඔහු සොයවූයේ ලු. 16. එදා කුමාර තෙම උයනට යන්නට නො කැමති වී ල. 17. කළු පින් ඇති බොහෝ ජනයෝ බුදුරජුන් සෙවිනට කැමැත්තාහු නානා දෙශ යෙන් උන්වහන්සේ වෙත ආහ. 18. ගුස් ඔදුනේ සිට වඳුරන් විසින් සොලවනු ලබන ඒ ඝණ්ටාවගේ නාදය අසා තුවර වැස්සෝ ඒ රකුසකුගේ හඬ යැ යි තැති ගත්තෝ වූහ. 19. මෙහුට වැටුප් දෙනු ලැබේවා'යි තෝ කියෙහි ලු! ඒ සැබෑ ද?

(ඒ) චුරාදි ගණික කෂල් ධාතුව ලව්, ලොව්, ලඬ්, විසිලිඬ්, ලිව් යන විඛත්ති කතෘ කර්ම කාරක දෙක්හි වර නගත්‍ර. එහි සන්‍නන්ත, ණිජන්ත, යඬන්ත රූප ද දී ඒ යොදා වාක්‍ය ලියත්‍ර එයින් සැදෙන සන්‍නන්ත නාම ද, කෘදන්ත ද දක්වත්‍ර.

54.

ආඛ්‍යාත විභක්ති.

ලුව්, ලෘව් යන විඛත් දෙක මේ අනාගත ක්‍රියාවක් (මතු කාලයෙහි කැරෙන්නක්) හඟවත්.

විභක්ති ප්‍රත්‍යයයෝ.

ලුට්.

පරස්මෛපදී

ප්‍ර.	තා	තාරෞ	තාරස්
ම.	තාසි	තාසථස්	තාසථ
උ.	තාසමි	තාස්වස්	තාස්මස්

ආත්මනෙපදී

ප්‍ර.	තා	තාරෞ	තාරස්
ම.	තාසෙ	තාසාථෙ	තාඩ්ඩ්‍වෙ
උ.	තාහෙ	තාස්වහෙ	තාස්මහෙ

ලෘට්.

පරස්මෛපදී

ප්‍ර.	ස්‍යති	ස්‍යතස්	ස්‍යන්ති
ම.	ස්‍යසි	ස්‍යථස්	ස්‍යථ
උ.	ස්‍යාමි	ස්‍යාවස්	ස්‍යාමස්

ආත්මනෙපදී

ප්‍ර.	ස්‍යතෙ	ස්‍යෙතෙ	ස්‍යන්තෙ
ම.	ස්‍යසෙ	ස්‍යෙථෙ	ස්‍යඩ්ඩ්‍වෙ
උ.	ස්‍යෙ	ස්‍යාවහෙ	ස්‍යාමහෙ

ලුඞ්, ලෘඞ් දෙ විඛත්හි ම ප්‍රත්‍යයනට මුලින් **ඉෂිඞ්** ධාතුවෙක් නම් **ඉ** කාරයෙක් අමුතුවෙන් පැමිණේ. **වෙඞ්** ධාතුවෙක් නම් කිසි තැනෙක **ඉ** කාරයෙක් පැමිණේ. කිසි තැනෙක නොපැමිණේ.†

ප්‍රත්‍යයයා පර කල්හි ධාඛන්ත සවරයට ද, හල් අකුරින් පූර්‍ව වූ හ්‍රස්ව සවරයට ද ගුණ වේ. ධාඛන්ත වූ **එ, ඒ, ඔ** යන සවර **අ** කාර බවට පැමිණේ.

භූ යනු සෙට් ධාතුවෙකි. ඉන් පරව **තා** ප්‍රත්‍යයය **එක්** ව ඉන් පූර්‍වයෙහි **ඉ** ආගමය වූ කල 'භූ + ඉ + තා' කියා වේ. ධාඛන්තයට ගුණ වූ කල 'භෝ × ඉ + තා' කියා වේ. සවරය පර කල්හි පූර්‍ව වූ ඔ කාරයට අව් ආදේශ වේ 'භව් + ඉ + තා' කියා වේ. සන්ධි ව **භවිතා** යි සිඛ වේ.

ශුච් යනු සෙට් ධාතු යි. ප්‍රත්‍යයය එක් ව ඉකාරාගම ව ධාතු වේ අන්ත හල්කුරින් පූර්‍ව හ්‍රස්වයට ගුණ වූ කල 'ශුච් + ඉ + තා= **ශොච්** + ඉ + තා' කියා වේ. සන්ධි ව **ශොචිතා** කියා සිටී. **ක්ලිද්** යනු වේට් ධාතු යි. එයින් පරවූ ප්‍රත්‍යයයට මුලින් **එක්** පසෙක **ඉ** කාරයෙක් වේ, **එක්** පසෙක නොවේ. 'ක්ලිද් + ඉ + තා, ක්ලිද් + තා' යනු උදාහරණ යි. දෙපසෙහි ම ගුණ වූ කල **ක්ලෙද් + ඉ + තා**, 'ක්ලෙද් + තා' කියා වේ. සන්ධි ව **ක්ලෙදි, තා, ක්ලෙත්තා** කියා වේ.*

---

* ධාතුවට **තෘ** ප්‍රත්‍යය එක්කොට සාදු ගත් **ඍ** කාරාන්ත ශබ්දයේ ප්‍රථමා විභක්තී රූප ම ලුඞ් විභක්තියේ ප්‍රථම පුරුෂ රූප වන්නේ ය. ප්‍රථමා එකවචන රූපයට **අස්** ධාතුවේ මධ්‍යම පුරුෂ උත්තම පුරුෂ රූප එක් කළ විට ලුඞ් විඛතේ මධ්‍යම උත්තම පුරුෂ වන්නේ ය. **භවිතෘ** ශබ්දය ප්‍රථමායෙහි භවිතා, භවිතාරෞ, භවිතාරඃ කියා වේ. එහි **භවිතෘ** යන්නට අස් ධාතුවේ මධ්‍යම උත්තමපුරුෂ එක් කළ විට භවිතෘ + සි=භවිතාසි, භවිතෘ + සථස්=භවිතාසථස්, භවිතෘ + සම්=භවිතාසම් ආදිය වේ.

†**ලෘඞ්** විභක්තිය යනු **ලඞ්** (වර්‍තමාන) විභක්තිරූපයනට ම මූලට **ඍ** එක් වීමෙන් සැදුණෙකි.

මේ ක්‍රමය ශිෂ්‍යයනට පැහැදිලි කැර දුන්නොත් උඛ දුක්වූ විභක්තිරූප ලෙහෙසියෙන් සිතේ තබා ගත හැක්ක.

ගෙ යනු අනිට් ධාතු සි. ප්‍රත්‍යයයෙන් පූර්වයෙහි **ඉ** කාර යෙක් නො වේ. උඛ දුන් උපදෙස් අනුව පදනත **ඒ** කාරයට ආකාරාදෙශ වේ. ගෙ + තා=**ගාතා** යනු වේ.

ලෘට් විභක්තියෙහි ද ප්‍රත්‍යයයන් පර කල්හි ලුට් විභක්තියට කී නීතිය ම ය. උදාහරණ භූ + ඉ + ස්‍යති=භෝ + ඉ + ස්‍යති=භව් + ඉ + ස්‍යති=(27 පිටේ 45 අංක දරන නියමය අනුව ස කාරයට ෂ කාර ව) භව් + ඉ + ෂ්‍යති=**භවිෂ්‍යති.**

ශ්‍රු + ඉ + ස්‍යති=ශොව් + ඉ + ස්‍යති=ශොව් + ඉ + ෂ්‍යති **ශොවිෂ්‍යති.**

ගෙ + ස්‍යති=ගාස්‍යති.

ලුට්.

භූ. u (**සෙව්**) කර්තෘවාචක.

පර.

	එ.	වි.	බ.
ප්‍ර.	භවිතා	භවිතාරෞ	භවිතාරඃ
ම.	භවිතාසි	භවිතාසථඃ	භවිතාසථ
උ.	භවිතාසමි	භවිතාස්වඃ	භවිතාස්මඃ

ආත්ම.

ප්‍ර.	භවිතා	භවිතාරෞ	භවිතාරඃ
ම.	භවිතාසෙ	භවිතාසාථෙ	භවිතාධ්වෙ
උ.	භවිතාහෙ	භවිතාස්වහෙ	භවිතාස්මහෙ

ඵව්. u (**අනිව්**)

පර.

ප්‍ර.	පක්තා	පක්තාරෞ	පක්තාරඃ
ම.	පක්තාසි	පක්තාසථඃ	පක්තාසථ
උ.	පක්තාසමි	පක්තාස්වඃ	පක්තාස්මඃ

ආත්ම.

ප්‍ර.	පක්තා	පක්තාරෞ	පක්තාරඃ
ම.	පක්තාසෙ	පක්තාසාථෙ	පක්තාධ්වෙ
උ.	පක්තාහෙ	පක්තාස්වහෙ	පක්තාස්මහෙ

ලෘට්.

භූ ධා (අසව්)

ප්‍ර.	භවිෂ්‍යති	භවිෂ්‍යතඃ	භවිෂ්‍යන්ති
ම.	භවිෂ්‍යසි	භවිෂ්‍යථඃ	භවිෂ්‍යථ
උ.	භවිෂ්‍යාමි	භවිෂ්‍යාවඃ	භවිෂ්‍යාමඃ

පර.

ප්‍ර.	භවිෂ්‍යතෙ	භවිෂ්‍යෙතෙ	භවිෂ්‍යන්තෙ
ම.	භවිෂ්‍යසෙ	භවිෂ්‍යෙථෙ	භවිෂ්‍යධ්වෙ
උ.	භවිෂ්‍යෙ	භවිෂ්‍යාවහෙ	භවිෂ්‍යාමහෙ

පච්. ධා. (අනිව්)

ප්‍ර.	පක්ෂ්‍යසි	පක්ෂ්‍යතඃ	පක්ෂ්‍යන්ති
ම.	පක්ෂ්‍යසි	පක්ෂ්‍යථඃ	පක්ෂ්‍යථ
උ.	පක්ෂ්‍යාමි	පක්ෂ්‍යාවඃ	පක්ෂ්‍යාමඃ

ආත්ම.

ප්‍ර.	පක්ෂ්‍යතෙ	පක්ෂ්‍යෙතෙ	පක්ෂ්‍යන්තෙ
ම.	පක්ෂ්‍යසෙ	පක්ෂ්‍යෙථෙ	පක්ෂ්‍යධ්වෙ
උ.	පක්ෂ්‍යෙ	පක්ෂ්‍යාවහෙ	පක්ෂ්‍යාමහෙ

ෂෙදිඹ. ලුව් විඛත සෙට පටන් මත්තට වන ක්‍රියාවන් ද **ලෘට්** විඛත අද සිට ඉ මතු සිදු වන ක්‍රියාවන් ද ඛණවයි.

සඃ භවිතා. හේ (අසට හෝ සෙවින් පසු) වන්නේය.
සඃ පක්තා. හේ (සෙව හෝ සෙවින් පසු) පිසන්නේය.
සඃ භවිෂ්‍යති. හේ අද වන්නේය. **පක්ෂ්‍යති**(අද)පිසන්නේ ය.

ඔත ආදී නයින් අර්ථ ගත යුතු.

පච් + තෘ=පක්තෘ, පච් + ස්‍යති=පක්ෂ්‍යති යන් ආදී තන්හි 'ච් + ත,ච් + ස ආදී ව්‍යංජන එක්වීමේදී වන වෙනස 168, 169 පිටු බලා දත යුතු.

ලෘඞ් විභක්තිය.*

පර.

	එ.	ද්වි.	බ.
ප්‍ර.	සෘක්	සෘතාම්	සෘන්
ම.	සෘස්	සෘතම්	සෘත
ඵ.	සෘම්	සෘව	සෘම

ආත්ම.

ප්‍ර.	සෘත	සෘෙතාම්	සෘඅත
ම.	සෘථාස්	සෘෙථාම්	සෘඬ්වම්
ඵ.	සෘෙය	සෘවහි	සෘමහි

ලෘඞ්.

භූ u (සෙව්)

පර.

	එ.	ද්වි.	බ.
ප්‍ර.	අභවිෂ්‍යත්	අභවිෂ්‍යතාම්	අභවිෂ්‍යන්
ම.	අභවිෂ්‍යස්	අභවිෂ්‍යතම්	අභවිෂ්‍යත
ඵ.	අභවිෂ්‍යම්	අභවිෂ්‍යාව	අභවිෂ්‍යාම

ආත්ම.

ප්‍ර.	අභවිෂ්‍යත	අභවිෂ්‍යෙතාම්	අභවිෂ්‍යන්ත
ම.	අභවිෂ්‍යථාස්	අභවිෂ්‍යෙථාම්	අභවිෂ්‍යධ්වම්
ඵ.	අභවිෂ්‍යෙ	අභවිෂ්‍යාවහි	අභවිෂ්‍යාමහි

ලෘඞ් විභක්තිය යෙදෙන හෑටි.

මෙය අතීත කාලයෙහි විය හැකි වූවක් යම් යම් අවශ්‍ය දෑයෙක නැති වීමෙන් නො වූ බව හැඟවීමෙහි යෙදේ. කිසි විටෙක වර්තමාන අනාගත දෙක්හිත් යෙදේ.

---

* මීට පෙර 160 පිටේ දක්වුණු ලඞ් විභක්ති ප්‍රත්‍යයයන්ට මුලින් ස්‍ය යන්න එක් කිරීමෙන් මේ ලෘඞ් විභක්ති ප්‍රත්‍යයයන් සාදා ගත හැකි. බව ශිෂ්‍යයන්ට තේරුම් කර දීමෙන් පහසුවෙන් මේ විභක්ති ප්‍රත්‍යයයන් සිත තබා ගන්නට හැකි වේ.

උදාහරණ:

යදි අහං තත්‍ර නාගච්ඡෙයම් සා පාපමකරිෂ්‍යත්. ඉදින් මම එහි නො විම් නම් ඕ පාපය කරන්නී ය. (මා එහි නොගිවිත්ව ඇ වරද කරණවා. මා ගිවි බැවින් එය කරන්නට ලැබුනේ නැහැ.)

යදි මම ගෘහමාගමිෂ්‍යත් අනෙන මමොපකල්පිතා. මගේ ගෙට ආවහු නම් බොජුන් වලදන්නහුය (=මගේ ගෙට ආවා නම් කෑම කන්නට තුබුණා, නා බැවින් එය වැළැකිණ.)

යදි ඛාණ්ඩම් ආනෙතුම් න කෝ'පි අගමිෂ්‍යත් ස අවශ්‍යම් අමරිෂ්‍යත්. බෙහෙත් ගෙනෙන්නට කිසිවෙක් නො ගියේ නම් හේ ඒකාන්තයෙන් මැරෙන්නේ ය. (බෙහෙත් ගෙනෙන්නට කෙනකු නො ගියා නම් ඔහු මැරෙන්නට ම තුබුණා, එහෙත් බෙහෙත් ගෙනා බැවින් හේ මරණයෙන් බේරුණේය.)

මේ උදාහරණ අනුසාරයෙන් ලෘඞ් විභක්තිය යෙදෙන හැටි සිතට ගත යුතු.

කර්මවාචක ක්‍රියා.

ලුට්, ලෘට්, ලෘඞ් යන මේ විභක්ති ම කර්මවාචක රූපය එහි ආත්මනෙපද රූපය වෙයි භන්, ග්‍රහ්, දෘෂ් යන ධාතූන්ගේත් සවරූන්ත ධාතූන්ගේත් සවරයට වෘඩි වී ද එක් පක්ෂයෙහි පද සිඩ්ධ වේ මේ හැම තැන ම ධාතුවෙන් පර ව ශ් කාරයෙන් වේ. ආකාරාන්තයන ය කෙරෙන් පර ව ඉ කාරයෙක් ද වේ.

නිදර්ශන:

කර්මවාචක ප්‍රථම්පුරුෂ එක වචන

ධාතුව.	ලුට්.	ලෘට්.	ලෘඞ්.
බුධ්	බෝධිතා	බෝධිෂ්‍යතෙ	අබෝධිෂ්‍යත
මන්	මන්තා	මංස්‍යතෙ	අමංස්‍යත
පච්	පක්තා	පක්ෂ්‍යතෙ	අපක්ෂ්‍යත
භන්	භන්තා, ඝාතිතා	භනිෂ්‍යතේ, ඝාතිෂ්‍යතෙ.	අභනිෂ්‍යත; අඝාතිෂ්‍යත.

ග්‍රහ්	ග්‍රහීතා, ග්‍රාහිතා.	ග්‍රහිෂ්‍යතෙ, ග්‍රාහිෂ්‍යතෙ.	අග්‍රහිෂ්‍යත, අග්‍රාහිෂ්‍යත.
දෘශ්	ද්‍රෂ්ටා, දර්ශිතා.	ද්‍රක්ෂ්‍යතෙ, දර්ශිෂ්‍යතෙ.	අද්‍රක්ෂ්‍යත අදර්ශිෂ්‍යත.
දෘ	දෘතා, දෘයිතා.	දෘස්‍යතෙ, දෘයිෂ්‍යතෙ.	අදෘස්‍යත, අදෘයිෂ්‍යත.
නී	නෙතා, නායිතා.	නෙෂ්‍යතෙ, නායිෂ්‍යතෙ.	අනෙෂ්‍යත, අනායිෂ්‍යතෙ.
භූ	භවිතා, භාවිතා.	භවිෂ්‍යතෙ, භාවිෂ්‍යතෙ.	අභවිෂ්‍යත, අභාවිෂ්‍යත.
කෘ	කර්තා, කාරිතා.	කරිෂ්‍යතෙ, කාරිෂ්‍යතෙ.	අකරිෂ්‍යත, අකාරිෂ්‍යත.
වෘ	වරිතා, වරිතා, වාරිතා,	වරිෂ්‍යතෙ, වරිෂ්‍යතෙ, වාරිෂ්‍යතෙ.	අවරිෂ්‍යත, අවරිෂ්‍යත, අවාරිෂ්‍යත.

සෙව් අනිව් වෙව් ධාතු.

ෂ ගන්න මූලට ඇති ප්‍රත්‍යයයන් හැර අන් හැම **ව්‍යංජනාදි ප්‍රත්‍යයයනට** පූර්වයෙහි සම්හර ධාතූන්හට පර ව ඉ ගන්නෙක් එක් වේ. එබඳු ධාතුහු **සෙව්** (ස + ඉව්=ඉකාර සහිත) ධාතු නම් වේ. එසේ ඉගන්නක් නො ගන්නා ධාතු **අනිව්** (න + ඉව්=ඉකාර රහිත) ධාතු නම් වේ. සම්හර විට ඉගන්නක් ගන්නා වූ ද, සම්හරවිට නො ගන්නා වූ ද ධාතු **වෙට්** (වා + ඉව්=ඉකාරයක් ඇති හෝ නැති) ධාතු නම් වේ.

සෙව් ධාතු.

සී, රෑ. ක්‍ෂණූ, ශී, ස්‍තු, ණු, ක්‍ෂු, ශව්, ඩී, ශ්‍රී, වෘ යන ධාතු ද, **ඊෑ** කාරාන්ත, **ඈෘ** කාරාන්ත එකස්වර ධාතු ද, චුරාදි ගණික සියලු ධාතු ද සිංහල නාමධාතු ද **සෙව්** ධාතුහු යි.

අනිව් ධාතු.

උඩ දැක්වුණු ඒක්ස්වර සෙට් ධාතු හැර ඉතිරි සියලු ඒකස්වර ධාතු ද, පහත දැක්වෙන බහුලන්න ධාතු ද **අනිව්** ධාතුහු ය.

හලන්ත අනිට් ධාතු.

ෂක්, පව්, රිව්, වව්, විව්, සිව්, ප්‍රවිඡ්, තෘප්, නිජ්, භජ්, භඤ්ජ්, භුජ්, භ්‍රස්ජ්, මස්ජ්, යජ්, යුජ්, රුජ්, රුඤ්ජ්, විජ්, සඤ්ජ්, සෘජ්, සඛඤ්ජ්, අද්, ඝසුද්, ඛිද්, ඡිද්, තුද්, නුදී, පද්, භිද්, විද්, ශද්, සද්, ස්විද්, සකන්ද්, ක්‍රුධ්, ක්ෂුධ්, බන්ධ්, බුධ්, යුධ්, රුධ්, රාධ්, ව්‍යධ්, ශුධ්, සාධ්, සිධ්, මන්, හන්, ආප්, ක්ෂිප්, තප්, තිප්, තෘප්, දෘප්, ලිප්, ලුප්, වප්, ශප්, සෘප්, සවප්, රහ්, ලහ්, ක්‍රම්, ගම්, තම්, යම්, රම්, ක්‍රැඤ්, දංඤ්, දිඤ්, දෘඤ්, මෘඤ්, රිඤ්, රුඤ්, ලිඤ්, විඤ්, සෘඤ්, කෘෂ්, තුෂ්, තවිෂ්, දුෂ්, ඝිස්, පිස්, පුස්, විස්, ශිෂ්, ෂුෂ්, ශ්ලිෂ්, ඝස්, වස්, දහ්, දිහ්, දුහ්, නහ්, රුහ්, ලිහ්, වහ්.

වෙට් ධාතු.

ධ්‍රු, සු, සඪ, ත්‍රඬ්, අඤ්ජ්, මෘජ්, කැලිද්, සන්ද්, සිධ්, කෘප්, ගුප්, ත්‍රප්, ක්ෂම්, අශ්, කැලිඤ්, අඤ්, තඤ්, නඤ්, ගෘහ්, ගුහ්, තෘහ්, බෘහ්, වෘහ්, තෘප්, දෘප්, නෘත්, දෘහ්, මුහ්, ස්නිහ්, ස්නුහ් †

මොවුන් හැර අන්‍ය ධාතු **සෙට්** යැ යි සාමාන්‍යයෙන් දත යුතු.

† අනිට් ධාතූන්ගේ දුක්වෙන පහත සඳහන් වන ශ්ලෝක කටපාඩම් කිරීමෙන් ධරා ගැනීම වඩා පහසු යි.

සෙට්.

උදෘදන්තෛර්යාතිරුක්ෂණු-ශියනුනුඤ්ජ්විඩ්ඩ්‍රිභිඃ
වෘඩ්ව්‍යඤ්භ්‍යාං ච විනෙකාවෝ 'ජනෙතෂු නිහතාඃ සමෘතාඃ

අනිට්.

ෂකෘ පව් ම්‍රුවි රිව් වව් විවි සිව් ප්‍රවඡ තෘප් නිජිර් භජඃ
භංජ් භුජ් භ්‍රස්ජ් මස්ජි යජ් යුජ් රුජ් රංජ් විජිර් සවංජි
සංජ් සෘජඃ

අද් ඝසුද් ඛිද් ඡිද්, තුදි නුදඃ පද්ය භිද් විද්‍යතිර් විනද්
ශද් සදි ස්විද්‍යතිඃ සකන්දි-භදි ක්‍රුධි ක්ෂුධි,බුධ්‍යතී
බන්ධිර් යුධි රුධි රාධි-ව්‍යධි ශුධඃ සාධි සිධ්‍යතී
මන්‍ය හන්නාප් ක්ෂිප් ම්‍රුපි තප්-තිප සතෘප්‍යති දෘප්‍යතී

ලිප් ලෘප වප් ශප් සවප් සෘපි යඡ්-රඡ් ලඡ් ගම් නම් යමා රම්:
ක්‍රැශිර් දංශි දිශී දෘශ් මෘශ්-රිශ් රුශ් ලිශ් විශ් සපෘශ: කෘශි:
නිෂ් තුෂ් මිෂ් දුෂ් ප්‍රුෂ්‍ය පිෂ් විෂ්-ශිෂ් ශුෂ් කුලිෂ්‍යතයො ඝසි:
වසතිර් දහ් දිහි දුහො-නහ් මිහ් රුහ් ලිහ් වහිස් තථා
අනුදාත්තා හලනෙතෂු ධාතවො හ්‍යධිකං ශතම්

වෙව්.

සූතෙ ධ්‍රුඞ් සවර තිවිශව-මෘජාඝඤ: සෘඡ කුලිද්‍යතී
පෙධතිසත්‍රප් ගොප කෘපෙෘ-තෘප් දුපෙය්‍ය ඝෂ්ඨනඝ්‍යතී
ඝීශනා ශතුතෙ ගාහගුහෙෂු-දුඝ්‍යමූහ්‍ය ඝනිඝ සත්‍රුහ:
අක්ෂ්ණොතිඝතාඝෂතිස්තඝෂ-තෘඝතිඊහතිඛිහ:

අභ්‍යාසය 91.

සිංහලයට නඟනු.

1. අහෙම්භ්‍යාම්මාවාස්‍යායාමහං යඤ්‍යාමි යඥම්. 2. ඉතඃ ප්‍රභෘති දෙවදෙවං සෙවඤ්චදෘතාරං සමර, අවිරෙණෙව පුනඃ සවධාම ප්‍රඛිපතඤ්‍යසෙ. 3. යදෙව සථානං තුභ්‍යං රොචතෙ තත්තෙව වතඤ්‍යාමි. 4. භයාකුලං තමප්‍රාප්‍ය සවබුඩ්ප්‍රභාවෙණ නිභීයං කෘත්වා වශීකෘත්‍ය ච නිජාං ඝාවිත්‍ය පදවීං සමාඝාදසිඤ්‍යාමි. 5. යදි ඝ ඝාථමප්‍යතනයොඃ සංඝවෙ පතිඤ්‍යති තං නූනං මෘත්‍යු මවාප්ඤ්‍යති. 6. අහං තව කෘතෙ ප්‍රභුතං මද්‍යමානෙඤ්‍යාමි. 7. නාහං මන්‍යෙ තෙ ඉමං කට්ටකභොජනං සවදිඤ්‍යතනීති. 8. දමයන්‍ති ආහ යද්‍යහං තලමද්‍ය න දුඤ්‍යාමි අහමාත්මා නමඝොෂ පරිත්‍යඤ්‍යාමි මරිඤ්‍යාමී'ති. 9. ආවාම්දුනී මසමාකමඛවාවාරොඝඤ්‍යාවඃ,නූණීං ධාවිඤ්‍යාවඛව. 10. අද්‍ය ගුරු ශිෂ්‍යෙණ රථෙන නඟරෙ විවරිඤ්‍යතඃ. 11. අඤ්‍යාං භුවි භවිඤ්‍යති කාලෙ මෛත්‍රෙයො නාම සම්‍යක්සම්බුඩ්ධො භවිඤ්‍යති. 12. තසෙම යාවතෙ දුර්විධාය පුරුඝාය මත්පුත්‍රඃ කිංවිදහාරං දඤ්‍යති. 13. අඤ්‍ය ධනං පුත්‍රවතීමෙවාඤ්‍ය භාඝීං ප්‍රාප්ඤ්‍යති. 14. ප්‍රවාවො මුතෙරනුඝාඝනං නාඛිසථාඤ්‍යන් තෙ දුඃඛං ප්‍රාප්ඤ්‍යන්. 15. සුවඃඝපිඝශවදඛභවිඤ්‍යත් තදු සුභිඤ්‍යමභවිඤ්‍යත්. 16. යදි මම ගෘහ මාගඛ්ඡිඤ්‍යා මධුරාන්නෙනාභොඤ්‍යථාඃ. 17. ඝවෙ ඛමිදං දුශෙඛඨිතං නාඝාඤ්‍යඃ, නූනං ඛං යාවජ්ජීවමශොචිඤ්‍යඃ. 18. යදි මාමෙවං දුඃඛිතං වනං නෙතුං නෙවඡසි, මෘත්‍යුකාරණාවිඝං ඛාදිඤ්‍යාමි. 19. අහං සමග්‍රාන් ඛාතීරාඝ්ත්‍රාන් හත්වා කුරූණාං රාජ්‍යමවජෙතාඝම්. 20. ඛාතීරාඝ්ත්‍රා රණෙ දංඝිතං ඝිමසෙනං දෘඪ්වා යුඛඤ්චානුතපතා.

පහත සඳහන් පද්‍ය ඉංග්‍රීසියට හරවන්න. සිංහලයටද නගන්න.

1. චතුදශී සමා නිත්‍යා-පුනරේෂ්‍යාම්‍යහම් පුරීම්
ඉතඤ්ක්ත්‍වා පාදුකෙ දත්වා-තං රාමඃ ප්‍රත්‍යයාපයත්

2. මා විෂාදං කෘථා දෙවි-රාඝවෝ රාවණං රණ
හත්වා ත්වාං තෙෂ්‍යතිත්‍යේතාමාශ්වාසය ස විනීයෙෂ

3. රථං සූත සමාදෘෙ ත්වං-ක්ෂිප්‍රං කුරු ජයෛෂිණඃ
රාමං සලක්ෂ්මණං හනතුං-නීගීමිෂ්‍යාම්‍යහං ගෘහාත්

4. ධෘතාපුෙධා යාවදහං-තාවදන්‍යෙෂාං කිමායුධෙඃ
යවා න සිඛි මසෙත්‍රණ-මම තත්කෙත සෙතස්‍යති

5. පත්‍රං මූලං ඵලං යත්ත්වමල්පං වා යදි වා බහු
දෂ්‍යසි සවයමාදය-තන්මෙ'මෘතරසොපමම්

6. යද්'භිමනයුඃ පරවිරෂ්‍යාති ශරෛඃ පරාන් මෙඝ ඉවාහි වර්ෂන්
විභාහිතා කෘෂණසමඃ කෘතාසත්‍ර සනාදුසතප්‍රස්‍යත්‍ය
කෘතාතමා මෘදුඃ

7. පාණ්ඩවක්‍රොධදුවෙන-කුරවඃ සජී එව හි
ධක්ෂ්‍යතෙන ශිශිරාපායෙ-වනානීව හුතාසනෙඃ

8. යදු හි බහවො වෘධා-නීතිමන්තා බහුශ්‍රැතාඃ
පරිප්‍රශ්‍නයනති කාකුත්සථං-වක්ෂ්‍යාමිහ කථං තදු

9. විෂෙණ සංවෘතෙගීත්‍රෙ යීවත් ත්වාං න විමොක්ෂ්‍යති
තාවත් ත්වයි මහාරාජ දුඃඛං වෙ ස නිවත්ස්‍යති

10. තමෙව ශරණං ගවජ්-සජීභාවෙන භාරත
තත්ප්‍රසාදත් පරාං ශාන්තිං-සථානං ප්‍රාප්ස්‍යසි ශාසවතම්

11. අහං හි ව්‍යමදෙෂ්‍යෙව පිතා බහු තවාග්‍රතඃ
පශ්‍යතසෙක මරිෂ්‍යාම් රාමොඅදුෂ්ටිෂිවය්‍යත

12. භයාදුණාදුපරතං මංස්‍යතෙන ත්වාං මහාරථාඃ
තෙෂාං ව ත්වං බහුමතො භූත්වා යාස්‍යසි ලාඝවම්

13. රාජන්විෂනිමිත්තතා ව-න තෙ පිඩා භවිෂ්‍යති
සංග්‍රාමෙෂු ච රාජෙන්ද්‍ර-ශ්‍රෙඨජයමවාප්ස්‍යසි

14. මරිෂ්‍යාමි විජෙෂ්‍යෙ වා-හතාශේච් තනයා මම
ඝතිෂ්‍යාමි රිපූං ස්තෘණීං-න ජීවිෂ්‍යාමි දුඃඛිතඃ

15 අකරිෂ්‍යදසෞ පාපමනිනිෂ්කරුණෙෂ්ව සා
නාඝවිෂ්‍යමඝං තත්‍ර-යදි තත්පරිපන්ථිනී

16. මධ්‍යකරමදිරාක්ෂ්‍යාඃ ශංස තස්‍යාඃ ප්‍රවෘත්තිං
වරතනුරථවා,සෞ නෛවදෘශ්‍යා භවියා මෙ
යදි සුරභිමවාපස්‍යස්තන්මුඛොවිශ්‍වාඝඝඞ්ඛං
තවූ රතිරභවිෂ්‍යත් පුණඩරිකෙ කිමසම්න්

(ඉ) 121 පිටේ සඳහන් 1, 3, 4, 7, 11, 12, 14, 16, 24 යන අංක දරන වාක්‍ය වල ආඛ්‍යාත පද අනාගත ක්‍රියා බවට පෙරළා ඒ වාක්‍ය සංස්කෘතයට නඟන්න.

55

ලුඩ්.

කොටැ නිම වූ ක්‍රියාවෙක් ලුඩ් විභක්තින් දක්වේ. මෙය සත් ක්‍රමයෙකින් සෑදේ. ඒ හැම තැන ම ධාතුවට මුලින් අ කාරයෙක් එක් වේ.

පළමු ක්‍රමය.

මේ ක්‍රමයෙන් සෑදෙනුවෝ පරස්මෛ පදයෙහි ම වර තැබෙති.

විභක්ති ප්‍රත්‍යයයෝ.

	එ.	බ.	ඛ.
ප්‍ර.	ත්	තාම්	උඃ
ම.	ඃ	තම්	ත
උ.	අම්	ව	ම

දෘ දීමෙහි

	එ.	බ.	ඛ.
	අදෘත්	අදෘතාම්	අදුඃ
	අදෘඃ	අදෘතම්	අදෘත
	අදෘම්	අදෘව	අදෘම

ඉ	(ගා)	ගෘමෙහි,	(අගාත්)
සථා		සිටීමෙහි	(අසථාත්)
දෙ	(දෘ)	රැකීමෙහි	(අදෘත්)
දෙ	(දෑ)	කැපීමෙහි	(අදෘත්)
පා		පීමෙහි	(අපාත්)
භූ		වීමෙහි	(අභූත්)

මොවුන් දෘ ධාතුව සේ වර නගනු: ඝ්‍රා, ධෙ (ධා) (පීමෙහි) ජෝ (ජා) (කැපීමෙහි), ශෛ (ශා) (මුවහත් තැබීමෙහි), ශ්‍යා (ඝා) (වැනසීමෙහි) යන ධාතූහු ද සමඟර විට දෘ ධාතුව සේ වර නැගෙත්.

දෙවෙනි ක්‍රමය.

මෙහි වැනි දෙනෙක් ම ධාතූහු පරස්මෛ පදයෙහි වර නැගෙත්. ආත්මනේ පදයෙහි වර නැගෙන්නේ සුවල්පයකි. මෙහි ප්‍රත්‍යයයෝ යට 16, 36 පාඩම්හි ලඬ් විධිතට දැක්වුණෝ ම ය. මෙහි ප්‍රත්‍යයයට මුලින් අ කාරයෙක් එක් වේ.

සිච්.

පරස්.

	එ.	ද්වි.	බ.
ප්‍ර.	අසිචත්	අසිචතාම්	අසිචන්
ම.	අසිචඃ	අසිචතම්	අසිචත
උ.	අසිචම්	අසිචාව	අසිචාම

ආත්ම.

	එ.	ද්වි.	බ.
ප්‍ර.	අසිචත	අසිචතාම්	අසිචන්ත
ම.	අසිචථාඃ	අසිඞ්ඛ්‍යාථාම්	අසිචධ්වම්
උ.	අසිචෙ	අසිචාවහි	අසිචාමහි

භම්, මව් (වොව්), **බ්‍යා** (බ්ඛ්) **පත්** (පප්ත්), **දෘශ්** (දර්ශ්), **ඡිද්** යන මොවුන් **සිච්** ධාතුව සේ වර නගනු.

තෙවෙනි ක්‍රමය.

චුරාදි ගණීඝ ධාතූහු ද, ණිජන්තයෝ ද, ඝ්‍රි, ධෑ, ප්‍සා යන ධාතූහු ද තෙවෙනි ක්‍රමයෙන් වර තැගෙත්.

පදසිද්ධි ක්‍රමය මෙසේ යි:-

a. අංගයන්ගේ අග භාගයට ලොප් ව ධාතු ප්‍රත්‍යයයන් අතරට අ කාරයෙක් පැමිණේ. b ධාතුවේ අන්‍ත්‍ය හල්අකුරට මුලින් ආගන්න ප්‍රසව වේ. c. ඒ හෝ මේ කාරය ඉ කාර බවට ද, ඔ හෝ, ඖ කාරය උකාර බවට ද පෙරළේ. d. මුල් ව්‍යංජනයට පිම්බ වේ. e. අභ්‍යාස භාගයේ අගන්න ඉකාර බවට පැමිණේ. නොබැඳි ව්‍යංජනයට පූර්‍ව ඉකාරය හෝ උකාරය දීසී වේ. g මුලට අකාරයෙක් වේ.

පිළිමෙළින් උදහරණ.

අංගය	තාඩය.	භාවය.	වෙතය.
a	තාඩි	භාවි	වෙත්
b	තාඩිඅ + ත්	භාවිඅ + ත්	වෙත්අ + ත්
c.	තාඩිඅත්	භාවිඅත්	විත්අත්
d.	තතාඩිඅත්	බහවිඅත්	විවිත්අත්
e.	තීතඩිඅත්	බිහවිඅත්	විවිෂ්අත්
f.	තීතඩිඅත්	බිහවිඅත්	විවිත්අත්
g.	අතීතඩත්	අබිහවත්	අවිවිතත්

අංගය	චොරය.	ත්‍රාසය
a.	චොර්	ත්‍රාස්
b.	චොර්අ + ත්	ත්‍රාස්අ + ත්
c.	චුර්අත්	ත්‍රස්අත්
d.	චුචුර්අත්	තත්‍රස්අත්
e.	චුචුර්අත්	තීත්‍රස්අත්
f.	චූචුර්අත්	තීත්‍රස්අත්
g.	අචුචුරත්	අතීත්‍රසත්

සමහර ධාතූන්ගේ අභ්‍යාස අකාරය ඉකාර බවට. නො පෙරළේ. **කථය** යනු අංග යි. ඉන් නිපන් ලුඞ්රූපය අචකථත් යනු යි. මෙහි චයන්හේ අ යන්න ඉ බවට පෙරළී නැත. ධාතුත් ණිජන්ත රූපත් ඔවුන්ගේ ලුඞ් ප්‍රථම පුරුෂ එකවචනත් කිහිපයෙක් දක්වෙත්.

ධාතුව	ලුඩ්. ප්‍ර. එ.
ඣම්	අවඣමත්, අවීඣමත්
ඛෘ	අදිඛරත්
කෘත්	අවිකීර්තත්, අවිකෘතත්
පිඩ්	අපිපිඩත්, අපීපිඩත්
සපෘශ	අපසපෘෂත්
ගණ්	අජගණත්, අජීගණත්
ණිජන්ත	
බොධය	අබූබුධත්
කාරය	අවීකරත්
ප්‍රෙපය	අජීග්‍රිපත්
ආවය	ආවීවත්
ආසය	ආසීසත්

සතරවන ක්‍රමය.

වැඩි කොටසක් අනිට් ධාතු මේ ක්‍රමයෙන් වර නැගේ. මෙහි යට කී ත් ආදි ප්‍රත්‍යයයන් ගේ පඨස්මෛපද ප්‍රථම පුරුෂ මධ්‍යම පුරුෂ ඒකවචනවලට මූලින් ඕ කාරයෙක් ද, අන් හැම තැන ඍ කාරයෙක් ද එක් වේ. එවිට ප්‍රත්‍යයයන් සිටින සැටි මෙසේ යි:

පරස්.

	එ.	වි.	බ.
ප්‍ර.	සිත්	(සතාම්)	සුඃ
ම.	සීඃ	(සතම්)	සත
උ.	සම්	සව	සම

ආත්ම.

	එ.	වි.	බ.
ප්‍ර.	(සත)	සාතාම්	සත
ම.	(සථාඃ)	සාථාම්	ධ්වම්,ස්වම්
උ.	සි	සවහි	සමහි

මෙහි වරහන් තුළ වූ ප්‍රත්‍යයයන් ගේ ඍ කාරය හ්‍රස්වයට පර තන්හි ද, අනුනාසිකාක්ෂරත් ඊ කාරත් හැර අන් ව්‍යංජනයකට පර තන්හි ද ලොපට පැමිණේ.

කෘ u.

පර.

	එ.	වි.	බ.
ප්‍ර.	අකාර්ෂීත්	අකාර්ෂ්ටාම්	අකාර්ෂුඃ
ම.	අකාර්ෂීඃ	අකාර්ෂ්ටම්	අකාර්ෂ්ට
උ.	අකාර්ෂම්	අකාර්ෂ්ව	අකාර්ෂ්ම

ආත්ම.

	එ.	වි.	බ.
ප්‍ර.	අකෘත	අකෘෂාතාම්	අකෘෂත
ම.	අකෘථාඃ	අකෘෂාථාම්	අකෘඩ්වම්
උ.	අකෘෂි	අකෘෂ්වහි	අකෘෂ්මහි

මෙසේ වර නැඟෙන ධාතු කිහිපයෙක් සහ ඔවුන් ගේ ප්‍රථම පුරුෂ එකවචන රූප.

ධාතුව p.	ලුඩ්. ප්‍ර. එ.	ධාතුව a.	ලුඩ්. ප්‍ර. එ.
ෂ්ඨිවි	අශ්ලෞෂීත්	ඥ	අඥැසත
නී	අනෛෂීත්	මන්	අමංසත
මස්ජ්	අමාර්ක්ෂීත්	රම්	අරංසත
		රභ්	අරබ්ධ
බන්ධ්	අභාන්ත්සීත්	ආ-ගන්	ආහත
දෘශ්	අධාක්ෂීත්	සං-ගම්	සමගත, සඞ්ගංසත
		උප-යම්	උපායත, උපායංසත
දෘශ්	අද්‍රාක්ෂීත්	දෘ	අදිත
කෘෂ්	අකාර්ෂීත්, අක්‍රාක්ෂීත්	ප්‍ර-සථා	ප්‍රාසථිත
වස්	අවාත්සීත්	අධි-ඉ	අධ්‍යෛෂ්ට,අධ්‍යගීෂ්ට
ප්‍රච්ඡ්	අප්‍රාක්ෂීත්		

හන්(වධ්)අවධීත්

ධාතුව u.	p.	a.
යජ්	අයාක්ෂීත්	අයෂ්ට
වහ්	අවාක්ෂීත්	අවොඪ
නහ්	අනාත්සීත්	අනද්ධ

පඤ්චන ක්‍රමය.

අන් ක්‍රම්වලින් කෝ වර නැගෙන ධාතූහු – විශෙෂයෙන් **සේව්** ධාතූහු මේ සිව්වන ක්‍රමයට වර නැගෙති. සතර වන ක්‍රමයෙහි දැක්වුණු ප්‍රත්‍යයනට මුලින් **ණු** යන්නෙක් එක් වේ. එහි ද පරස්මෙපද ප්‍රථම පුරුෂ මධ්‍යම පුරුෂ ඒක වචන වල, **ණ්** කාරයට ලොප් වේ. එවිට ප්‍රත්‍යයයන් ගිවින සැටි:

පරස්.

	එ.	ව්.	බ.
ප්‍ර.	ර්ත්	ඉෂ්වෝම්	ඉෂ්මඃ
ම.	ර්ඃ	ඉෂ්වම්	ඉෂ්ට
උ.	ඉෂ්මම්	ඉෂ්ව	ඉෂ්ම

ආත්ම.

	එ.	ව්.	බ.
ප්‍ර.	ඉෂ්ට	ඉෂාතාම්	ඉෂත
ම.	ඉෂ්ඨාඃ	අෂාථාම්	ඉධ්වම්
උ.	ඉෂි	ඉෂ්වහි	ඉෂ්මහි

a. මෙහි ධාඑන්නන හලින් පූර්ව සවරයට ගුණ වේ. උදා. අ–විද් + ර්ත්=අවෙදිත්; අ–මුද් + ඉෂ්ට=අමොදිෂ්ට.

b. සවරාන්ත ධාතූන් ගේ අන්තයට ද, ර් ල් කාරාන්ත ධාතූන්ගේ හලට පූර්ව අකාරයට ද වද්, ව්‍රශ්ච් යන ධාතූන් ගේ අකාරයට ද පරස්මෙපද ප්‍රත්‍යයයන් පර කල්හි වෘඩි වේ. උදා. අ–ලු + ර්ත්=අලවිත්; අ–ත්සර් + ර්ත්=අත්සාරිත්; අ–දල් + ර්ත්=අදාලිත්.

c. ආත්මනෙපද ප්‍රත්‍යයයා පර තන්හි ධාඑන්න සවරයට ද අන්‍ය අසංයුක්ත හලට පූර්ව හ්‍රස්වයට ද ගුණ වේ. අ–ලු + ඉෂ්ට= අලවිෂ්ට. ආත්මනෙ පද ප්‍රත්‍යයයා පර වූ කල්හි

d. **ඍ** කාරාන්ත ධාතූන් ගෙන් පළ වූ **ඉ** යන්න සමහර තැන දීර්ඝ ද වේ. උදා. අ–වෘ + ඉෂ්ට=අවරිෂ්ට, අවරීෂ්ට

විද්. p.

	එ.	බ.	ඛ.
ප්‍ර.	අවෙදීත්	අවෙදිෂ්‍යාම්	අවෙදිෂුඃ
ම.	අවෙදීඃ	අවෙදිෂ්‍යතම්	අවෙදිෂ්‍යත
උ.	අවෙදිෂම්	අවෙදිෂ්‍යව	අවෙදිෂ්‍යම

මුද්. a.

	එ.	බ.	ඛ.
ප්‍ර.	අමොදිෂ්ට	අමොදිෂාතාම්	අමොදිෂත
ම	අමොදිෂ්ඨාඃ	අමොදිෂාථාම්	අමොදිඩ්වම්
උ.	අමොදිෂි	අමොදිෂ්වහි	අමොදිෂ්මහි

පස්මන ක්‍රමයට වර නැගෙන ධාතු කිහිපයෙක් හා ඔවුන් ගේ ප්‍රථම පුරුෂෛකවචන:

ධාතුව.	ප්‍ර. එ.
ශව්. p.	අශවීයීත්
සඩ්. p.	අසඩාවීත්
වෘ. a.	අවාරීත්, අවරීෂ්ට, අවරීෂ්ට
ග්‍රහ්. u.	අග්‍රහීත්, අග්‍රහීෂ්ට
තෘප්. p.	අතර්පීත්
පඨ් p.	අපඨීත්, අපාඨීත්
ශ්‍වස් p.	අශ්වසීත්
තන් u	අතනීත්, අතානීත්, අතනීෂ්ව, අතත

සවන ක්‍රමය.

මේ ක්‍රමයට වර නැඟෙනුයේ පරස්මෛපදයෙහි ඨ. සව පස්වන ක්‍රමයෙහි දැක්වුණු පරස්මෛපද ප්‍රත්‍යයනට මුලින් ස් කාරය එක් ව සිත්, සිෂ්ටාම් ආදින් මෙහි ප්‍රත්‍යයයෝ වෙති.

පළමු දෙවෙනි ක්‍රම වලින් නො වර නැගෙන ආකාරාන්ත ධාතූහු ද 'යම්, රම්, නම්' යන ධාතූහු ද මේ ක්‍රමයෙන් වර නැගෙත්.

යා.

	එ.	බ.	ඛ.
ප්‍ර.	අයාසීත්	අයාසිෂ්ටාම්	අයාසිෂුඃ
ම.	අයාසීඃ	අයාසිෂ්ටම්	අයාසිෂ්ට
උ.	අයාසිෂම්	අයාසිෂ්ව	අයාසිෂ්ම

මෙසේ වර නැඟෙන ධාතු.

ධාතුව.	ප්‍ර. එ.
ඥ	අඥාසීත්
හෙ (හා)	අහාසීත්
වි + රම්	ව්‍යරංසීත්
නම්	අනංසීත්
ප්‍ර + නම්	ප්‍රාණංසීත්
ග්ලෙ	අග්ලාසීත්

සන්වන ක්‍රමය.

සය දෙවෙනි ක්‍රමයේ දැක්වුණු ප්‍රත්‍යයයනට මුලින් ස් කාරයෙක් එක් වේ. **සන්, සතාම්, සන්** ආදී වශයෙන් ප්‍රත්‍යයයෝ වෙති. අන්‍ය හලට මුලින් **ඉ, ඒ,** හෝ **ඍ** කාර ඇති ශ් ෂ් හ් කාරාන්ත අනිට් ධාතූහු මේ ක්‍රමයෙන් වර නැඟෙත්.

දිශ්. u

පරස්.

	එ.	ද්වි.	බ.
ප්‍ර	අදික්ෂත්	අදික්ෂතාම්	අදික්ෂන්
ම.	අදික්ෂඃ	අදික්ෂතම්	අදික්ෂත
උ.	අදික්ෂම්	අදික්ෂාව	අදික්ෂාම

ආත්ම.

	එ.	ද්වි.	බ.
ප්‍ර.	අදික්ෂත	අදික්ෂාතාම්	අදික්ෂන්ත
ම.	අදික්ෂථාඃ	අදික්ෂාථාම්	අදික්ෂධ්වම්
උ.	අදික්ෂි	අදික්ෂාවහි	අදික්ෂාමහි

මෙසේ වර නැඟෙන ධාතූ:

ධාතුව.	ප්‍ර. එ.
දුහ් u.	අධුක්ෂත්, අධුක්ෂත, අදුග්ධ
ගුහ් u.	අගුක්ෂත්, අගුක්ෂත, අගූඪ
ලිහ් u.	අලික්ෂත්, අලික්ෂත, අලීඪ
ච්ඡ් p.	අවිච්ඡත්
රුහ් p.	අරුක්ෂත්

කර්මවාචක ක්‍රියා.

කර්ම වාචක ක්‍රියා සෑදීමේ දී එක් වෙනුයේ සතරවන පස්වන සත්වන ක්‍රමවල දෙක්වුණු ආත්මනෙපද ප්‍රත්‍යයයන් පමණෙකි. ඔවුන්ගේ ප්‍රථම පුරුෂ එකවචන ප්‍රත්‍යයය ඉ යැයි සිතා තබා ගත යුතු. එ ඉ ප්‍රත්‍යය පර කල්හි ධාත්වන්ත සවරයට වෘද්ධි ද හලින් පූර්ව හ්‍රස්වයට ගුණ ද, හලින් පූර්ව අයන්තට දීර්ඝ ඛව ද වේ.

සතරවන ක්‍රමයෙහි ප්‍රත්‍යයයෝ

	එ.	බ.	ඛ.
ප්‍ර.	ඉ	ආතාම්	සත
ම.	ථාඃ	ආථාම්	ධවම්
උ	සි	සවහි	සමහි

සත්වන ක්‍රමයෙහි ප්‍රත්‍යයයෝ

	එ.	බ.	ඛ.
ප්‍ර.	ඉ	සාතාම්	සන්ත
ම.	සථාඃ	සාථාම්	සධ්වම්
උ.	සි	සාවහි	සාමහි

වර නෑගීම.

සතරවන ක්‍රමයට අයත් කෘ ධාතුව.

	එ.	බ.	ඛ.
